**unit 06**

වාගීෂ්වර

# ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ තෝරාගත් සංකල්ප

- අයිතිවාසිකම් හා යුතුකම්
- නිදහස හා සමානාත්මතාවය
- නීතිය හා නීතයේ ආධිපත්‍යය
- ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලනය

sureka wageeshwara

# අ යිතිවාසිකම් හා යුතුකම්

# අයිතිවාසිකම් හා යුතුකම්

# අයිතිවාසිකම්

- <u>අයිතිවාසිකම් හැඳින්වීම.</u>

සමාජ ජීවියෙකු වන මිනිසාට පෞද්ගලික ජීවිතය පරිපූර්ණ කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන්නා වූ කොන්දේසි අයිතිවාසිකම් ලෙස සරලව හැඳින්විය හැකිය. තවදුරටත්, පුද්ගලයාගේ පෞරුෂ වර්ධනය සඳහා අත්‍යවශ්‍ය මූලධර්ම පද්ධතිය අයිතිවාසිකම් ලෙස නිර්වචනය කළ හැකිය. අයිතිවාසිකම් හා යුතුකම් අතර අති සමීප බද්ධතාවයක් පවතී. යුතුකම් වලින් තොර අයිතිවාසිකම් සෙවනැලි රහිත මිනිසුන් වැනිය, යුතුකම් හා අයිතිවාසිකම් එකම කාසියක දෙපැත්ත බඳුය. අයිතිවාසිකම් හා යුතුකම් ගසට පොත්ත මෙන් බැඳී පවතී.

- ★ පිරිපුන් සමාජ ජීවිතයක් ගත කිරීම සඳහා මිනිසුන්ට අත්‍යවශ්‍යයෙන්ම තිබිය යුතුයැයි පිළිගැනෙන සමාජ හිමිකම් අයිතිවාසිකම් ලෙස හඳුන්වාදිය හැකිය.
- ★ පුද්ගලයෙකු මනුෂ්‍යයෙකු වශයෙන් ඉපදීම නිසා ගෞරවාන්විතව සහ සුරක්ෂිතව ජීවත්වීම සඳහා ලැබෙන හිමිකම් විශේෂය ලෙස ද අයිතිවාසිකම් හැඳින්විය හැකිය.

- <u>අයිතිවාසිකම් සම්බන්ධ විවිධ චින්තකයන්ගේ නිර්වචන.</u>

"යහපත් සමාජ ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය අන්‍යයන් අපෙනුත් අප අන්‍යයන්ගෙනුත් අපේක්ෂා කරන්නා වූ සමාජ ඉඩ ප්‍රස්ථාව අයිතිවාසිකම් වේ"

-හොබ් හවුස්-

"මිනිසාට ස්වකීය සමාජ ජීවිතය යහපත් ආකාරයෙන් පවත්වා ගෙන යාමට අවශ්‍ය වන කොන්දේසි මාලාව අයිතිවාසිකම් වේ."

-ලැස්කි-

"මිනිසාට සෑම දෙයක් සම්බන්ධයෙන්ම ඇති අයිතිය අයිතිවාසිකම් වේ."

-තෝමස් හොබ්ස්-

"පුද්ගලයන්ගේ පෞරුෂය වර්ධනය කර ගැනීමට අත්‍යවශ්‍ය රටාව අයිතිවාසිකම් වේ."

-විශ්වා වර්ණපාල-

"යහපත් සමාජ ජීවිතයක් ගත කිරීමේ දී, ඉටු කළ යුතු සමාජ කාර්යයන් සපුරාලීම සඳහා පුරවැසියන් තුළින් ඉදිරිපත් වන සාධාරණ ඉල්ලීම් අයිතිවාසිකම් වේ."

-වයිල්ඩ්-

- <u>අයිතිවාසිකම් සම්බන්ධයෙන් වැදගත් සංධිස්ථාන.</u>

අයිතිවාසිකම් යනු විප්ලවීය ක්‍රියාමාර්ග මගින් හොඳ ජීවිත පරිත්‍යාගයෙන් දිනාගන්නා ලද ජයග්‍රහණයන් ය. ග්‍රීක යුගයේ දී **වහල් නායක ස්පාටකස්** දිවි දුන්නේත් අයිතිවාසිකම් දිනාගැනීම වෙනුවෙනි. ලෝකයට **පැය 8 වැඩ මුරය** ලැබුනේ **ඇමරිකානුවන් චිකාගෝ නුවරදී** 1886 මැයි 01 වන දින ජීවිත පරිත්‍යාගයෙන් කළ නිදහස් සටන නිසාය.අයිතිවාසිකම් සම්බන්ධ සංවාදය පරිපූර්ණත්වයට පත්වීම සඳහා අයිතිවාසිකම් සම්බන්ධයෙන් ඓතිහාසික වශයෙන් වැදගත් සංධිස්ථානයන් ස්මරණයකිරීම වැදගත් වේ.

| | | |
|---|---|---|
| 1688 | - | ඉංග්‍රීසි විප්ලවය |
| 1689 | - | අයිතිවාසිකම් පනත |
| 1776 | - | ඇමරිකානු නිදහස් අරගලය |
| 1677 | - | ඇමරිකානු නිදහස් ප්‍රඥප්තිය<br>**(සියළුම මිනිසුන්ට ඔවුන්ගේ නිර්මාපකයා විසින් අහිමි කළ නොහැකි අයිතිවාසිකම් සමහරක් ලබා දී තිබේ.)** |
| 1789 | - | ප්‍රංශ විප්ලවය |
| 1791 | - | මිනිසා සහ පුරවැසියන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රංශ ප්‍රකාශය.<br>**(මිනිසුන් නිදහසේ ඉපදී තිබේ. නිදහසේ ජීවත් වේ. ඔවුන්ට සමාන අයිතිවාසිකම් ලැබී තිබේ.)** |
| 1805 | - | ප්‍රංශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව |
| 1917 | - | රුසියානු විප්ලවය. |
| 1948<br>12<br>10 | - | එක්සත් ජාතීන්ග් මානව හිමිකම් සම්බන්ධ විශ්ව ප්‍රකාශයනය.<br>**(සියලුම මිනිසුන් නිදහසේ ඉපිද තිබේ. ඔවුන්ට සමාන ආත්ම ගෞරවයක් සහ අයිතිවාසිකම් ලැබී තිබේ.)** |

- <u>අයිතිවාසිකම් සතු ලක්ෂණ.</u>

(i) අයිතිවාසිකම් වනාහි මානව ජීවිතය තෘප්තිමත් කිරීම සඳහා අත්‍යවශ්‍ය මූලධර්මය වේ.

(ii) අයිතිවාසිකම් සමස්ත සමාජය විසින් පිළිගත් පොදු කොන්දේසි මාලාවක් වීම.

(iii) සමාජයෙන් පරිභාහිරව අයිතිවාසිකම් නොපැවතීම.

(iv) සෑම අයිතිවාසිකමක්ම රාජ්‍යය විසින් නිර්මාණය නොකළ ද සමාජය විසින් පිළිගත් අයිතිවාසිකම් සුරක්ෂිත කොට පවත්වාගෙන යාම රාජ්‍යයේ වගකීමවීම.

(v) සියලු පුරවැසියන්ට සමානව අයිතිවාසිකම් හිමිවීම.

(vi) අයිතිවාසිකම් අනිසි ලෙස භුක්ති විඳීම දඬුවම් ලැබිය හැකි වරදක් වීම.

(vii) අනෙකාගේ අයිතිවාසිකම් උල්ලංඝනය නොවන පරිදි අයිතිවාසිකම් භුක්තිවිඳිය යුතු වීම.

(viii) අයිතිවාසිකම් මගින් පොදු සමාජ යහපත ගොඩ නැගීම.

(ix) අයිතිවාසිකම් හා යුතුකම් අතර අති සමීප සම්බන්ධයක් පැවතීම.

(x) සමාජ අවශ්‍යතාවයන් වර්ධනය වන විට අයිතිවාසිකම් ද වර්ධනය වීම.

## • අයිතිවාසිකම් වල ප්‍රභවය සම්බන්ධ මතවාද (න්‍යායන්)

අයිතිවාසිකම් වල උත්පාද වීම සම්බන්ධයෙන් දේශපාලන විද්‍යාව තුළ පොදු පිළිගත් කේන්ද්‍රීය මතවාදයක් නොමැත. අයිතිවාසිකම් උත්පාද වීම (ප්‍රභවය) සම්බන්ධයෙන් මතවාද (න්‍යායන්) රාශියක් දේශපාලන විද්‍යාව තුල තිබේ.

- **අයිතිවාසිකම් පිළිබඳ ස්වාභාවික න්‍යාය.**

- **අයිතිවාසිකම් පිළිබඳ නෛතික න්‍යාය.**

- **අයිතිවාසිකම් පිළිබඳ විඥානවාදී න්‍යාය.**

- **අයිතිවාසිකම් පිළිබඳ ඓතිහාසික න්‍යාය.**

- **අයිතිවාසිකම් පිළිබඳ සමාජ සුබසාධන න්‍යාය.**

### ■ අයිතිවාසිකම් පිළිබඳ ස්වාභාවික න්‍යාය.

අයිතිවාසිකම් ප්‍රභවය සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති පුරෝගාමී න්‍යායක් ලෙස අයිතිවාසිකම් පිළිබඳ ස්වාභාවික න්‍යාය හැඳින්විය හැකිය. **මෙම මතවාදයට අනුව අයිතිවාසිකම් මිනිසාට හිමිවූයේ ස්වභාවයෙන්මය.** අයිතිවාසිකම් පිළිබඳ ස්වභාවධර්ම න්‍යාය (Natural theory) ලෙසද මෙය හඳුන්වයි. මෙම න්‍යායට අනුව **ස්ථානය - කාලය - වටපිටාව** අනුව වෙනස් නොවන විශ්වමය ස්වභාවයක් අයිතිවාසිකම් සතුව තිබේ. මෙම න්‍යායට අනුව අයිතිවාසිකම් වල නිර්මාතෘ වරයා ස්වභාව ධර්මයයි. ඒ අනුව අයිතිවාසිකම් යනු රාජ්‍යයේ නිර්මාණයක් නොවේ. රාජ්‍යය බිහිවීමට පූර්ව යුගය තුළ පවා මිනිසුන්ට අයිතිවාසිකම් වල හිමි විය. රාජ්‍යය විසින් කළ යුත්තේ සමාජය විසින් පිළිගත් අයිතිවාසිකම් සුරක්ෂාව කොට සහතික කිරීමයි. රාජ්‍යය විසින් මිනිස් අයිතිවාසිකම් ආරක්ෂානොකරන විට එම අයිතිවාසිකම් ලබා ගැනීමට මිනිසුන් විප්ලව පවා සිදු කළේ ය.

නිදර්ශන -: 1789 ප්‍රංශ විප්ලවය.

ස්වාභාවික අයිතිවාසිකම් පිළිබඳ මතය ඓතිහාසික ග්‍රීක අවධිය තුළ සිට විකාශනය වන්නකි. ග්‍රීසියේ ස්ටොයික්වරුන් (Stoics) උපේක්ෂා දර්ශනවාදීහු වර්ගයාගේ ස්වභාවික සමානාත්මතාවය පිළිබඳ අදහස ප්‍රකාශ කිරීමත් සමග මෙය ඇරඹුණි. රෝම අවධිය තුළ පොලිබිසියස් (Polybius) , සිසරෝ (Cicero) ද ස්ටොයික්වාදී අදහස් වර්ධනය කළේ ය. විශ්වීය ස්වභාවයක් ඇති සදාකාලික බුද්ධිය හා වෙනස් නොවන ස්වාභාවික නීතියට සිවිල් නීතිය අවනත විය යුතු බව ඔවුන් විශ්වාස කළේ ය. මධ්‍යතන යුගයේ දී ස්වාභාවික නීතිය දෙවියන්ගේ නීතිය බවට පත් විය. මිනිසාගේ අයිතිවාසිකම් වල කතෘවරයා දෙවියන් වහන්සේ බවට පත් වූහ.

නූතන යුගය තුළ සමාජ සම්මුතිවාදී විග්‍රහය තුල දී හොබ්ස් - ලොක් - රූසෝ මෙම ස්වාභාවික අයිතිවාසිකම් පිළිබඳ මතය තහවුරු කළේ ය. **තෝමස් හොබ්ස් ප්‍රකාශ කළේ රාජ්‍යය බිහිවීමට පෙර ප්‍රකෘති සමාජය තුළ දී මිනිසුන් ජීවිතය - දේපල - නිදහස යන ස්වාභාවික අයිතිවාසිකම් භුක්ති විඳි බවයි. ජෝන් ලොක් ප්‍රකාශ කළේ ස්වභාවයෙන්ම මිනිසුන්ට හිමි වූ අයිතිවාසිම් අහිමි කිරීමට පාලකයාට හෝ රාජ්‍යයට නොහැකි බවයි. එම අයිතීන් ආරක්ෂා කිරීම පමණක් රාජ්‍යය විසින් සිදුකළ යුතු බවයි.** වර්තමානය වන විට ලැස්කි - කෝල් වැනි සමාජ බහුවිදවාදීහු ස්වාභාවික අයිතිවාසිකම් පිළිබඳ මතය පිළිගනී.

## ■ අයිතිවාසිකම් පිළිබඳ නෛතික න්‍යාය.

අයිතිවාසිකම් පිළිබඳ ස්වාභාවික න්‍යාය විවේචනය කරමින් මෙම න්‍යාය නිර්මාණය විය. **අයිතිවාසිකම් යනු ස්වභාවයෙන් හිමි වූවක් නොවේ. රාජ්‍යය නීති මගින් ස්ථාපනය කළ කොන්දේසිය.** මේ අනුව අයිතිවාසිකම් වල එකම මූලාශ්‍රය රාජ්‍යය වේ. රාජ්‍යය මගින් අයිතිවාසිකම් ලබානොදෙන විට පුරවැසියන්ට අයිතිවාසිකම් හිමි නොවේ.

නිදර්ශන -: **බ්‍රිතාන්‍යය තුළ මුඛවාඩම් පනත ක්‍රියාත්මක වන අවධිය තුළ ජනතාවගේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ලොප් වී තිබීම.**

නීතිමය අයිතිවාසිකම් පිළිබඳ මතය උපයෝගීතාවාදයෙකු වූ **ජෙරමි බෙන්තම්** විසින් මූලිකව ඉදිරිපත් කරයි. බෙන්තම්ට අනුව අයිතිවාසිකම් යනු සංවිධානාත්මක සමාජයේ සහ නීතියේ නිර්මාණයක් වේ.

**(N.B)** *මිනිසාට අයිතිවාසිකම් හිමි වීම සම්බන්ධයෙන් පිළිගත් පොදු මතය ගොඩ නැගී තිබෙන්නේ ස්වාභාවික අයිතිවාසිකම් පිළිබඳ මතයන් – නීතිමය අයිතිවාසිකම් පිළිබඳ මතයන් මිශ්‍ර වීමෙනි. ලැස්කි ප්‍රකාශ කර සිටින්නේ අයිතිවාසිකම් වල ඒකම මූලාශ්‍රය රාජ්‍යය වනවාය යන මතය පිළිගත නොහැකි බවයි. ඔහු වැඩි දුරටත් දක්වන්නේ ඇතැම් අයිතිවාසිකම් මිනිසා උපතින්ම අත්පත්කරගන්නා අතර ඇතැම් අයිතිවාසිකම් මිනිසා සමාජ ක්‍රියාකාරීත්වය තුළින් අත්පත් කර ගනී. අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධ විශාල වගකීම් ප්‍රමාණයක් රාජ්‍යය සතු වේ.*

## ■ අයිතිවාසිකම් පිළිබඳ විඥානවාදී න්‍යාය.

අයිතිවාසිකම් පිළිබඳ ස්වාභාවික න්‍යාය ද අයිතිවාසිකම් පිළිබඳ නෛතික න්‍යාය යන න්‍යායන් යුග්මයට ම වඩා මෙය වෙනස් වේ. **විඥානවාදී න්‍යායෙන් අයිතිවාසිකම් පැහැදිලි කරනු ලබන්නේ මිනිසාගේ පෞරුෂත්වය සම්පූර්ණ කිරීමට හා පවත්වා ගෙන යාමට අවශ්‍ය භෞතික තත්ත්වයක් වශයෙනි.** අයිතිවාසිකම් වලින් තොරව කිසිදු පුද්ගලයෙකුට තමන් අපේක්ෂා කරන තත්වයට ළඟාවිය නොහැකි බව මෙම න්‍යායෙන් විෂධ වේ. **මෙම න්‍යායට අනුව මිනිසාගේ ශ්‍රේෂ්ඨ පරම අයිතිය වන්නේ පෞරුෂත්වය පිළිබඳ අයිතිය වේ.**

## ■ අයිතිවාසිකම් පිළිබඳ ඓතිහාසික න්‍යාය.

අයිතිවාසිකම් පිළිබඳ අයිතිහාසික න්‍යායට අනුව **අයිතිවාසිකම් යනු කාලය විසින් ඇතිකරන ලද ඒවා වේ.** ඉතිහාසය තුළ ඇති වූ පුරුදු භාවිතයන් මුල්බැසගැනීම පදනම් කොට ගෙන අයිතිවාසිකම් උත්පාද වූ බව එම න්‍යායේ අර්ථය වේ. **මෙම න්‍යායට අනුව අයිතිවාසිකම් වල නිර්මාපකයා (කර්තෘවරයා) සම්ප්‍රදායන් හෙවත් පුරුදුය.**

අයිතිවාසිකම් පිළිබඳ ඓතිහාසික න්‍යාය මැක් අයිවර් (Mac Iver) වැනි සමාජ විද්‍යාඥයින් විසින් ඉදිරිපත් කරයි. අයිවර් ප්‍රකාශ කරනුයේ වර්තමානයේ පවතින නීති කාලයක් තිස්සේ ස්ථාපිත වූ පුරුදු නෛතික සීමාවක් තුළ පිළිගැනීමකි. මෙම න්‍යායට අනුව අයිතිවාසිකම් හොඳින් මුල්බැසගත් පුරුදු (භාවිත) වල අග්‍රඵලය ලෙස විග්‍රහකළ හැකය. නමුත් සියලු අයිතිවාසිකම් වල ප්‍රභවය එසේ සිදුවූ බවට පිළිගත නොහැකිය. **නිදසුනක්** ලෙස ඉහතින් දක්වන ලද කරුණ සත්‍ය නම් වහල් භාවය අදටත් පැවතිය යුතු බව ඉන් අදහස් වේ. නමුත් මෙම න්‍යායේ එක් ලක්ෂණයක් බැහැර කළ නොහැකිය, එනම් අයිතිවාසිකම් ඇති කිරීමේ දී කාලය නැමති සාධකයේ වැදගත් භාවයයි.

■ <u>අයිතිවාසිකම් පිළිබඳ සමාජ සුබසාධන න්‍යාය.</u>

අයිතිවාසිකම් පිළිබඳ සමාජ සුබසාධන න්‍යායට අනුව **<u>අයිතිවාසිකම් යනු පොදු සුබසාධනය අරමුණු කොට ගෙන සමාජය විසින් ස්ථාපනය කරන ලද කොන්දේසිය.</u>** අයිතිවාසිකම් යනු විශාල දෙනෙකුගේ ඉහළම තෘප්තිය - යහපත සැලසීමට උපකාරීවන සමාජ කොන්දේසි ලෙස හඳුනාගත හැකිය. **විශාල සංඛ්‍යාවේ තෘප්තියට සමපාත නොවන දේ අයිතිවාසිකම් ලෙස පිළිගත නොහැකි බව** මෙම න්‍යායේ මතය වේ.

අයිතිවාසිකම් පිළිබඳ සමාජ සුබසාධන න්‍යාය ඉදිරිපත් කළ ප්‍රධාන කරීකයන් ලෙස **ජෙරමි බෙන්තම් - ලැස්කි** ආදීහු හඳුනාගත හැකිය.

## ● <u>අයිතිවාසිකම් වර්ග කිරීම.</u>

අයිතිවාසිකම් වර්ග කිරීම සම්බන්ධයෙන් පොදුවේ පිළිගත් එක් මතයක් දේශපාලන විද්‍යාව තුළ නොමැත. අධ්‍යයනයේ පහසුව සඳහා ලේඛකයන් බහුතරයක් පහත පරිදි අයිතිවාසිකම් වර්ගීකරණය කොට තිබේ.

I **සිවිල් අයිතිවාසිකම්** → සමාජීය අයිතිවාසිකම් / ආර්ථික අයිතිවාසිකම්

II **දේශපාලන අයිතිවාසිකම්**

**මේ අනුව අයිතිවාසිකම් කොටස් 03 කි.**

අයිතිවාසිකම්
- සාමාජයීය අයිතිවාසිකම්
- ආර්ථික අයිතිවාසිකම්
- දේශපාලන අයිතිවාසිකම්

### 01. **සමාජයීය අයිතිවාසිකම්.**

පුද්ගලයාට යහපත් , තෘප්තිමත්, ජීවිතයක් ගත කිරීමට සාමාජීය වශයෙන් හිමිවිය යුතු අයිතිවාසිකම් සාමාජීය අයිතිවාසිකම් ලෙස නිර්වචනය කළ හැකිය. **තවදුරටත්** මිනිසාගේ පෞද්ගලික ක්‍රියාකාරකම් වර්ධනය කර ගැනීමට අවශ්‍ය සාමාජයීය කොන්දේසි සාමාජීය අයිතිවාසිකම් ලෙස නිර්වචනය කළ හැකිය.

(i) **ජීවත් වීමට ඇති අයිතිය.**

අයිතිවාසිකම් අතරින් වඩාත් වැදගත් අයිතිවාසිකම වන්නේ මෙයයි. ඊට හේතු වන්නේ ජීවත්වීමේ අයිතිය තහවුරු වනතුරු වෙනත් කිසිඳු අයිතිවාසිකමක් හිමි නොවන බැවිනි. බියෙන් හා සැකයෙන් තොරව ජීවත් වීමේ අයිතිය සැම අයෙකුටම සමානව හිමි විය යුතු ය.

*ජීවත්වීමේ අයිතිය සම්බන්ධයෙන් සාකච්ඡා කරන විට අවධානය යොමු කළ යුතු වැදගත් කරුණු කිහිපයකි.*

**ජීවත්වීමේ අයිතිය සමග කෙනෙකුට සියදිවි හානිකර ගැනීමේ අයිතිය හිමිවනවා ද?**

**තවත් අයකු ඝාතනය කිරීමේ අයිතිය , ජීවත් වීමේ අයිතිය යටතේ කෙනෙකුට හිමිවනවා ද?**

**මිනීමරුවකුට මරණ දඬුවම පැමිණ වීම සාධාරණ සහ යුක්ති සහගත ක්‍රියාවක් වන්නේ ද?**

**රාජ්‍යය යුද්ධවලට පැටලීම හේතු කොට ගෙන පුරවැසි ජීවිත නිරපරාදේ විනාශ වීමට ඉඩදීම අනුමත කළ හැකි සාධාරණ ක්‍රියාවක් ද?**

(ii) **පෞද්ගලික නිදහස පිළිබඳ අයිතිය.**

බාධාකිරීම්වලින් තොරව පුද්ගලයන්ට තම කටයුතු පවත්වාගෙන යාමට ඇති අයිතිය පෞද්ගලිකත්වය පිළිබඳ අයිතිය වේ. ජීවත්වීමේ අයිතිය පමණක් ප්‍රමාණවත් නොවේ. තෘප්තිමත් ජීවිතයක් ගත කිරීම සඳහා පෞද්ගලික නිදහස පිළිබඳ අයිතිවාසිකම තිබිය යුතුමය. පෞද්ගලික නිදහස පිළිබඳ අයිතිය කොටස් තුනකින් යුක්ත වේ. ඒවානම් , **තමන් කැමති රැකියාවක් හෝ ව්‍යාපාරයක් හෝ කිරීමේ අයිතිය. - නිදහසේ ඔබ මොබ යාමේ අයිතිය සහ තමා කැමති තැනක පදිංචි වීමේ අයිතිය. - හිතුවක්කාරී ලෙස අත්තඩංගුවට ගැනීමෙන් සහ රඳවා තබා ගැනීමෙන් වැලකීමේ අයිතිය.**

(iii) **නිදහසේ සිතීමට හා අදහස් ප්‍රකාශ කිරීමට ඇති අයිතිය.**

නිදහසේ සිතීමට, අදහස් ප්‍රකාශ කිරීමට, සාකච්ඡා කිරීමට මුද්‍රණය කිරීමට ඇති අයිතිය මෙයින් අදහස් වේ. මෙම අයිතියට ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රියාවලියක් තුළ වැදගත් ස්ථානයක් හිමි වේ.

(iv) **තමා කැමති ආගමක් ඇදහීමේ අයිතිය.**

සදාචාරයට යහපැවැත්මට හානිකර නොවන සිවිල් සමාජයේ සුචරිතභාවයට හානිකර නොවන අයුරින් ස්වකීය **ආගමික - ලබ්ධික - විශ්වාස** දැරීමට පුද්ගලයාට අයිතියක් තිබේ. මෙම නිදහස සැබෑ ලෙසම ආරක්ෂා වන්නේ සියලු ආගම් සම්බන්ධයෙන් රාජ්‍ය මධ්‍යස්ථ ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නේ නම් පමණි.

**"අනෙක් ආගම්වල පැවැත්ම ඉවසන ඕනෑම ආගමක පැවැත්මට රාජ්‍යය ඉඩ දිය යුතු ය. ආගම් කෙරෙහි රාජ්‍ය මැදිහත් විය යුත්තේ එමගින් කෙරෙන දේශනා යහපත් පුරවැසි ජීවිතයකට හානිකර වන්නේ නම් පමණි."**

-රූසෝ-

(v) **සංවිධානය වීමේ අයිතිය.**

මිනිසුන්ට නිදහසේ සංවිධානය වීමට (රංචු ගැසීමට / රාශිගත වීමට) ඇති අයිතිය මින් අර්ථවත් වේ. ආර්ථික - සාමාජීය - සංස්කෘතික - ආගමික - දේශපාලනික - වෘත්තීමය අවශ්‍යතාවයන් මත මිනිසුන් රාශිගත වීම සහ සංවිධාන පිහිටුවා ගැනීම ප්‍රජාතාන්ත්‍රික රාජ්‍යයක මූලික ලක්ෂණයකි.

(vi) **පවුල් ජීවිතයක් ගත කිරීමට ඇති අයිතිය.**

මානව සමාජයේ කුඩාම අපූර්වතම තැනුම් ඒකකය වන පවුල් (කුටුම්භ) ජීවිතයක් ගත කිරීම සඳහා සෑම මිනිසෙකුටම අයිතිය තිබිය යුතුය. ඒවා නම් , **විවාහ වීමේ අයිතිය - දරුවන් හදා වඩා ගැනීමේ අයිතිය. - අන්‍යයන්ගේ මැදිහත් වීමකින් තොරව ස්වාධීන පවුල් ඒකකයක් ගත කිරීමේ අයිතිය.** මෙම අයිතීන් භුක්තිවිඳිය යුත්තේ පොදු සමාජ පැවැත්මට හානි කර නොවන අයුරිනි. මෙම අයිතීන් පාරිශුද්ධත්වය සඳහා රාජ්‍යයන් විසින් කටයුතු යොදා තිබේ.

නිදර්ශන -: **බහු විවාහ , දික්කසාද සහ දරුවන් සම්බන්ධයෙන් රාජ්‍යයන් විසින් පනවා ඇති නීති.**

(vii) **අධ්‍යාපනය ලබා ගැනීමේ අයිතිය.**

මානවයන්ගේ ජීවිත පරිපූර්ණත්වයට පත් විම සඳහා අධ්‍යාපනය සම්බන්ධ අයිතිය අත්‍යවශ්‍ය වේ. විශේෂයෙන් සමාජ පැවැත්මට බාධාකාරී නොවී ජීවත් වීමට අදාළ දැනුම එම අයිතිය තුළින් පුද්ගලයාට හිමි වේ.

(viii) **සමානාත්මතාව පිළිබඳ අයිතිය.**

සමානාත්මතාවය පිළිබඳ අයිතිය ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක වැදගත් අයිතිවාසිකමකි. **ජාතිය - ආගම - වර්ගය - භාෂාව - ලිංග භේදය - කුලය** යන සාධක පදනම් කොටගෙන පුද්ගල හෝ පුද්ගල කණ්ඩායම් විශේෂිකරණය නොකිරීම සමානාත්මතාව පිළිබඳ අයිතියේ ප්‍රධාන කොන්දේසිය වේ.

(ix) **යාම් ඒම් කිරීමේ අයිතිය.**

(x) **අභිමත ස්ථානයක පදිංචි වීමේ අයිතිය.**

| 02. | **ආර්ථික අයිතිවාසිකම්.** |
|---|---|

පුද්ගලයාට යහපත් , තෘප්තිමත් ජීවිතයක් ගත කිරීමට ආර්ථිකමය වශයෙන් හිමිවිය යුතු අයිතිවාසිකම් ආර්ථික අයිතිවාසිකම් ලෙස හැඳින්විය හැකිය. **තවදුරටත්,** මිනිසාගේ පෞද්ගලික ක්‍රියාකාරකම් වර්ධනය කරගැනීමට ආර්ථිකමය වශයෙන් හිමිවිය යුතු කොන්දේසි ආර්ථික අයිතිවාසිකම් ලෙස නිර්වචනය කළ හැකිය.

(i) **දේපල අයත්කර ගැනීමේ අයිතිය.**

පෞද්ගලික දේපල යනු, කෙනෙකුගේ අභිමතානුසාරී පාලනයට යටත් තමන්ට අවශ්‍ය අයුරින් භාවිත කළ හැකි බෙදිය හැකි සහ පැවරිය හැකි නිශ්චල හා චංචල වස්තූන්ය. මෙම පෞද්ගලික දේපළ අත්පත් කර ගැනීම සඳහා මිනිසා තුළ ස්වභාවයෙන්ම ආශාවක් පවතී. සාර්ථක ජීවිතයක් ගත කිරීම සඳහා පෞද්ගලික දේපළ සම්බන්ධ හිමිකම අතිශයින්ම වැදගත් වේ.

*පෞද්ගලික දේපල සම්බන්ධ අයිතිය සාධාරණී කරණය කළ අදහස් කිහිපයකි.*

"මිනිසාට පෞද්ගලිකත්වය පරිපූර්ණ කර ගැනීම සඳහා දේපල අත්‍යාවශ්‍යය වේ."

"පෞද්ගලික දේපළ මිනිසාට ආරක්ෂාව සම්බන්ධ මනෝභාවය ගෙන දේ."

"මානවයා නිර්මාණශීලී වීමට දේපළ පිළිබඳ සාධකය හේතු වේ."

"දේපල නොමැති වූ විට මිනිසුන් වහලුන් බවට පත් වේ."

"සාමාජීය යුතුකම් නොපිරිහෙලා ඉටු කිරීම සඳහා මිනිසාට දේපළ අත්‍යවශ්‍ය වේ."

*පෞද්ගලික දේපළ සම්බන්ධ අයිතියට ප්‍රවිරුද්ධව නිර්මාණය වී ඇති අදහස්*

"සමානව උපදින මිනිසුන් ඇති - නැති ලෙස කොටස් දෙකකට බෙදීම සහ දේපළ අහිමි කොටස සදාකාලික වේදනාවෙන් පෙලීම."

"අධික ධනයක් ඇති පුද්ගලයන් කම්මැලියන් කුසීතයන් බවට පත්විය හැකිය යන හැඟීම"

(ii) **වැඩ කිරීමේ අයිතිය. (රැකියාවක් කිරීමේ අයිතිය)**

සමාජ පැවැත්ම සඳහා අවශ්‍ය නිෂ්පාදන සහ බෙදා හැරීම යන කාර්යයන්ට සහභාගී වීමට ඇති අයිතිය මෙයින් අදහස් වේ.

(iii) **සාධාරණ පැය ගණනක් වැඩ කිරීමේ අයිතිය.**

(iv) **වැඩ කරන කාලය අතර තුර විවේකයක් ලැබීමේ අයිතිය.**

(v) **වැඩ ප්‍රමාණය අනුව සාධාරණ වැටුප් ලැබීමේ අයිතිය.**

(vi) **අදාළ කාලයට වඩා වැඩ කරන්නේ නම් අතිකාල දීමනා ලැබීමේ අයිතිය.**

(vii) **රැකියාවක් නොකර සිටීමේ අයිතිය.**

(viii) **ලාභ ඉපයීමේ අයිතිය.**

(ix) **නිවාඩු ලබාගැනීමේ අයිතිය.**

(x) **විශ්‍රාම - අතිකාල - බෝනස් දීමනා ලැබීම් හිමිකම.**

(xi) **සේවයේ සුරක්ෂිතතාවය සඳහා වෘත්තීය සමිති පිහිටුවා ගැනීමේ අයිතිය.**

(xii) **වෘත්තීය ක්‍රියාමාර්ග - වැඩ වර්ජන - අකුරය වැඩ කිරීම වැනි කාර්යයන්හි නියැලීමේ අයිතිය.**

| 03. | දේශපාලන අයිතිවාසිකම්. |
|---|---|

පුද්ගලයාට අයහපත් , තෘප්තිමත් ජීවිතයක් ගත කිරීමට දේශපාලන වශයෙන් හිමිවිය යුතු අයිතිවාසිකම් ලෙස හැඳින්විය හැකිය. **තවදුරටත්** මිනිසාගේ පෞද්ගලික ක්‍රියාකාරකම් වර්ධනය කරගැනීමට දේශපාලනමය වශයෙන් හිමිවිය යුතු කොන්දේසි දේශපාලන අයිතිවාසිකම් ලෙස නිර්වචනය කළ හැකිය.

(i) **ඡන්දය දීමේ අයිතිය.**

වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක ජාතික රාජ්‍ය තුළ පුරවැසියා සතු වැදගත දේශපාලන අයිතිවාසිකම මෙය වේ. **ජනතා පරමාධිපත්‍යය ක්‍රියාවට නැන්වීම සඳහා අත්‍යවශ්‍ය හිමිකම වන්නේ ඡන්ද බලයයි.** සෑම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයකම පුරවැසියන්ට ජාතිය - වර්ගය - කුලය - ආගම - භාෂාව - ස්ත්‍රී පුරුෂ භාවය නොසලකා සර්ව ජන ඡන්ද බලය ප්‍රවාහනය කොට තිබේ. නමුත් ඇතැම් විට සිහි විකල් වූවන්ට - බාලයන්ට - වස්තු භංගත්වයට පත් වූවන් ට - සිවිල් අයිතිවාසිකම් අහිමි වූවන්ට - බරපතල අපරාධකරුවන්ට ඡන්ද බලය ලබා නොදේ.

(ii) **තමා කැමති දේශපාලන පක්ෂයකට සම්බන්ධ වීමේ අයිතිය.**

ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් තුළ ස්වකීය අභිමතය පරිදි කැමති දේශපාලන පක්ෂයකට සම්බන්ධ වීමේ අවකාශය පුරවැසියන් සතුය. වෙනත් ලෙසකින් දක්වන්නේ නම් කැමති දේශපාලන දර්ශනයක් ඇදහීමට - දැරීමට පුද්ගලයාට හැකියාව තිබේ.

(iii) **රජයේ නිලතල දැරීමේ අතීතය.**

ජාතිය - වර්ගය - කුලය - වර්ණය - අගම - භාෂාව ස්ත්‍රී පුරුෂ භාවය යන සීමාවන් ගේ බලපෑමකින් තොරව රජයේ නිලතල වලට තේරී පත්වීමට පුද්ගලයන්ට අයිතිය තිබිය යුතුය.

(iv) **මැතිවරණ වලට ඉදිරිපත් වීම සහ මන්ත්‍රීවරු වශයෙන් තේරීපත්වීමේ අයිතිය.**

සෑම පුද්ගලයෙකුටම මැතිවරණ වලට ඉදිරිපත් විමට හා නියෝජිතයෙකු ලෙස තේරීපත්වීමට හිමිකම තිබේ. නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන වර්තමානය තුළ එය පුද්ගලයා සතු වැදගත් හිමිකමකි. නමුත් පොදු පිළිගැනීම වන්නේ මන්ත්‍රීවරයෙකු ලෙස තේරීපත්වීමට ඊට අදාළ අධ්‍යාපනය - කාර්යශූරභාවය - කථිකත්වය - නායකත්වය - උපායශීලී භාවය - පෞරුෂය වැනි මූලධර්ම අවශ්‍ය බවයි.

(v) **ආණ්ඩු විවේචනය කිරීමේ අයිතිය.**

ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ආණ්ඩු විවේචනය කිරීම සඳහා ජනතාවට අයිතිය තිබේ. පාලකයන්ගේ දූෂණ - වංචා - අක්‍රමිකතා විවේචනය කිරීමේ අවකාශය ජනතාව සතුය. එය ආණ්ඩුව නිවැරදි දිශානතියකට ගමන් කිරීමට හේතු වේ.

(vi) **සාමකාමීව ආණ්ඩු පෙරලා දැමීමේ අයිතිය.**

(vii) **දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමේ අයිතිය.**

- <u>අයිතිවාසිකම් සම්බන්ධයෙන් ඇති සීමා.</u>

(i) **අනෙකාගේ අයිතිවාසිකම් වලට හානි නොවන පරිදි අයිතිවාසිකම් භුක්ති විඳිය යුතු වීම.**

පුද්ගලයන්ට හිමි අයිතිවාසිකම් භුක්ති විඳිය යුත්තේ අනෙකාගේ අයිතිවාසිකම් වලට හානි නොවන පරිද්දෙනි. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් අන්‍යයන්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය නොවන පරිදි අයිතිවාසිකම් භුක්ති විඳිය යුතු ය.

**නිදර්ශන** -: භාෂණයේ , ප්‍රකාශනය , අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය පුද්ගලයාට ඇතත් අන්‍යයන්ට අපහාස කිරීමට , මිත්‍යාමත ප්‍රචාරණය කිරීමට අයිතියක් නොමැත.

(ii) **රාජ්‍යය තුළ ක්‍රියාත්මක වන නෛතික සීමාවන්ට යටත්ව අයිතිවාසිකම් භුක්ති විඳීමට සිදු වීම.**

පුද්ගලයන්ට හිමි අයිතිවාසිකම් භුක්ති විඳීමට සිදුවන්නේ රාජ්‍යය තුළ පවතින නෛතික සීමාවන් තුළ ය. නෛතික සීමාවන් උල්ලංඝණය කරමින් අයිතිවාසිකම් භුක්ති විඳිය නොහැකිය.

නිදර්ශන -: ස්වකීය අභිමතය පරිදි යාම් ඊම් කිරීමේ අයිතිය පුද්ගලයන්ට ඇතත් <u>ඇඳිරි නීතිය</u> පැනවූ අවස්ථා වල අධි ආරක්ෂිත කළාප තුළ යාම් ඊම් කිරීමේ අයිතියට බාධා (සීමා) පවතී.

කැමති වෘත්තියක් කිරීමට අයිතිය පුද්ගලයා සතු වුවද ඇතැම් රාජ්‍යයන්හි ගණිකා වෘත්තිය තහනම් කොට තිබීම.

විවාහ වීමට පවුල් ජීවිතයක් ගත කිරීමට අයිතිය පුද්ගලයාට තිබේ. නමුත් මැදපෙරදිග අරාබියානු රාජ්‍යය වල හැර බහු භාර්යා සේවනීය විවාහ බොහෝ රාජ්‍යයන් විසින් පිළිනොගනී.

(iii) **වගකීම් සහගතව අයිතිවාසිකම් භුක්ති විඳිය යුතු වීම.**

අයිතිවාසිකම් වලට ඇති තවත් සීමාවක් වන්නේ වගකීම් සහගතව අයිතිවාසිකම් භුක්ති විඳීමට සිදුවීමයි. අයිතිවාසිකම් අත්තනෝමතිකව භාවිතා කළ නොහැකිය

"මගේ සැරයැටිය වැනීමට ඇති නිදහස අනෙකාගේ නාසය ළඟින් කෙළවර වේ."
-ලැස්කි-

(iv) **අයිතිවාසිකම් සම්බන්ධයෙන් ජනතාවගේ නොදැනුවත් භාවය.**

අයිතිවාසිකම් සම්බන්ධයෙන් ඇති තවත් සීමාවක් වන්නේ ඒ සම්බන්ධයෙන් ජනතාව සතු අනවබෝධයයි. අයිතිවාසිකම් භුක්ති විඳීමට නම් ඒ සම්බන්ධයෙන් ජනතාවට අවබෝධයක් පැවතිය යුතු ය.

(v) **ආර්ථික දුබලතාවය.**

අයිතිවාසිකම් උල්ලංඝනය වූ විට නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඇතැම් විට ආර්ථික දුබලතාවයහේතු විය හැකිය. ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට ස්වකීය පැමිණිල්ල ඉදිරිපත් කිරීමට හා ඒ වෙනුවෙන් යෙදවීමට ප්‍රාග්ධනය නොමැති විය හැකිය. එය අයිවාසිකම් සම්බන්ධයෙන් ඇති සීමාවකි.

(vi) **ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත නොවීම.**

ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත නොවීම අයිතිවාසිකම් සම්බන්ධයෙන් ඇති ප්‍රධාන සීමාවකි. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් තුළ ව්‍යවස්ථානුකූල වාදය - නීතියේ ආධිපත්‍යය - මහජන මතය - බලපෑම් කණ්ඩායම් - ස්වාධීන අධිකරණ - ජනතා පරමාධිපත්‍යය - නිදහස් රහස් තරඟකාරී සාධාරණ මැතිවරණ වැනි ප්‍රජාතන්ත්‍රීය මූලධර්ම ක්‍රියාත්මක විය යුතු ය. මෙවැනි තත්වයන් ක්‍රියාත්මක නොවන විට ජනතාවට අයිතිවාසිකම් හිමි වීම සම්බන්ධයෙන් අධිකතර සීමා පවතී.

(vii) **රාජ්‍යය ත්‍රස්තවාදය.**

පුද්ගල අයිතිවාසිකම් සම්බන්ධයෙන් ඇති ප්‍රධාන සීමාවක් ලෙස රාජ්‍යය ත්‍රස්තවාදය පෙන්වා දිය හැකිය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් දක්වා තිබුණද ඒවා ක්‍රියාත්මක නොකර රාජ්‍ය පාලකයින් බල උන්මාදයෙන් කටයුතු කිරීම රාජ්‍ය ත්‍රස්තවාදය ලෙස නිර්වචනය කළ හැකිය. බිය ගැන්වීම - බලපෑම් කිරීම - බලහත්කාරය - අතුරුදහන් කිරීම - මරා දැමීම - බොරු චෝදනා එල්ල කර සිර ගත කිරීම - ජනමාධ්‍ය නිදහසට තිත තැබීම වැනි ක්‍රියාමාර්ග හරහා රාජ්‍ය ත්‍රස්තවාදය ක්‍රියාවට නන්වයි.

(vi) **යුතුකම් ඉටු කරමින් අයිතිවාසිකම් භුක්ති විඳිය යුතු වීම.**

(vii) **පොදු ජන අභිවෘද්ධියට හැනි නොවන පරිදි අයිතිවාසිකම් භුක්ති විඳිය යුතු ය.**

- ## <u>අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ගෙන ඇති විධිවිධාන.</u>

මානව ජීවීන් සතු සාමාජීය - ආර්ථික - දේශපාලන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා විධි විධාන රාශියක් යොදා තිබේ. එම විධිවිදාන ප්‍රධාන කොටස් කිහිපයකට කණ්ඩනය කළ හැකිය.

- **නීතිමය හා ආයතනික ක්‍රියා මාර්ග**
- **දේශපාලනික ක්‍රියාමාර්ග**
- **අන්තර් ජාතික ක්‍රියාමාර්ග**

- ### <u>නීතිමය හා ආයතනික ක්‍රියාමාර්ග</u>

(i) **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අයිතිවාසිකම් ඇතුලත් කිරීම.**

පුද්ගල අයිතිවාසිකම් රටේ මූලික නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ලේඛනගත කිරීම අයිතිවාසිකම් ව්‍යවස්ථාගත කිරීම ආරම්භ වන්නේ 18 වැනි ශතවර්ශයේ ය.

**නිදර්ශන -:** ඇමරිකානු ආණ්ඩුක්‍රමය (The bill of Rights) තුළ ප්‍රථම වරට අයිතිවාසිකම් ලේඛන ගත කිරීම.

1789 ප්‍රංශ විප්ලවයෙන් පසු බිහි වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ අයිතිවාසිකම් ලේඛන ගත කිරිම .

එංගලන්තය තුළ ලිඛිත ව්‍යවස්ථාවක් දැකිය නොහැකි වුවත් <u>මහ අධිකාර පත්‍රය, 1689 අයිතිවාසිකම් පනත</u> වැනි ලේඛන දක්නට තිබේ. එසේම එරට සම්ප්‍රධානුකූල බාවය අයිතිවාසිකම් තහවුරු වීමට හේතු වී තිබේ.

1917 රුසියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වැනි වගන්තියෙන් පුරවැසියන්ගේ ආර්ථික - දේශපාලන - සාමාජයීය - සංස්කෘතික අයිතීන් ලේඛනගත කිරීම.

පසුව තුන්වන ලෝකයේ රාජ්‍යයන් තුළ ද මූලික අයිතීන් ව්‍යවස්ථා ගත කිරීම. ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදය 10 - 14 වගන්ති. මෙම ආකාරයට මූලික අයිතිවාසිකම් ව්‍යවස්ථා ගත කිරීම නිසා පුද්ගලයන්ගේ මූලික අයිතිවාසිකම් සුරක්ෂිත වේ.

(ii) **ඔම්බඩ්ස්මන් වරයකු පත් කිරීම.**

ආයතනික වශයෙන් අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගයකි. මෙය <u>පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්</u> ලෙස ද **දුක් ගන්නාරාළ** ලෙස ද ඔම්බඩ්ස්මන් වරයා හඳුන්වයි. පරිපාලන කටයුතු නිසා පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකමක් කඩ වූ විට මොහු වෙත පෙත්සමක් ඉදිරිපත් කළ හැකිය. එය අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ගයකි.

**නිදර්ශන -:** ස්වීඩනය , බ්‍රිතාන්‍යය , ෆින්ලන්තය , ශ්‍රී ලංකාව ආදී රාජ්‍යයන් තුළ මෙම ධූරය ස්ථාපනය කර තිබේ.

(iii) **නීතියේ ආධිපත්‍යය.**

නීතියේ ආධිපත්‍යය හරහා අයිතිවාසිකම් ආරක්ෂා වේ. **නීතියේ ආධිපත්‍යය** යනු සරලව දක්වන්නේ නම්, නීතියේ බලයයි. (නීතියේ රජයුම) යි. පාලකයා ද පාලිතයා ද නීතියට යටත් බව සහ නීතිය ඉදිරියේ එක සමාන බව එහි අර්ථය වේ. නිතියේ ආධිපත්‍යය පවතින විට අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(iv) **අධිකරණයේ කාර්ය භාරය.**

පුද්ගලයන් සතු අයිතිවාසිකම් කඩ වූ පසු අධිකරණයෙන් පිහිට පැතිය හැකිය. විශේෂයෙන්ම බොහෝ රාජ්‍යයන්හි මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට බලය පවරා තිබේ. එමගින් ද අයිතිවාසිකම් ආරක්ෂා වී තිබේ.

(v) **ස්වාධීන අධිකරණ ස්ථාපනය කිරීම.**

ස්වාධීන අධිකරණයක් යනු විධායකයේ හා ව්‍යවස්ථාධායකයේ මැදිහත් වීමකින් හා බලපෑමකින් තොරව ක්‍රියාත්මක වීමට අධිකරණයට ඇති හැකියාවයි. මෙවැනි තත්වයක් මත විනිසරුවන්ට ස්වාධීනව කටයුතු කළ හැකිය. මෙම ආකාරයට අයිතිවාසිකම් ආරක්ෂා කරන ප්‍රධාන මුරකරුවා වන්නේ අධිකරණ යයි.

(vi) **මානව හිමිකම් පිළිබඳ කොමිෂන් සභා පිහිටුවීම.**

අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා අනුගමනය කරන නූතන ජනප්‍රිය ක්‍රමයක් ලෙස මානව හිමිකම් පිළිබඳ කොමිෂන් සභා පෙන්වා දිය හැකිය. මෙය අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ගෙන තිබෙන ආයතනික ක්‍රියාමාර්ගයකි.

(vii) **බලතල බෙදීමේ න්‍යාය.**
(**N.B** -: ආණ්ඩුව **tute** එක බලන්න.)

(viii) **අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය.**
(**N.B** -: ආණ්ඩුව **tute** එක බලන්න.)

(ix) **සංවරණ තුලන සිද්ධාන්තය.**
(**N.B** -: ආණ්ඩුව **tute** එක බලන්න.)

(x) **අයිතිවාසිකම් සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම.**

(xi) **රාජ්‍යය සේවය හා පොලීසිය ස්වාධීනව පවත්වා ගැනීම.**

■ <u>දේශපාලන ක්‍රියාමාර්ග.</u>

(i) **නිදහස් ජනමාධ්‍යයක් පවත්වා ගැනීම.**

නිදහස් ජනමාධ්‍යයක් පැවතීම මගින් ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂිත වේ. අයිතිවාසිම් සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම - පාලකයින්ගේ අත්තනෝමතික ක්‍රියා ජනතාවට හෙලි කිරීම මගින් අයිතිවසිකම් උල්ලංඝණය වන අවස්ථා පෙන්වා දීම ස්වාධීන ජනමාධ්‍යයක කාර්යන් වේ. මෙවැනි තත්ත්වයන් මත අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(ii) **බලපෑම් කණ්ඩායම් වල ක්‍රියාකලාපය.**
(**N.B** -: දේශපාලන ක්‍රියාදාමය **tute** එක බලන්න.)

(iii) **බලය බෙදාහැරීම හා බලය විමධ්‍යගත කිරීම.**

බහුවාර්ගික - බහු වාර්ණික - බහු ආගමික - බහු භාෂාමය පදනමක් සහිත රාජ්‍යයන්හි බලය විමධ්‍යගත කරණය තුළින් බලාපොරොත්තු වන්නේ ජනතාවගේ අයිතීන් ආරක්‍ෂා කිරීමයි. මෙය අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම සඳහා දේශපාලන අංශයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගයකි.

(iv) **මහජනතාවගේ සවිඥානික භාවය.**

අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම සඳහා කෙතෙක් විධි විධාන යොදා තිබුණ ද මහජනතාව නිරන්තර අවබෝධයකින් පසු නොවන්නේ නම් අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම පහසු කාර්යක් නොවේ. එම නිසා ජනමාධ්‍යය - විවිධ ආයතන හරහා ජනතාව අයිතිවාසිකම් සම්බන්ධයෙන් නිරන්තරව දැනුවත් භාවයකින් හා අවධියකින් තැබීම වැදගත් ය.

■ <u>අන්තර්ජාතික ක්‍රියාමාර්ග.</u>

(i) **මිනිස් අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය.**

1948 දෙසැම්බර් මස 10 දින එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මිනිස් අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය ප්‍රකාශයට පත් කළේ ය. මෙහි වගන්ති 30 කි. මෙම ප්‍රකාශනය අයිතිවාසිකම් ආරක්‍ෂා වීම සම්බන්ධයෙන් ඇති අන්තර්ජාතික වශයෙන් වැදගත් මූලාශ්‍රයකි.

(ii) **අන්තර්ජාතික ගිවිසුම්.**

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ස්වකීය සාමාජික රටවලට මිනිස් අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීමට බලකිරීම සඳහා ඇතිකරන ලද ගිවිසුම් මෙහි දී වැදගත් වේ. **1966 දෙසැම්බර් 16 වන දින එවැනි වැදගත් අන්තර්ජාතික ගිවිසුම් දෙකක් අත්සන් තැබීම.** ඉන් එක් ගිවිසුමක් <u>දේශපාලන හා සිවිල්</u> අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම වෙනුවෙනුත් අනෙක් ගිවිසුම <u>ආර්ථික, සමාජයීය හා සංස්කෘතික</u> අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම වෙනුවෙනුත් අත්සන් තබන ලදි.

(iii) **රාජ්‍යය නොවන අන්තර් ජාතික සංවිධාන.**

අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම සඳහා රාජ්‍යය නොවන අන්තර් ජාතික සංවිධාන විශාල කාර්ය භාරයක් ඉටු කරයි. රතු කුරුස (Red Cross) , ක්‍ෂමා සංවිධානය (Amunesty International) ඒ අතර වැදගත් වේ. රාජ්‍යයන් තුළ සිදුවන අයිතිවාසිකම් උල්ලංඝණය වන තත්ත්වයන් ක්‍ෂමා සංවිධානය විසින් පරීක්‍ෂා කරයි. සිවිල් යුද්ධ පවතින රටවල යුද්ධයට මැදි වූ ජනතාවට අහිමි වන අයිතිවාසිකම් සම්බන්ධයෙන් රතු කුරුස සංවිධානය පරීක්‍ෂා කරයි.

● <u>අයිතිවාසිකම්වල වැදගත් භාවය.</u>

(i) **ජාත්‍යන්තරය තුළ ඉදිරිගාමී (කැපීපෙනෙන) රාජ්‍යයක් වීමට හේතු වීම.**

නූතන ජාතික රාජ්‍යයන් අතර කැපීපෙනෙන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් ලෙස ලේබලය එල්ලා ගැනීම සඳහා අයිතිවාසිකම් ඉතාමත්ම වැදගත් සංකල්පයක් වේ. සෑම රාජ්‍යයක්ම අයිතිවාසිකම් වෙනුවෙන් ජාතික තලය තුළ ගනු ලබන ක්‍රියාමාර්ග ජාත්‍යන්තර සමාජය තුළ සාධාරණීකරණය කිරීමට සිදුව තිබේ. මෙම තත්ත්වය මත ජාත්‍යන්තරය තුළ කීර්තිය පතුරුවා ගැනීම සඳහාත් අපකීර්තිය පහ කිරීම සඳහාත් බලපාන ප්‍රධාන සාධකයක් ලෙස අයිතිවාසිකම් දැක්විය හැකිය.

(ii) **සංවර්ධනය මැනීමේ නිර්නායකයක් වීම.**

අයිතිවාසිකම් සංවර්ධනය මැනීම් දර්ශකයක් ලෙස අර්ථකතනය කිරීමට ඇතැම් විචාරකයන් පෙළඹී තිබේ. ඉන් ප්‍රකාශිත වන්නේ සංවර්ධනය යනු රාජ්‍යයක් තුළ ඇතිවන භෞතික දියුණුව (වර්ධනය) පමණක් නොවන බවයි. එම නිසා සංවර්ධනයේ දී මානව වර්ධනය ද සලකා බලන තත්ත්වයක් හඳුනාගත හැකිය.

**නිදර්ශන -:** මානව අයිතිවාසිකම් උල්ලංඝණය කළ රාජ්‍යයන් අන්තර්ජාතික ප්‍රජාවගේ දෝශදර්ශනයට කලක්වීම.

- බුරුමය වැනි රාජ්‍යයන් තුළ සිදුවන මානව අයිතීන් උල්ලංඝණය සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රජාවගේ අප්‍රසාදය.

- දකුණු අප්‍රිකාවේ ක්‍රියාත්මක වූ ඇපාතයිඩ් ප්‍රතිපත්තියට විරුද්ධව එක්සත් ජාතීන්ගේ සංවිධානය දකුණු අප්‍රිකාවට සම්බාධක පැනවීම.

(iii) **විදේශ ආධාර ලබා ගැනීමේ නිර්නායකයක් වීම.**

අයිතිවාසිකම් හොඳින් ස්ථාපනය වී ඇති රාජ්‍යයන්ට ජාත්‍යන්තර ප්‍රජාව සමඟ මිත්‍ර සබඳතා ගොඩනගා ගැනීමට පහසු වේ. ඒ මත විදේශ ආධාර - විදේශණය වැනි ආර්ථිකමය ලාභ අත්පත් කර ගැනීමට කිසියම් පහසුවක් තිබීම.

(iv) **මානව හිමිකම් කඩවීම් හඳුනාගත හැකිවීම.**

(v) **ජනතාවට තෘප්තිමත් හා යහපත් ජීවිතයක් ගත කිරීමට හේතු වීම.**

(vi) **වාර්ගික ගැටුම් - යුද්ධ - අසහනය - කැරලි - විල්පව අවම වීමට හේතු වීම.**

- ## <u>මානව හිමිකම් හා මූලික අයිතිවාසිකම්.</u>

- **මානව අයිතිවාසිකම්.**

මානව අයිතිවාසිකම් යනු සමස්ත ලෝක වැසියාටම පොදුවේ හිමි වන අයිතිවාසිකම් ය. මෙය 1948 දෙසැම්බර් 10 දින එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත් කළේ ය. එක්සත් ජාතීන්ගේ සංවිධානය මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයක් පල කිරීම අදාළ උත්තේජනයන් කිහිපයකි. ඒවානම් <u>1776 ඇමරිකානු නිදහස් සටන සහ ඇමරිකානු නිදහස් ප්‍රඥප්තිය. 1789 ප්‍රංශ විප්ලවය සහ 1791 මිනිසා සහ පුරවැසියාගේ අයිතිවාසිකම් සම්බන්ධ ප්‍රංශ ප්‍රකාශනය - 1688 උත්කෘෂ්ට විප්ලවය</u> ආදිය දැක්විය හැකිය.

**මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය සංක්ෂිප්තව සටහන් තැබීම.**

01. සියලු මිනිසා නිදහස්ව උපත ලබා ඇති අතර අයිතීන්ගෙන් සමාන වෙති.

02. ජාති, කුල, ආගම්, භාෂා, වර්ණ, ආදී වූ කිසිදු විශේෂීකරණයකින් තොරව සියලුදෙනා මෙම ප්‍රකාශනයේ සඳහන් අයිතීන්ට සමාන හිමිකම් ලබති.

03. සැමට ජීවත් වීමේ, නිදහස්ව සිතීමේ හා පෞද්ගලික ආරක්ෂාව සලසා ගැනීමේ අයිතිය ඇත්තේ ය.

04. කිසිම පුද්ගලයෙකු වහල් කමෙහි යෙදවීම හෝ වහල් වෙළඳාම පවත්වාගෙන යාම තහනම් ය.

05. කිසිම පුද්ගලයෙකු හිංසාවට හෝ අමානුෂික දඩුවමකට භාජනය නොකළ යුත්තේ ය.

06. සෑම තැනැත්තෙකු නීතිය ඉදිරියේ පුද්ගලයෙකු ලෙස සැලකිය යුත්තේ ය.

07. කිසිදු විශේෂීකරණයකින් තොරව නීතිය ඉදිරියේ ආරක්ෂාව ලැබීමේ අයිතිය සැමට ඇත.

08. නීතියෙන් උරුමව ඇති අයිතිවාසිකම් උල්ලංඝණය වීමකදී ජාතික අධිකරණයක පිහිට පැතීමේ අයිතිය සැමට හිමිය.

09. කිසිවෙකු හිතුවක්කාරී ලෙස අත් අඩංගුවට ගැනීමට, රඳවා තබා ගැනීමට හෝ පිටුවහල් කිරීමට බලය නැත.

10. ඕනෑම චෝදනාවක් සම්බන්ධයෙන් සාධාරණ වූත්, අපක්ෂපාත වූත්, විවෘත වූත් අධිකරණ තීන්දුවක් ලබා ගැනීමේ අයිතිය සැමට සමානව උරුම වේ.

11. සෑම අයෙකුම අධිකරණ ඉදිරියේ වරදකරුවෙකු කරන තුරු නිවැරදි කරුවෙකු වන අතර තම නිර්දෝෂී භාවය කියා පෑමට අයිතිය ඇත.

12. යමෙකුගෙන් සිදුවූ යම් දෙයක් පවතින නීතිය අනුව වරදක් සේ නීතියේ සඳහන් නොවන්නා වූ විටෙක ඔහු වරදකරුවෙකු නොවන අතර යමෙකුට දඩුවම් කළ හැක්කේ අදාළ කාලයේ පවත්නා වූ නීතියට අනුවය.

13. රට තුළ ඕනෑම තැනෙක යාටම ඒමට පදිංචි වීමට, විදේශ සංචාරයකට පසු පෙරළා සිය රට පැමිණීමේ අයිතිය සැමට ඇත.

14. පීඩනයන්ගෙන් හා බලපෑම්වලින් මිදීම සඳහා විදේශයක අභයාරක්ෂාව ලැබීමට සැමට අයිතිය ඇති අතර ඒවා දේශපාලන අපරාධ හෝ එක්සත් ජාතීන්ගේ අරමුණු වලට පටහැනි නොවූ චෝදනා විය යුත්තේ ය.

15. (i) සෑමපුද්ගලයෙකුටම ජාතිකත්වයකට හිමිකම් ඇත.
(ii) එම අයිතිය අහෝසි කළ නොහැකි අතර ස්වඅභිමතය මත ජාතිකත්වයවෙනස් කිරීමට ඇති අයිතිය බලයෙන් අහෝසි කළ නොහැකි ය.

16. (i) නිසි වයසට පත් සැමට කිසිදු විශේෂීකරණයකින් තොරව සිය අභිමතය පරිදි විවාහ වීමේ අයිතිය ඇත.
(ii) සමාජයේ මූලික ස්වභාවික සමූහ ඒකකය පවුළ වන අතර රජය විසින් එය සුරැකිය යුතු ය.

17. (i) සෑම පුද්ගලයෙකුටම එක්ව හෝ තනිව දේපළ එක් රැස් කිරීමේ හැකියාව ඇත.
(ii) කිසිවෙකුගේ දේපළ බලෙන් අහිම කළ නොහැක.

18. තම හෘද සාක්ෂියට එකඟව කැමති ආගමක් ඇදහීමේ අයිතිය සැමට ඇත. එම අදහස් ඉගැන්වීමේ ප්‍රචාරය කිරීමේ පිළිපැදීමේ අයිතිය සැමට ඇත.

19. නිදහස් අදහස් දැරීමේ හා ඒවා රටතුළ හෝ පිටත ප්‍රචාරය කිරීමේ අයිතිය සැමට ඇත.

20. (i) සැමට සාමකාමී රැස්වීමේ හා සමාගම් පැවැත්වීමේ අයිතිය ඇත.
(ii) කිසිවෙකු බලහත්කාරයෙන් කිසිදු සංවිධානයකට බඳවා ගත නොහැක.

21. (i) ඍජුව හෝ නියෝජිතයින් මගින් පාලන කටයුතු වලට සහභාගීවීමට සැමට අයිතිය ඇත.
(ii) රටේ රාජ්‍යය පාලනයට සහභාගීවීමේ අයිතිය සැමට ඇත.
(iii) පාලනය ආයතන කලින් කලට අව්‍යාජ ලෙස ඡන්දයෙන් තෝරා ගැනීමට සැමට අයිතිය ඇත.

22. සාමාජීය ජීවියෙකු ලෙස සමාජ සුරක්ෂිතතාව ලැබීමේ අයිතිය සැමට ඇත. ජාතික ලෙස හෝ ජාත්‍යන්තර ලෙස ආර්ථික, සාමාජික, සංස්කෘතික වශයෙන් සම්පත් හෝ පෞරුෂය වර්ධනය කරගැනීමේ අයිතිය සැමට ඇත.

23. (i) කැමති පරිදි රැකියාවක යෙදීමේ අයිතිය සැමට ඇත.
(ii) සමාන සේවයට සමාන වැටුප් ලැබීමේ අයිතිය සැමට ඇත.
(iii) සමාජ ගරුත්වය සුරැකෙන පරිදි සාධාරණ වූ වැටුපක් ලැබීමේ හිමිකම සැමට ඇත.
(iv) වෘත්තීය අයිතීන් දිනා ගැනීම සඳහා සංවිධානය වීමේ අයිතිය හිමිය.

24. වැඩ කරන කාලය තුළ නිවාඩු හා විවේක ගැනීමේ අයිතිය සැමට ඇත.

25. (i) සෑම තැනැත්තෙකුටම යහපත් දිවි පැවැත්මක් සඳහා අවශ්‍ය ආහාර, ඇඳුම්, හෝ ශාරීරික අබලතාවයකට වැනි අනපේක්ෂිත ආපදාවයකට පත්වුවහොත් ඉන් රැකවරණය ලැබීමේ අයිතියත් ඇත්තේ ය.

(ii) මාතෘ හා ළදරුභාවය විශේෂ රැකවරණය උරුම අවස්ථාවන් ය.

26. (i) සැමට අධ්‍යාපනය ලැබීමේ අයිතිය ඇත. මූලික අධ්‍යාපනයවත් නොමිලේ ලබා දිය යුතු අතර දක්ෂතා පදනම්කරගෙන උසස් අධ්‍යාපනය ලැබීමේ අයිතිය ඇත.
(ii) මානව පෞරුෂය හා ගරුත්වය සුරැකෙන පරිදි අධ්‍යාපනය සකස්විය යුතු අතර එක්සත් ජාතීන්ගේ අරමුණුවලට අනුරූප විය යුත්තේ ය.
(iii) තම දරුවන්ට දිය යුතු අධ්‍යාපනය තීරණය කිරීමේ අයිතිය දෙමාපියන් සතුය.

27. සෑම පුද්ගලයෙකුටම කලාත්මක, තාක්ෂණික හෝ විද්‍යාත්මක නිර්මාණයක් කිරීමටත් එහි පළ බුක්තිවිඳීමටත් අයිතිය ඇත්තේ ය.

28. මෙම ප්‍රකාශනයේ සඳහන් නිදහස හා අයිතිවාසිකම් පරිපූර්ණ කරගත හැකි සමාජ රටාවක් ජාතික හෝ ජාත්‍යන්තර ලෙස ගොඩ නගා ගැනීමේ අයිතිට සැමට ඇත.

29. (i) පුද්ගල පෞරුෂය වර්ධනය වන ලෙස ඉටු කළ යුතු යුතුකම් මාලාවක් සැමට පැවරී ඇත.

(ii) මෙම අයිතිවාසිකම් හා නිදසහ ක්‍රියාත්මකවීමේ සීමාවන් පවතින අතර ඒවා ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක සාමය, පොදු සුබ සිද්ධිය හා ආරක්ෂාව සඳහා අදාල විය යුත්තේ ය. එක්සත් ජාතීන්ගේ ප්‍රතිපත්ති වලට හානි වන අයුරින් මෙම අයිතීන් හා නිදහස ක්‍රියාත්මක නොවිය යුත්තේ ය.

30. මෙම ප්‍රකාශනයෙහි සඳහන්වන කිසිදු අයිතිවාසිකමක් හෝ නිදහසක් වැනසී යන පරිදි අර්ථ නිරූපණයක් හෝ ප්‍රකාශනයක් කිරීමට කිසිදු රාජ්‍යයකට කණ්ඩායමකට හෝ පුද්ගලයෙකුට අයිතියක් නැත. එක්සත් ජාතීන් විසින් ඉතා පැහැදිලි ලෙස මෙවන් මානව අයිතිවාසිකම් ප්‍රකාශනයක් ඉදිරිපත් කොට තිබුණ ද ලොව සියලුදෙනාටම එම අයිතීන් ඒ වූ ආකාරයෙන්ම බුක්තිවිඳීමට ඉඩ සැලසී ඇතැයි නොසිතිය යුතු ය. ඒ ඒ රටවල ක්‍රියාත්මක වන දේශපාලන ක්‍රමයනට අනුව ඔවුන් භුක්තිවිඳින අයිතිවාසිකම්ල ස්වරූපය තීරණය වනු ඇත.

මෙම මානව අයිතිවාසිකම් සර්ව භෞමිකය - අභේද්‍යය - කිසිදු භේදයකින් තොරව සමස්ත ලෝකවාසීන්ටම මෙම අයිතිවාසිකම් පොදුය.

- <u>මූලික අයිතිවාසිකම්.</u>

මූලික අයිතිවාසිකම් යනු රාජ්‍යයන් විසින් පිළිගන්නා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කොට ඇති අයිතිවාසිකම් ය. ඒවා රාජ්‍යයෙන් රාජ්‍යයට වෙනස් වේ. එම නිසා **ඒක භෞමික වේ. භේද්‍යය වේ.** මෙම මූලික අයිතිවාසිකම් වල ස්වභාවය තීරණය වන්නේ ඒ ඒ රාජ්‍යයේ ස්වභාවය මතය. මෙම මූලික අයිතිවාසිකම් ද ගොඩනගා තිබෙන්නේ බොහෝ විට එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය මත පදනම් වෙමිනි.

# යුතුකම්

- <u>යුතුකම් යනු කුමක්දැයි හැඳින්වීම.</u>

  - **යුතුකම් යනු අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී ඉටුකළ යුතු දේ  ලෙස නිර්වචනය කළ හැකිය.**

පුරවැසියා අයිතිවාසිකම් භුක්ති විඳින විට ඉටු කළ යුතු දේ යුතුකම් වේ. යුතුකම් වලින් තොරව අයිතිවාසිකම් හිමි නොවේ. යුතුකම් හා අයිතිවාසිකම් යනු, **එකම කාසියක දෙපැත්තකි.** සාහිත්‍යයමය ප්‍රකාශනයකින් දක්වන්නේ නම්, යුතුකම් හා අයිතිවාසිකම් යනු වෙන් කළ නොහැකි සගයන් දෙදෙනෙකි. ගසට පොත්ත මෙන් පොත්තට ගස මෙන් අන්‍යෝන්‍යය අන්තර් සම්බන්ධතාවයක් මෙම සංකල්පය යුග්මය අතර පවතී. මේ අනුව **අයිතිවාසිකම් වලින් තොර යුතුකම් ද , යුතුකම් වලින් තොර අයිතිවාසිකම් ද අර්ථ විරහිත බව ප්‍රත්‍යක්ෂ වේ.**

**යම් ක්‍රියාවක් කිරීමට හෝ නොකිරීමට ඇති බැඳීම යුතුකම් ලෙස අර්ථකතනය කළ හැකිය.**

යුතුකම් යනු තව දුරටත් විග්‍රහකරන්නේ නම් එය වූ කලී යම් ක්‍රියාවක් කිරීමට ඇති බැඳීම ලෙසද ප්‍රකාශ කළ හැකිය. පොදු සමාජ පැවැත්මේ යහපත්භාවය සඳහා, සුචරිත භාවය සඳහා පුද්ගලයන් විසින් ඉටුකළ යුතු ක්‍රියාවන් නොපිරි හෙළා ඉටු කළ යුතු ය. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් යුතුකම් ඉටු කිරීම තුළින් සමාජයේ සුචරිත භාවය, ආචාර ධර්මීය භාවය සුරක්ෂිත වේ.

**යුතුකම් යනු කුමක්දැයි හඳුනා ගැනීමට භාවිතා කළ හැකි විචාරක මතවාද**

> **"පුද්ගලයෙකු තමා ලබන වැටුපට සරිලන සේවයක් සැලසීමට අපොහොසත් වේ නම් ඔහු ඊට  නුසුදුස්සෙකි. "**
>
> -ලැස්කි-
>
> **"යුතුකම් වලින් තොර අයිතිවාසිකම් සෙවනැලි නොමැති මිනිසුන් බඳුය"**

- <u>යුතුකම් වර්ග කිරීම.</u>




| I | සදාචාරාත්මක යුතුකම් |
|---|---|

*<u>හැඳින්වීම.</u>*

සදාචාරාත්මක යුතුකම් යනු නෛතික පදනමක් නොමැති යුතුකම් ය. සමාජ සදාචාරය, සිරිත් විරිත්, සම්ප්‍රදායන්, ආගම වැනි මූලාශ්‍රයන්ට අනුව පුද්ගලයා විසින් ඉටු කළ යුතු යැයි විශ්වාස කරන යුතුකම් සදාචාරාත්මක යුතුකම් ලෙස සරලව නිර්වචනය කළ හැකිය. සදාචාරාත්මක යුතුකම් සම්බන්ධයෙන් අධ්‍යයනය කරන ශාස්ත්‍රීය විෂය අචාර විද්‍යාවයි.

*ලක්ෂණ.*

1. අචාර විද්‍යාත්මක පදනමක් මත මෙම යුතුකම් නිර්මාණය වී තිබීම.
2. රාජ්‍ය නීති මගින් ආරක්ෂාවක් ලබා දී නොමැති වීම.
3. හොඳයැයි සමාජය විසින් පිළිගත් මූලධරම පද්ධතියක් වීම.
4. මෙම යුතුකම් කඩ කිරීම නිසා සමාජමය වශයෙන් පමණක් දඬුවම් හිමි වීම.

**නිදර්ශන -:** නොසලකා හැරීම, නම් පට බැඳීම , උපහාසයට ලක් කිරීම.

*නිදර්ශන*

1. **දෙමව්පියන්ට සැලකීම.**
2. **ගුරුවරුන්ට සැලකීම**
3. **වැඩිහිටියන්ට සැලකීම**
4. **දූ දරුවන්ට සැලකීම.**
5. **බිරිඳට සැලකීම.**
6. **ස්වාමියාට සැලකීම.**
7. **ආබාධිතයන්ට සැලකීම**
8. **පූජ්‍ය පක්ෂයට ගරු කිරීම**
9. **ස්ත්‍රීන්ට සැලකීම**
10. **ළමයින්ට සැලකීම.**

| **II** | **නීතිමය යුතුකම්.** |
|---|---|

*හැඳින්වීම.*

නෛතික පදනමක් සහිත යුතුකම් නීතිමය යුතුකම් ලෙස අර්ථකතනය කළ හැකිය. නීතිමය යුතුකම් නිර්මාණය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වූ අධිකරණය, ව්‍යවස්ථාදායකය වැනි නෛතික තත්ත්වයක් සහිත මූලාශ්‍රයන් මගිනි. පොදු සමාජ අභිවෘද්ධිය උදෙසා පුද්ගලයන් විසින් ඉටුකළ යුතු යැයි රාජ්‍ය නීතිය විසින් පිළිගත් යුතුකම් මීට අදාළ වේ.

*ලක්ෂණ.*

1. නෛතික පදනමක් මත මෙම යුතුකම් නිර්මාණය වීම.
2. රාජ්‍ය නීති මගින් මෙම යුතුකම් වලට සුරක්ෂාවක් ලබාදී තිබීම.
3. පොදු සමාජයක් යහපත සඳහා අවශ්‍ය යැයි රාජ්‍ය විසින් පිළිගත් මූලධර්ම පද්ධතියක් වීම.
4. මෙම යුතුකම් කඩ කිරීම නෛතිකව දඬුවම් ලැබිය හැකි වරදක් වීම.

**නිදර්ශන -:** දඩ ගැසීම, සිරගත කිරීම. බන්ධනාගාර ගත කිරීම, රාජ්‍ය ද්‍රෝහීන් ලෙස ලේබල් කිරීම.

*නිදර්ශන*

1. **රාජ්‍යයට අවනත වීම.**
2. **රාජ්‍යය මගින් පනවන නීති පිළිගැනීම.**
3. **අය බදු ගෙවීම.**
4. **නීතිය සාමය හා සුබසාධනය පවත්වා ගෙන යාමට රාජ්‍යයට සහාය වීම.**
5. **පොදු දේපළ අයතා ලෙස පරිහරණය නොකිරීම.**
6. **රාජ්‍ය සේවා කාර්යක්ෂමවත්, අවංකවත් ගෞරවනීය ලෙස ඉටු කිරීම.**
7. **රාජ්‍ය ආරක්ෂාව පවත්වා ගෙන යාමට සහාය වීම.**
8. **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගරු කිරීම.**

**(N.B)** *මෙම ආකාරයට සදාචාරාත්මක යුතුකම් හා නීතිමය යුතුකම් ලෙස යුතුකම් ප්‍රධාන කොටස් දෙකකට වර්ග කළ හැකිය. ඇතැම් විට සදාචාරාත්මක යුතුකම් පුද්ගලයන් විසින් ඉටු නොකරන තත්වයන් මත ඒවා නෛතික යුතුකම් බවට පත් කිරීමට රාජ්‍යයන් විසින් සිදු කොට තිබේ. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් ආරම්භක අවස්ථාවේ දී සදාචාරාත්මක යුතුකම් ලෙස පවතින යුතුකම් පසුව නෛතික යුතුකම් බවට පත් කොටගෙන තිබේ.*

නිදර්ශන

සත්ත්ව හිංසනය වැලකීම සදාචාරාත්මක යුතුකම් වුවත් දැන් එය නෛතික යුතුකමත් බවට පත්ව තිබීම.

මව්බිම ආරක්ෂා කිරීම සදාචාරාත්මක යුතුකමකි. නමුත් හදිසි තත්වයකදී මව්බිම රැකීම සඳහා හමුදාසේවය සෑම පුද්ගලයෙකුටම අනිවාර්ය නෛතික යුතුකම් බවට පත් කළ හැකිය.

ප්‍රසිද්ධියේ දුම් පානය නොකිරීම සදාචාරාත්මක යුතුකමකි. නමුත් දැන එය නීතිමයයුතුකමක් බවට පත් කොට තිබේ.

- **යුතුකම් පිළිබඳ රාජ්‍යයන් ව්‍යවස්ථාගත කර ඇති ආකාරයට නිදර්ශන.**

'යුතුකම්' යන මූලධර්මය දේශපාලනික වශයෙන් අතිශයින් වැදගත් සංකල්පයක් වේ. එම නිසා නූතන ජාතික රාජ්‍යයන් තුළ යුතුකම් සම්බන්ධ පරිච්ඡේදයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ගත කොට තිබේ.

නිදර්ශන.

- පැරණි සෝවියට් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.

සෝවියට් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VII වන පරිච්ඡේදයේ සෝවියට් පුරවැසියාගේ අයිතිවාසිකම් හා නන්වැදෑරුම් නිදහස හා යුතුකම් පිළිබඳව විස්තර දක්වා තිබේ. එම ව්‍යවස්ථාවේ 39 - 58 වගන්ති දක්වා මූලික අයිතිවාසිකම් හා නිදහස සම්බන්ධයෙන් විස්තර කරයි. 59 - 60 වගන්ති වලින් පුරවැසි යුතුකම් සම්බන්ධයෙන් විස්තර කරයි.

59 වගන්තිය -: පුරවැසියන්ගේ අයිතිය නන්වැදෑරුම් නිදහස ක්‍රියාත්මක කිරීම. ඔවුන්ගේ යුතුකම් හා බැඳීම් ඉටු කිරීමෙන් වෙන් කළ නොහැකිය.

60 වගන්තිය -: සමාජමය වශයෙන් ප්‍රයෝජනවත් වැඩ කිරීමෙන් මගහැරීම සමාජවාදී සමාජයේ මූලධර්ම හා නොගැලපේ.

61 වගන්තිය -: සමාජවාදී දේපල සුරැකීම, රාජ්‍ය හා සමාජමය අයිතිය යටතේ පවත්නා දේපල අයතා පරිහරණයට සහ නාස්තියට එරෙහිව සටන් කිරීම, ජනතාවගේ සම්පත් අරපිරිමැස්මෙන් යුතුව පාවිච්චි කිරීම සෝවියට් සමාජවාදී සංගමයේ පුරවැසියන්ගේ යුතුම් වන්නේ ය.

තවදුරටත් -: සෝවියට් රාජ්‍යයේ වුවමනාවන් ආරක්ෂා කිරීම, එහි බලය හා ගෞරවය වර්ධනය කිරීම, සමාජවාදී මව් බිම ආරක්ෂා කිරීම, යුධ හමුදාවට සේවය කිරීම ආදී යුතුකම් සෝවියට් පුරවැසියන්ගේ යුතුකම් ලෙස ව්‍යවස්ථා ගත කොට තිබේ.

- ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.

  තුන්වන ලෝකයේ රාජ්‍යයක් වන ඉන්දියාව තුළ ද යුතුකම් සම්බන්ධයෙන් ව්‍යවස්ථා ගත කොට තිබේ. 1950 දී ඉන්දියානු ව්‍යවස්ථාව සම්පාදනය කළේ ය. 1976 දී ඉදිරිපත් වූ 42 සංශෝධනය මගින් මූලික යුතුකම් මාලාවක් ද ව්‍යවස්ථා ගත කරන ලදි.

ඒ අනුව,

- **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අවනත වීම - එමගින් ස්ථාපනය කර ඇති ආයතන වලට ගරු කිරීම- නිදහස සඳහා වූ ජාතික අරගලයට ආධාර වූ ආදර්ශයක් අනුගමනය කිරීම - රාජ්‍යයේ ස්වාධිපත්‍යය එක්සත්කම හා ඒකාග්‍රතාවය ආරක්ෂා කිරීම - ජාතික කොඩියට හා ගීයට ගරු කිරීම - රට ආරක්ෂා කිරීම - අවශ්‍යතාවයන් ඇති වූ ජාතික සේවයන් සඳහා දායක වීම - ආගමික භාෂාමය හා ප්‍රාදේශීය විවිධත්වයක් ඇති විවිධ ජන කොටස් අතර සහෝදරත්වය වර්ධනය කිරීම - පොදු දේපල ආරක්ෂා කිරීම.** මෙම යුතුකම් අතර වැදගත් වේ.

- ශ්‍රී ලංකාව තුළ 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමය.
  (**N.B** 1972 රාජ්‍ය ප්‍රතිපත්ති හා මූලධර්ම බලන්න)

  මෙම ආණ්ඩුක්‍රමය තුළ ද යුතුකම් ව්‍යවස්ථා ගත කොට තිබුණි. රාජ්‍යය විසින් ඉටුකළ යුතු යුතුකම් අතර, **සියලුම පුරවැසියන්ගේ අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳ අවබෝධකර ගැනීම- වැඩ කරන වයසේ සියලුම පුරවැසියන්ට පූර්ණ රැකියා නියුක්තියක් ලබා දීම - සමාජ ඵලය සමානව පුරවැසියන් අතර බෙදා හැරීම - මිනිස් ශ්‍රමය මිනිසා විසින් අයථා ලෙස භාවිතා කිරීම අවසන් කිරීම** ආදිය දක්වා තිබීම.

- 1978 වර්තමාන ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.

  මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ද මූලික අයිතිවාසිකම් නිදහස හා යුතුකම් සම්බන්ධයෙන් ව්‍යවස්ථා ගත කොට තිබේ. ඊට අදාළව, **පුරවැසියාගේ අයිතිවාසිකම් හා යුතුකම් භුක්ති විඳීම පුරවැසියාගේ යුතුකම් හා බැඳීම් වලින් වෙන් කළ නොහැකි බව 28 වන වගන්තියේ දක්වා තිබේ. ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම - ජාතික අභිලාෂයන් හා ජාතික එකමුතු බව ආරක්ෂා කිරීම - පොදු දේපල ආරක්ෂා කිරීම - පොදු දේපල අයථා පරිදි භාවිතය වැලැක්වීම.**

  මෙම ආකාරයට නූතන ජාතික රාජ්‍යයන්හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා තුළට යුතුකම් සම්බන්ධ ව්‍යවස්ථා අන්තර්ත කොට තිබීම ප්‍රධාන ලක්ෂණයක්ව පවතී.

# නිදහස හා සමානාත්මතාවය

**නි** **දහස හා සමානාත්මතාවය**

# නිදහස

- <u>නිදහස යනු කුමක්දැයි හැඳින්වීම.</u>

- **නිදහස යන පදයේ උත්පාදය.**

**Liberty** (ලිබර්ටි) යන ඉංග්‍රීසියානු පදය බිහිවන්නේ ලතින් භාෂාව **Liber** (ලිබර්) යන වාක් සංකේතයනි. **Liber** යන්නෙහි අර්ථය විලංගුවලින් මිදුනා වූ යන්නයි. **Liberty** යනු නිදහසයි.

- **තම පෞද්ගලික ක්‍රියාකාරකම් වර්ධනය කරගනිමින් යහපත් සමාජ ජීවිතයක් ගත කිරීම සඳහා මිනිසාට ඇති අයිතිය නිදහස ලෙස හැඳින්විය හැකිය.**

මිනිසාගේ ජීවිතය අර්ථවත් වීම සඳහා පරිපූර්ණත්වයට පත්වීම සඳහා නිදහස අත්‍යවශ්‍ය අංගයකි. සංක්ෂිප්තව දක්වන්නේ නම් <u>මනුෂ්‍යත්වය පරිපූර්ණ වන්නේ, අර්ථවත් වන්නේ නිදහස ලැබෙන්නේ නම් පමණි.</u> නිදහස නොමැති විට මිනිසා සිරකරුවෙකු හෝ වහලෙකු බවට පත් වේ. මේ අනුව නිදහස යනු මනුෂ්‍යත්වය පරිපූර්ණත්වයට පත් කර ගැනීම සඳහා ඇති අයිතිය වේ.

- **නිදහස හා අයිතිවාසිකම් අතර අන්‍යෝන්‍ය අන්තර් සම්බන්ධයක් පවතී.**

අයිතිවාසිකම් නොමැති නම් නිදහස අර්ථ විරහිත නාම මාත්‍රික දෙයක් බවට පත් වේ. නිදහස තහවුරු වන්නේ අයිතිවාසිකම් පවතින්නේ නම් පමණි. ඒ අනුව නිදහස හා අයිතිවාසිකම් එකම කාසියක දෙපැත්ත බඳුය.

- <u>නිදහස සම්බන්ධයෙන් පලවී ඇති විවිධ නිර්වචන.</u>

**"සදාචාර සුබ සිද්ධිය එක් පදයකින් හකුළුවා දක්වන්නේ නම් ඒ නිදහසයි."**

**-ටී.ඒ. ග්‍රීන්-**

**"මිනිසායට තමන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කරගෙන කටයුතු කළ හැකි පරිදි ඇති වන පරිසරයේ ආරක්ෂා සහිත බව නිදහසයි."**

**-හැරල්ඩ් .ජේ. ලැස්කි-**

**"නිදහස යනු අධිපාලනයේ අනෙක් පැත්තයි"**

**-සර් ජෝන් සිලි-**

**"බාහිර බාධකයන්ගෙන් තොරව පුද්ගලයාට පෞද්ගලිකත්වය වර්ධනය කරගැනීමට ඇති ඉඩ ප්‍රස්ථාව නිදහසයි."**

**-කෝල්-**

- **<u>නිදහස සම්බන්ධයෙන් වැදගත් ඓතිහාසික සංදිස්ථාන.</u>**

වර්තමානයේ පවතින නිදහස ඓතිහාසිකව ලබාගත් ජයග්‍රහණයන්ගේ ප්‍රතිඵලයකි. එම නිසා නිදහස සම්බන්ධ සංවාදය තුළ දී නිදහස සම්බන්ධ ජයග්‍රහණ සන්දිස්ථානයන් ස්මරණය කිරීම වැදගත් වේ.

**N.B** (අයිතිවාසිකම් වලට අදාළ සන්දිස්ථාන මීට අදාළව දක්වන්න.)

1789 - **ප්‍රංශ විප්ලවය**
ප්‍රංශ විප්ලවයේ තේරුම **නිදහස , සහෝදරත්වය, සමානාත්මතාවය හෝ මරණය වේ.**

- **<u>නිදහස තුළ හඳුනාගත හැකි ලක්ෂණ.</u>**

(i) මනුෂ්‍යත්වය පරිපූර්ණත්වයට පත්වීමට අවශ්‍ය වීම.

(ii) අයිතිවාසිකම් සමඟ ඉතා සමීප ඒකාබද්ධතාවක් පැවතීම.

(iii) නිදහස භුක්ති විඳීම සම්බන්ධයෙන් සීමාවන් පැවතීම.

(iv) නිදහස හා සමානාත්මතාවය අතර ඍජු බැඳීමක් පැවතීම.

(v) නිදහස යන සංකල්පය වෙනස් වන සමාජ පරිසර සමඟ අවබෝධ කරගත යුතු වීම.

- **<u>නිදහස යුරෝපීය යුග (අවධි) ඔස්සේ විකාශනය වූ ආකාරය.</u>**

නිදහස නූතන යුගය තුළ වර්ධනය වන <u>පෞද්ගලික වාදය හෙවත් පුද්ගල වාදයේ පරම අගය</u> පදනම් කොට ගෙන (Absolute valuable of individual) උත්පාද වන්නකි. නමුත් නිදහස පිළිබඳ මූලෝත්පාදය ග්‍රීක යුගයේ පෞර රාජ්‍ය ක්‍රමය දක්වා දිවයන්නකි.

**ග්‍රීක යුගය.**

ග්‍රීක යුගයේ දී ඇරිස්ටෝටල් , ප්ලේටෝ ආදී මහා දාර්ශනිකයන් නිදහස ලෙස සැලකුවේ <u>රාජ්‍ය නීතියට අවනත වීමයි.</u> මෙම ග්‍රීක අවධින් තුළ **කණ්ඩායම් (සමූහ / Team)** යන සංකල්පය වැදගත් වූයෙන් පෞද්ගලික නිදහස පිළිබඳ සංකල්පය ඉස්මතු වීමේ අවකාශයක් නොපැවතුණි. නමුත් පෞර රාජ්‍යය බිඳවැටීමෙන් පසුව ඇති වූ අධිරාජ්‍ය අවධියේ දී පෞද්ගලික නිදහස සම්බන්ධ අවධානය ලක්විය. **ස්ටොයික් වාදීන් (Stoics) හෙවත් උපේක්ෂතා දර්ශනය** විසින් ඊට අදාළ මතවාදීමය පෝෂණය ලබාදුනි. ඔවුන් නිදහස අර්ථ දැක්වූයේ <u>"මිනිසාට තම පෞද්ගලිකත්වය වර්ධනය කරගැනීම සඳහා අවශ්‍ය කොන්දේසි සපුරාගැනීමට ඇති හැකියාවය" යනුවෙනි.</u> නමුත් මෙම පෞද්ගලික නිදහස සංකල්පයේ බීජ ප්‍රරෝහණය වූයේ නැත.

**රෝම යුගය**

රෝම යුගයේ දී නිදහස සම්බන්ධ සංවාදය මියැදුන එකක් බවට පත්විය. අධිරාජයාගේ අසහාය , අත්තනෝමතික , ඒකාධිපති පාලන ක්‍රමයන් තුළ පුද්ගලයන්ට නිදහස හිමි වූයේ නැත.

**මධ්‍යතන යුගය.**

මධ්‍යතන යුගය තුළ දෙවියන්වහන්සේ වෙනුවෙන් ජනතාව කැපවිය යුතු ය. දෙවියන් - පල්ලිය - බයිබලය - පාප්තුමා වැනි ආගමික මූලාශ්‍ර මාර්ගයෙන් පුද්ගල නිදහස අවශෝෂණය කොට ගෙන තිබුණි.

**නූතන යුගය.**

මධ්‍යතන යුගය අවසාන කාර්තුව (පශ්චාත් මධ්‍යතන යුගය) තුළ පල්ලිය ප්‍රතික්ෂේප කරමින් ගොඩ නැගුණු ක්‍රිස්තියානි ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය (රෙපරමාදු ව්‍යාපාරය - ප්‍රොතෙස්තන්ත්‍ර ව්‍යාපාරය) මගින් පල්ලියේ බලය දිය කර හැරීමේ ව්‍යාපෘතිය ආරම්භ කොට තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස නූතන පුනර්ජීවන විප්ලවය සිදු විය. ඒ හරහා නිදහස සම්බන්ධ සංවාදය නූතන යුගය තුළ උත්පාද විය. අනෙක් පසින් ධනවාදී අර්ථක්‍රමය උත්පාද විය. දේශපාලනික වශයෙන් ලිබරල්වාදය උත්පාද විය. ඒ හරහා පුද්ගලයන්ගේ පෞද්ගලික නිදහස සම්බන්ධයෙන් අවධානය යොමු කළේ ය. ඊට අදාළව අවධානය යොමු කළ කරුණු,

- ස්වාමියෙකුගේ පාලනයට යටත් නොවූ ස්වාධීනව කටයුතු කළ හැකි පෞද්ගලික නිදහස.
- පල්ලියේ පාප්තුමාගේ බලයෙන් වියුක්ත වූ ආගමික නිදහස.
- වැඩවසම් ආර්ථික බද්ධතාවයෙන් තොර නිදහස් වෙළඳ පොළ සහ නිදහස් ව්‍යවසායත්වය පිළිබඳ නිදහස.
- අසහාය බලැති රාජාණ්ඩු පාලන ක්‍රමවලින් මිදුණු දේශපාන නිදහස.

මෙම ආකාරයට නූතන අවධිය වන විට පුද්ගල නිදහස හෙවත් කේවල පෞද්ගලිකත්වයේ පර අගය උච්ච ස්ථානයකට පැමිණ තිබුණි. **ජොන් ලොක්** ලෙවියාතන් (levyathan) කෘතිය මගින් පුද්ගලයාඋපතින්ම ජීවිතය, දේපල, නිදහස පිළිබඳ අයිතීන් ඇතිව උපදින බවද, **චාල්ස් මොන්ටෙස්ක්‍යු** නීතයේ සාරය (Sprit of low) මගින් බලතල බෙදීමේ න්‍යාය ඉදිරිපත් කරමින් පාලක බලතල අවම කළ යුතු බවට තර්ක කළේ ය. **ඇඩම් ස්මිත්** ජාතීන්ගේ ධනය (welth of nation) නැමති ලියවිල්ල මගින් ආර්ථික කටයුතු වල නිරතවීමට පුද්ගලයන්ට නිදහ තිබිය යුතු බවත් රාජ්‍ය ආර්ථිකයට අවමව සම්බන්ධ විය යුතු බවටත් තර්ක කරමින් පුද්ගල නිදහසට අදාළ මතවාදීමය පෝෂණය ගොඩනැන්විය.

## ● නිදහස සම්බන්ධයෙන් විවිධ දේශපාලන න්‍යායන් පලකර ඇති අදහස්.

**ලිබරල් වාදී න්‍යාය.**

නිදහස අත්‍යවශ්‍ය මූලධර්මයක් ලෙස පිළිගනී. රාජ්‍යයේ අරමුණ වන්නේ නිදහස ස්ථාපනය කිරීමයි. විශේෂයෙන් පුද්ගලයාගේ පෞද්ගලික නිදහස සම්බන්ධයෙන් අවධානය යොමු කරයි. **දේශපාලනික ආර්ථික, සාමාජයීය, සංස්කෘතික** ආදී සෑම මානයකම නිදහස සම්බන්ධයෙන් ලිබරල්වාදීන් උනන්දුවෙයි. පුද්ගල නිදහස ආරක්ෂා කිරීම සඳහා **සම්භාව්‍යය අවධි තුළ** නීතිය හා සාමය ක්‍රියාවට නැන්වූව ද **නූතන අවධිය** වන විට නීතිය හා සාමයට අමතරව සුබසාධනය ක්‍රියාවට නැන්විය. **නව යුගය** වන විට අවම රාජ්‍යය සංකල්පය කරා ගමන් කළද එහි අරමුණ වන්නේ ද පුද්ගල නිදහසයි.

**සමාජවාදී න්‍යාය.**

සමාජවාදීන්ගේ මතයට අනුව ලිබරල් ක්‍රමයක නිදහස යනු ධනේෂ්වරයේ ආරක්ෂාව - පැවැත්ම නඩත්තු කරන උපකරණයකි. මෙම මතයට අනුව ධනේෂ්වර ක්‍රමයක් තුළ නිදහස යනු ධනපතීන්ට (දේපල හිමියන්ට) පමණක් හිමිවන නිදහස වේ. සමාජවාදීන්ට අනුව සැබෑ පූර්ණ නිදහස හිමිවන්නේ පෞද්ගලික දේපළ ක්‍රමය නිශේධනය කළ රාජ්‍යය නොමැති විද්‍යාත්මක කොමියුනිස්ට් සමාජය තුළදී ය.

**ෆැසිස්ට්වාදී මතය.**

ෆැසිස්ට්වාදීන්ට අනුව පුද්ගලයාට නිදහස දිනා ගැනීමට හැකි වන්නේ රාජ්‍යයට අවනත වූ තරමටය. ඒ අනුව රාජ්‍යයට අවනතවීම නිදහස ලෙස ඔවුන් විග්‍රහ කරයි.

- <u>නිදහස සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති මත.</u>
(නිදහසේ ප්‍රභවය සම්බන්ධ මතවාදය)

නිදහස සම්බන්ධයෙන් ඉදිරිපත්වී ඇති මත ප්‍රධාන කොටස් දෙකක් යටතේ අධ්‍යයනය කළ හැකිය.

| | | | |
|---|---|---|---|
| **I.** | ප්‍රතිශෝධාත්මක නිදහස | - | කිසිදු ආකාරයකින් සීමාවකට හෝ බැඳීමකට ලක් නොවූ අසීමිත නිදහසක් පිළිබඳ මෙම මතයේ අර්ථය |
| **II.** | ප්‍රතිජානාත්මක නිදහස | - | නිදහස යනු නිරපේක්ෂ දෙයක් නොව සමස්ත සමාජයේ පොදු අභිවෘද්ධිය උදෙසා පවතින සාපේක්ෂ දෙයක් බව මින් ප්‍රකාශිතය. එම නිසා එයට සීමාවන්, බැඳීම් පැවතිය හැකිය. |

- <u>ප්‍රතිශේධාත්මක නිදහස.</u>

- ප්‍රතිශේධාත්මක නිදහස යනු කිසිදු බාධා කිරීමක් හෝ සීමා කිරීමක් රහිත නිදහස පිළිබඳ තත්ත්වයකි. නිදහස පරිපූර්ණ වන්නේ එය අසීමාන්තිකව භුක්ති විඳින විට පමණි.

- සෑම පුද්ගලයකුටම තමන්ට වෙන් වූ තමන්ගේ ක්ෂේත්‍රයක් (වපසරියක්) පවතී. එම ක්ෂේත්‍රය සමස්ත සමාජයෙන් වෙන්ව පවතී. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් මිනිසුන් පෞද්ගලිකව ගත් විට තාර්කිකය බුද්ධිමත්ය, විචාර ශීලිය, ස්වකීය පෞද්ගලික ආශාවන් අභිප්‍රායන් කුමක් ද යන්න ඔවුන් පෞද්ගලකිව දනී. ස්වකීය පෞද්ගලිකත්වය වර්ධනය කර ගැනීම සඳහා අසීමාන්තික නිදහසක් අවශ්‍ය වේ.

- රාජ්‍යය හෝ සමාජය පුද්ගලයාගේ කටයුතු වලට මැදිහත් නොවිය යුතු ය. සෑම පුද්ගලයෙකුටම ස්වකීය පෞද්ගලිකත්වය වෙනුවෙන් ක්‍රියාත්මක වීමට පෞද්ගලික නිදහසක් පැවතිය යුතු ය. ඒ අතරින් <u>අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, සංවිධානය වීමේ නිදහස</u> වඩාත් උත්කෘෂ්ට වන්නේ ය.

- පෞද්ගලික යහපත හා සමාජමය යහපත අතර වෙනසක් හෝ ගැටීමක් නොමැත. යම් පුද්ගලයෙකු ස්වකීය පෞද්ගලික යහපතට කටයුතු කරන විට එමගින් සමාජමය යහපත ද ඉෂ්ට වේ. එම නිසා පෞද්ගලික යහපත සහ සමාජමය යහපත අතර අධි සාම්‍යතාවක් පවතී.

- ස්වකීය කාර්යයන් සිදුකර ගැනීමට නිදහස දුන්විට පෞද්ගලික යහපත මෙන්ම සමාජමය අභිවෘද්ධිය ස්ථාපනය වේ. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් පෞද්ගලික අභිවෘද්ධිය හා සමාජමය අභිවෘද්ධිය අධි සාම්‍යතා සහිත සංකල්ප යුග්මයකි.

- සමාජය කෙරෙහි බලපාන මානව ක්‍රියාකාරකම් පාලනය කිරීම සඳහා පමණක් රාජ්‍ය මැදිහත් විය යුතු ය. නමුත් එම මැදිහත් වීම අත්‍යවශ්‍ය අවස්ථාවේ දී පමණක් ඉතා අවමව සිදු කිරීමට රාජ්‍යය වග බලා ගත යුතු ය.

- රාජ්‍යය පනවන නීති මගින් පෞද්ගලික නිදහස උලල්ංඝණය නොවිය යුතු ය. රාජ්‍යයේ ඒකායන අරමුණ බවට පත්විය යුත්තේ සමාජමය අභිවෘද්ධිය , යහපත සලකා පෞද්ගලික යහපත ඉදිරියට මෙහෙයවීමයි.

- මෙවැනි සීමාකිරීම් වලින් තොර නිදහසක් සම්බන්ධ එනම් <u>ප්‍රතිශේධාත්මක නිදහස සම්බන්ධ මතවාදය උත්පාද වන්නේ</u> අත්තනෝමතික ආණ්ඩුවල අනවශ්‍ය ආකාරයේ සීමාවන්ගෙන් නිදහස්වීමට පුද්ගලයා අරගල කරන අවධියේ ය.

- ප්‍රතිශේධාත්මක නිදහස සම්බන්ධ මතවාදය ගොඩනැගු සහ පෝෂණය කළ දාර්ශනිකයින්. ජේ.එස්. මිල් - තෝමස් හොබ්ස් - ජොන් ලොක් - ටොකුවිල් - ජෙෆර්සන් - එඩ්මන් බර්ක් - ඇඩම් ස්මිත් - මිල්ටන් හිඩ්මන්

**ජේ.එස්. මිල්**

මිල් විසින් නිදහස (On liberty) යන කෘතිය තුල දී ප්‍රකාශ කළේ **ස්වයං ආරක්ෂාව සඳහා පමණක් පුද්ගලයාට පෞද්ගලිකව හෝ සාමූහිකව අන්‍යන්ගේ නිදහස කෙරෙහි සම්බන්ධ විය හැකි බවයි.** එසේම අන්‍යයන්ට වන හානිය වැළැක්වීම සඳහා සිවිල් සමාජයේ ඕනෑම පුද්ගලයෙකුගේ කැමැත්තට එරෙහිව බලය යෙදවිය හැක්කේ ද මෙම හේතුව (ස්වයං ආරක්ෂාව) සඳහා පමණක් බව ඔහු තවදුරටත් දක්වයි.

**එෆ්.ඒ. හෙයක් (F.A Hayek)**

**හෙයක් ට අනුව ප්‍රතිජානාත්මක නිදහස යනු නියම නිදහස නොවේ.** එය නිදහස මෙන් හඳුන්වන පදයක් පමණි. සරලව දක්වන්නේ නම් ප්‍රතිජානාත්මක නිදහස යනු මිත්‍යාවකි. මොහුට අනුව පුද්ගලයෙකුගේ නිදහස පිළිබඳ තීරණාත්මක වන්නේ ඔහුගේ කැමැත්තය.

- **<u>ප්‍රතිජානාත්මක නිදහස.</u>**

- **ප්‍රතිජානාත්මක නිදහස යනු කිසියම් සීමාවක් හා බාධා කිරීම් සහිත නිදහසකි.** ඒ අනුව නිදහස අසහාය එකක් නොවේ. එය භුක්ති විඳිය හැක්කේ දේශපාලන, ආර්ථික, සමාජයීය කොන්දේසි වලට යටත්ව ය.

- **නිදහස සම්පූර්ණ වීම සඳහා අයිතිවාසිකම් තිබිය යුතු ය.** නිදහස පරිපූර්ණත්වයට පත් වන්නේ අයිතිවාසිකම් හිමිවන්නේ නම් පමණි. තවදුරටත් යුක්තිය, සමානාත්මතාවය, සදාචාර සමඟ නිදහස කිට්ටු සම්බන්ධතාවක් පවතී.

- **පෞද්ගලික නිදහස අනිවාර්යයෙන්ම සමාජ අභිවෘද්ධිය සමඟ එකට ගමන් කළ යුතුය.** වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් පෞද්ගලික නිදහස ඍජුව සමාජමය අභිවෘද්ධිය ඉලක්ක කර ගත්තක් විය යුතුය.

- **නිදහස ස්ථාපනය කිරීම රජයේ යුතුකම වේ.** සියලු දෙනාටම නිදහස පරිපූර්ණත්වයට පත් කර ගැනීමට අදාළ පරිසරය ගොඩ නැගීම රාජ්‍යයේ මූලික ආධ්‍යාශය විය යුතු ය. මෙහි දී බහුතරයේ නිදහස සඳහා සුළු තරයේ නිදහස සීමා කිරීමට ඇතැම්විට සිදුවිය හැකිය.

- **නිදහස තුළ අන්තර්ගත මූලික අරමුණ මිනිසා සමාජ ජීවියෙකු ලෙස වර්ධනය කිරීමයි.** එම නිසා සමාජ ජීවින් නොවන මිනිසුන්ට නිදහස අහිමිකළ යුතු ය.

- <u>ප්‍රතිජානාත්මක මතය උත්පාද වීමට හේතු වන්නේ</u> කිසිදු සීමාවකින් හෝ බාධාවකින් තොරව භුක්ති විඳින නිදහස විනාශයට හේතු වීමයි. මෙය ප්‍රතිශේධාත්මක මතයට ප්‍රතිවිරුද්ධව නිර්මාණය වූ විරෝධතා ව්‍යාපාරයක් ලෙසය ද හැඳින්විය හැකිය.

- <u>ප්‍රතිජානාත්මක නිදහස සම්බන්ධ මතවාදය ගොඩ නැගු සහ පෝෂණය කළ දාර්ශනිකයන්.</u> රූසෝ , හෙගල් , ටී. එච්. ග්‍රීන් , අර්නස්ට් බාර්කර් , ලැස්කි

**එර්නස්ට් බාර්කර්.**

බාර්කර් ගේ විග්‍රහයට අනුව **නිදහස කිසියම් සීමාවක් තුළ භුක්ති විඳිය යුතු ය.** නිදහසට නෛතික වශයෙන් පනවන සීමාවන් පමණක් ප්‍රමාණවත් නොවන බව දක්වන බාර්කර් එයට සමාජයීය සීමාවන් ද පැවතිය යුතු බව අනාවරණය කරයි.

- **ප්‍රතිශේධාත්මක හා ප්‍රතිජානාත්මක මතවාද දෙක අතර ඇති වෙනස්කම්.**

| ප්‍රතිශේධාත්මක නිදහස | ප්‍රතිජානාත්මක නිදහස |
|---|---|
| ○ කිසිදු ආකාරයක බාදා කිරීමක් හෝ සීමා කිරීමකින් තොර නිදහසක් සම්බන්ධයෙන් විශ්වාසය තැබීම. | ○ නිදහස පරිපූර්ණත්වයට පත් වන්නේ යම් යම් සීමාවලට යටත් කළ පසුව යැයි පිළිගැනීම. නිදහස සීමාවට යටත්ව භුක්ති විඳිය යුතු බව විශ්වාස කිරීම. |
| ○ රාජ්‍යය පෞද්ගලික නිදහසේ පසමිතුරෙකු වේ. | ○ නිදහස පැවතීමට අදාළ සමාජ පරිසරය ගොඩ නැගීම සඳහා රාජ්‍යය අත්‍යවශ්‍ය බව පිළිගනී. නිදහස හා රාජ්‍යය සගයන් වේ. |
| ○ නිදහස හා සම්බන්ධ පෞද්ගලික තත්ත්වයන් කෙරෙහි අවධානය යොමු කිරීම. | ○ නිදහස හා සම්බන්ධ සමාජමය තත්ත්වය කෙරෙහි අවධානය යොමු කිරීම. |
| ○ නිදහස හා සමානාත්මතාවය යුක්තිය ප්‍රතිවරුද්ධ එකිනෙකට සාම්‍ය නොවන සංකල්ප බව ප්‍රකාශ කරයි. | ○ නිදහස හා සමානාත්මතාවය යුක්තිය එකිනෙකට සාමාන්‍යවන බව පිළිගනී. |
| ○ නිදහස සම්බන්ධයෙන් රාජ්‍යයට සතු වන්නේ ඉතාම අවම භූමිකාවකි. | ○ නිදහස සම්බන්ධයෙන් රාජ්‍යයට අදාළ විශාල භූමිකාවක් පවතී. |
| ○ නිදහස පුද්ගලයාගේ පෞද්ගලිකත්වයේ නෛසර්ගික ගුණාංගයක් ලෙස අර්ථ දක්වයි. | ○ නිදහස සලකා බලන්නේ සමාජයට සාපේක්ෂවය. ඒ මත එහි ස්වභාවය තීරණය වේ. |
| ○ මෙම මතය උත්පාද වන්නේ අත්තනෝ--මතික රාජාණ්ඩු පාලන තුළ අනවශ්‍ය ආකාරයට පුද්ගලයාට කරන බලපෑම් වලින් නිදහස් වීමේ අවශ්‍යතාවය මතය. | ○ මෙම මතය උත්පාද වන්නේ කිසිදු බාධාවක් හා සීමාවකින් තොර නිදහස විනාශයට හේතුවීම නිසාය. |
| ○ තෝමස් හොබ් - ජොන් ලොක් - ජේ.එස්. මිල් - ඇඩම් ස්මිත් - ටොකුවිල් - ජෙෆර්සන් - එඩ්මන් බර්ක් ආදීහු ඉදිරිපත් කරයි. | ○ රූසෝ - හෙගල් - ටී.එච්. ග්‍රීන් - අර්නස්ට් බාර්කර් - ලැස්කි ආදීහු ඉදිරිපත් කරයි. |

ප්‍රතිශේධාත්මක නිදහස හා ප්‍රතිජානාත්මක නිදහස යන මතවාද දෙක උක්ත පරිදි විග්‍රහ කළ හැකිය. මෙම මතවාද දෙකෙන් වඩාත් ප්‍රායෝගිකත්වයට සමීප මතවාදය වන්නේ ප්‍රතිජානාත්මක නිදහස සම්බන්ධ මතවාදයකි.

- **නිදහස වර්ගීකරණය.**

(i) ස්වාභාවික නිදහස (ii) සිවිල් නිදහස

(iii) දේශපාලන නිදහස (iv) ආර්ථික නිදහස

| I | ස්වාභාවික නිදහස |
|---|---|

කිසිදු ආකාරයකින් සීමාවට යටත් නොවූ අසහාය අසීමිත පෞද්ගලික නිදහසක් මෙමගින් අවධාරණය කරයි. ඇතැම් විචාරකයන් මෙය හඳුන්වා ඇත්තේ "කැලෑ නිදහස" ලෙසිනි. ඇතැමුන් "වල්බූරු නිදහස" ලෙස ද මෙය හඳුන්වා තිබේ. මෙවැනි නිදහසක් සිවිල් සමාජයේ පැවතිය නොහැකිය. මෙවැනි නිදහසක් පැවතිය හැක්කේ කිසිදු පාලනයක් නොමැති අනධිකාරී තත්ත්වයක් තුළ පමණි. එවැනි තත්ත්වයක් තුළ සමාජ ප්‍රගතිය හෝ අභිවෘද්ධිය ස්ථාපනය නොවේ. මෙවැනි නිදහසක් පැවතිය හැක්කේ ස්වාභාවික සමාජය (ප්‍රකෘති සමාජය) ක පමණි.

තෝමස් හොබ්ස් ප්‍රකාශ කරන්නේ සිවිල් සමාජය ස්ථාපිත කිරීමත් සමඟ නිරායාසයෙන්ම ස්වාභාවික නිදහසක් නැති වූ බවයි.

රූසෝ ප්‍රකාශ කරන්නේ මිනිසා සමාජ සම්මුතියට එළඹීමත් සමගින් ස්වාභාවික නිදහස නැතිවී යන බවයි. මිනිසා නිදහස්ව ඉපදුන ද සෑම තැනම විලංගු වලින් බැඳ දමා ඇතැයි රූසෝ ප්‍රකාශ කළේ ය.

| II | සිවිල් නිදහස |
|---|---|

මැදිහත් වීම් හා බාධා කිරීම් වලින් තොරව පෞද්ගලික ක්‍රියාකාරකම් වර්ධනය කර ගනිමින් යහපත් සමාජ ජීවිතයක් ගෙන යාමට මිනිසාට තිබිය යුතු සමාජ ඉඩ ප්‍රස්ථාව සිවිල් නිදහස ලෙස අර්ථකතනය කළ හැකිය. තවදුරටත් සාමාජීය අයිතිවාසිකම් භුක්තිවිඳීමට ඇති අයිතිය සිවිල් නිදහස ලෙස විග්‍රහ කළ හැකිය.

(i) **ජීවත්වීමේ නිදහස.**

(ii) **පෞද්ගලික නිදහස.**

(iii) **නීතිය ඉදිරියේ සමානාත්මතාවය.**

(iv) **පුද්ගලික දේපල ආරක්ෂාව.**

(v) **කථා කිරීමේ හා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස.**

(vi) **හෘදය සාක්ෂියට එකඟව කටයුතු කිරීමේ නිදහස.**

(vii) **කැමති ආගමක් ඇදහීමේ නිදහස.**

(viii) **කීර්ති ප්‍රශංසා ලැබීමේ නිදහස.**

(ix) **සමානාත්මතාවය පිළිබඳ නිදහස.**

(x) **සංවිධානය වීමේ නිදහස.**

(xi) **පවුල් ජීවිතයක් ගත කිරීමේ නිදහස.**

(xii) **සෞඛ්‍ය අධ්‍යාපනය ලැබීමේ නිදහස.**

සිවිල් සමාජයක් තුළ මෙම සිවිල් නිදහස භුක්ති විඳීමට සිදුවන්නේ යම් යම් **සීමාවලට** යටත්වයි. නිදර්ශනයක් ලෙස දක්වන්නේ නම් **අදහස් ප්‍රකාශ කිරීමට නිදහස පැවතිය ද අසත්‍යය ප්‍රකාශ , අපහාසමය ප්‍රකාශන** කිරීමේ නිදහස නොමැත. සිවිල් නිදහස නොමැති තත්ත්වයක් තුළ පෞද්ගලිකත්වය වර්ධනය කර ගැනීමට නොහැකිය.

## III දේශපාලන නිදහස.

මැදිහත්වීම් හා බාධා කිරීම් වලින් තොරව සක්‍රීය ලෙස දේශපාලන ක්‍රියාකාරකම් වල යෙදීමට ඇති ඉඩ ප්‍රස්ථාව, අයිතිය දේශපාලන නිදහස ලෙස අර්ථකතනය කළ හැකිය. තවදුටත් දේශපාලන අයිතිවාසිකම් ලබාගැනීමය ඇති අයිතිය දේශපාලන නිදහස ලෙස විග්‍රහ කළ හැකිය. ඇතැම් විචාරකයන් මෙය ව්‍යවස්ථානුකූල නිදහස ලෙස ද නම් කරයි.

(i) **ඡන්දය ප්‍රකාශ කිරීමට ඇති නිදහස.**

(ii) **නියෝජිතයකු ලෙස තේරීපත්වීමට ඇති නිදහස.**

(iii) **තමන් කැමති දේශපාලන දර්ශනයක් දැරීමට ඇති නිදහස.**

(iv) **පක්ෂ පිහිටුවීමට ඒ වෙනුවෙන් කටයුතු කිරීමට ඇති නිදහස.**

(v) **පවතින ආණ්ඩු විවේචනය කිරීමේ නිදහස.**

(vi) **සාමකාමීව ආණ්ඩු පෙරලා දැමීමේ නිදහස.**

(vii) **දුක් ගැනවිලි ඉදිරිපත් කිරීමේ නිදහස.**

(viii) **රජයේ රැකියාවක් කිරීමේ නිදහස.**

මෙම දේශපාලන නිදහස ද **සීමාවන්ට** යටත්ව භුක්ති විඳීමට සිදුවේ. **නිදර්ශනයක්** ලෙස දක්වන්නේ නම් **ඡන්ද බලය සෑම අයෙකුටම හිමි නොවේ.** උන්මත්තකයන්ට, බාල වයස් කරුවන්ට, බංකොලොත් වූවන්ට, පුරවැසිභාවය අහිමි වූවන්ට , බරපතල අපරාධකරුවන්ට

දේශපාලන නිදහස පවතින්නේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන සමාජයෙක් පවතින රාජ්‍යයක පමණි. ලැස්කි දක්වන ආකාරයට දේශපාලන නිදහස භුක්ති විඳීම සඳහා පැවතිය යුතු කොන්දේසි 03 කි.

(i) *සමාන අධ්‍යාපනයක් ලබා ගැනීම සඳහා සෑම පුරවැසියෙකුටම ඉඩ ප්‍රස්ථාවන් පැවතීම.*

(ii) *සමාජය තුළ එක් සමාජ පංතියකට අනෙක් සමාජ පංතිය ඉක්මවා ගිය විශේෂ වරප්‍රසාදනොතිබීම.*

(iii) *නිදහස් හා අපක්ෂපාති ජනමාධ්‍යයක් පැවතීම.*

| IV | ආර්ථික නිදහස |
|---|---|

මැදිහත්වීම් හා බාධා කිරීම් වලින් තොරව සක්‍රීයව ආර්ථික ක්‍රියාවලියේ නියෙළීමට ඇති ඉඩ ප්‍රස්ථාව ආර්ථික නිදහස ලෙස අර්ථකතනය කළ හැකිය. තවදුරටත් , ආර්ථික අයිතීන් ලබාගැනීමට ඇති අයිතිය ආර්ථික නිදහස ලෙස විග්‍රහ කළ හැකිය. උක්තව දැක්වූ සිවිල් නිදහස හා දේශපාලන නිදහස නිසි පරිදි භුක්ති විඳීම සඳහා අත්‍යාවශ්‍යයෙන්ම ආර්ථික නිදහස තිබිය යුතු ය.

> "තම පැවැත්ම සහතික කර ගැනීම සඳහා සාධාරණ ඉපයීමක් කිරීමට ඇති අයිතිය හා එහි සුරක්ෂිතතාව ආර්ථික නිදහස වේ." -ලැස්කි-

(i) වැඩ කිරීමට නොකර සිටීමට ඇති නිදහස.

(ii) රැකියාවක් වෙනුවෙන් සාධාරණ වැටුපක් ලැබීමේ නිදහස.

(iii) සාධාරණ වැඩ පැය ගණනක් ලබාගැනීමේ නිදහස.

(iv) වැඩ කරන කාලය අතරතුර නිදහස ලබා ගැනීමේ අයිතිය.

(v) දේපල පවත්වා ගැනීමේ නිදහස.

(vi) ලෙඩ රෝග, අනතුරු, වයස් ගත වීම් වැනි අවස්ථාවල දී වන්දි හා විශ්‍රාම ලබා ගැනීමේ නිදහස.

(vii) සේවා වියුක්ති අවස්ථාවන්හි දී දීමනාවක් ලබා ගැනීමේ අයිතිය.

(viii) ආර්ථිකමය අසාධාරණකම් වල දී සාමකාමී ලෙස උත්සෝෂණ පැවැත්වීමේ නිදහස.



මෙම ආර්ථික අයිතිවාසිකම් ද සීමාවන්ට යටත්ව භුක්ති විඳීමට සිදුවේ. නිදර්ශන ලෙස පුරවැසියන් ලෙස සේවානියුක්තිකයින් ලබාගන්නා නිදහස සම්බන්ධයෙන් සේවා යෝජකයන් එකගවිය යුතු වීම. රැකියාවක් කිරීමට නිදහස ඇතත් ඕනෑම වෘත්තියක් කිරීමට නිදහස නොමැතිවීම. විශේෂයෙන් බොහෝ රාජ්‍යයන්හි ගණිකා වෘත්තිය ආර්ථික නිදහස තුළ නීතිමය වශයෙන් පිළිනොගැනීම.

| V | ගෘහ නිදහස. |
|---|---|

පවුල් ජීවිතය පිළිබඳ ක්ෂේත්‍රයට අදාළ ගෘහ නිදහස මූලික වශයෙන් සමාජ විද්‍යාත්මක සංකල්පයක් ලෙස හඳුනාගත හැකිය. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් වර්ධනය හා ව්‍යාප්තිය සමග නිදහස පිළිබඳ සංවේදීතාවයන් පවුල තුලට ද පැමිණ තිබේ.

(i) භාර්යාවට තමා සතු දේපල අයත්කර ගැනීමේ නිදහස, වන්දි ලබා ගැනීම, කමාගේම ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා නිදහස තිබීම.
(ii) ස්වාමියාගෙන් අතවර සිදුවන විට පෞද්ගලික ආරක්ෂාව ලබා ගැනීම සඳහා නීතිය ඉදිරියේ පෙනී සිටීමේ නිදහස.
(iii) නීතියට අනුව ගිවිසුමකින් විවාහය ස්ථාපනය කිරීම.



මෙම ගෘහ නිදහසට ද සීමාවන් පවතී. එම සීමා බොහෝ විට සංස්කෘතික හැඩයක් විෂද කරයි. නිදර්ශන ලෙස ස්ත්‍රිය පුරුෂයාට යටත්ව පැවතිය යුතු බව, භාර්යාව සිදු කළ යුතු දේ නොකළ යුතු දේ ස්වාමියා තීරණය කිරීම, ඉතාලියේ නාසි ව්‍යාපාරය තුළ ස්ත්‍රියට හිමිකර දුන් විෂය වපසරිය පල්ලිය - මුලුතැන්ගෙය - දරුවන් පමණි. මුස්ලිම් සංස්කෘතියක් සහිත අරාබියානු කලාපය ක්‍රියාත්මක මුස්ලිම් නීතිය යටතේ ස්ත්‍රී නිදහස අර්ථවිරහිත වීම, ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් තුළ වුවද ස්ත්‍රියගේ නිදහස සංස්කෘතික සීමාවන්ගෙන් අවරෝධනයට ලක් කොට තිබේ.

- **<u>නිදහස හා අධිකාරිය (බලය).</u>**

නිදහස සම්බන්ධ සංවාදය තුළ දී නිදහස හා අධිකාරී බලය අතර ඇති සම්බන්ධය පිළිබඳ සටහන් තැබීම ද වැදගත් වේ.

නිදහස යනු -: පුද්ගලයාගේ පෞද්ගලිකත්වය වර්ධනය කර ගැනීමට ඇති අයිතිය හෙවත් ඉඩප්‍රස්තාවයි.

අධිකාරිය යනු -: රාජ්‍ය බලය, අධිකාරී බලය - ස්වාධිපත්‍ය බලය ලෙස හැඳින්විය හැකිය. රාජ්‍යය සතු බලය ක්‍රියාවට නගනු ලබන්නේ ආණ්ඩුව විසිනි. **පොලීසිය හා සිවිල් සේවය** ඒ සඳහා යොදා ගනී. තවදුරටත් හිරගෙවල් - පොලීසිය - බන්ධනාගාර - එල්ලුම්ගහ - පෝරක ආදිය ද ඒ සඳහා භාවිතා කරයි.

නිදහස හා අධිකාරිය අතර පවතින සම්බන්ධතාවය පිළිබඳ පොදු මතයක් දේශපාලන විද්‍යාව තුළ හඳුනාගත නොහැකිය. නමුත් ඒ සම්බන්ධයෙන් ප්‍රධාන මතවා ද 02 ක් පවතී.

1. **නිදහස හා අධිකාරිය නොසැසඳේ (අනුපූරක නොවේ.)**

2. **නිදහස හා අධිකාරිය සැසඳේ (අනුපූරක වේ.)**

- **<u>නිදහස හා අධිකාරිය නොසැසඳේ</u> ( අනුපූරක නොවේ.)**

අධිකාරී බලය පවතින විට නිදහස නොපවතී යන මතය අධිකාරිය හා නිදහස අනුපූරක නොවේ යන්නෙන් අර්ථවත් වේ. මෙය නිදහස හා අධිකාරිය අතර **සෘණාත්මක (-) මතය වේ.** මෙම මතයෙන් ප්‍රකාශ වන්නේ අධිකාරිය නිදහස සඳහා අත්‍යවශ්‍ය බාධකයක් වශයෙනි. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් පුද්ගලයාට නිදහස හිමි වන්නේ පාලනයක් නොමැති අනධිකාර තත්ත්වයක දී බව මෙම මතයෙන් ප්‍රකාශ වේ. මෙය **<u>ප්‍රතිශේධාත්මක මතවාදය තහවුරු කරන විග්‍රහයක් ලෙස ද හඳුනාගත හැකිය</u>.**

**නිදහස හා අධිකාරිය නොසැසෙඳන බව ඉදිරිපත් කරන මතවාදයන්ට නිදර්ශන.**

නිදර්ශන -: **මාක්ස්වාදී විග්‍රහය**
**අනධිකාරවාදීන්**

**<u>මාක්ස්වාදීන්</u>** ප්‍රකාශ කරනු ලබන්නේ නිදහස හා අධිකාරිය නොගැලපෙන බවයි. අධිකාරිය තුල නිදහස හිමි වන්නේ දේපල හිමි සුළු පිරිසකට පමණක් බව මාක්ස්වාදීන්ගේ මතය වේ. එම නිසා ඔවුන්ට අනුව පුද්ගල නිදහස අර්ථවත් වන්නේ රාජ්‍යය නොමැති විද්‍යාත්මක කොමියුනිස්ට් සමාජය තුළ පමණි.
**(N.B රාජ්‍ය tute එක මාක්ස්වාදී විග්‍රහය බලන්න)**

<u>අනධිකාරවාදීන්ට</u> අනුව රාජ්‍යය කුමන ස්වරූපයකින් පැවතුන ද එය මුළුමනින්ම නරකයක් ලෙස සලකා රාජ්‍යයට හා එහි අධිකාරී බලයට කොන්දේසි විරහිතව විරුද්ධ වීම අනධිකාරවාදීගේ ප්‍රධාන ලක්ෂණයකි. අනධිකාරවාදීන්ගේ <u>පරමාදර්ශය වන්නේ</u> **කිසිඳු ආකාරයක බලය පදනම් කර නොගත් නිදහස් පාලන ක්‍රමයකි.** අනධිකාරවාදීන්ට අනුව මිනිස් ජීවිතය පරිපූර්ණත්වයට පත්වන්නේ මිනිසා සෑම ආකාරයකම පාලන තත්වයන්ගෙන් නිදහස් වූ විටය. මේ අනුව බලන කළ නිදහස හා අධිකාරිය නොසැසඳේ. <u>අනධිකාරවාදීන්ට අනුව මිනිස් නිදහස සීමා කරන ප්‍රධාන සමාජය සංස්ථා තුනකි</u>. ඒ වූ කලී රාජ්‍යය - **පෞද්ගලික දේපල** - ආගම වේ. <u>රාජ්‍යය දෙවියන් වහන්සේ හා ධනවතා යන බැඳීම් වලින් මුදා ගැනීම අනධිකාර වාදීන්ගේ අදහස විය.</u> අනධිකාරවාදීන් ලෙස , **ප්‍රෝදෑන් - බකුනින් - ක්‍රොපොටොනික් - විලියම් ගොඩ්වින් - තෝමස් හොජස්කින්** දැක්විය හැකිය.

■ <u>නිදහස හා අධිකාරිය සැසඳේ.</u> **(අනුපූරක වේ)**

නිදහස හා අධිකාරිය සැසඳෙන බව ලෝකය තුළ ජනප්‍රිය මතවාදය වේ. මෙම මතවාදයට අදාළ න්‍යායික පදනම ගොඩනගනු ලබන්නේ ලිබරල්වාදීන් විසිනි.මෙය **ප්‍රතිජානාත්මක නිදහස පිළිබඳ මතවාදය ස්ථාපනය කරන විග්‍රහයක් ලෙස ද හඳුනා ගත හැකිය.** <u>නිදහස හා අධිකාරිය අතර ධනාත්මක (+) විග්‍රහය වන්නේ මෙයයි.</u> නිදහස හා අධිකාරිය සැසඳේ යන්නෙහි අදහස වන්නේ නිදහස ආරක්ෂා කිරීම සහ පවත්වා ගෙන යාම සඳහා අධිකාරිය අත්‍යවශ්‍ය බවයි. අධිකාරියකින් තොරව නිදහස පවත්වා ගැනීම සහ සුරක්ෂිත කිරීම කළ නොහැකිය.

නිදර්ශන -: <u>යම් ස්ත්‍රියකට අතවරයක් උනායැයි අපි සිතමු.</u> එවිට ඇයගේ පෞද්ගලික නිදහට හානි වී තිබේ. එම පැමිණිල්ල පොලීසිය හරහා අධිකරණය වෙත ඉදිරියට ඉදිරිපත් කළ විට වරද කරුවන්ට දඬුවම් ලබා දේ. මෙසෙල අධිකාරී බලය පොදු මහජන තාවගේ නිදහස ආරක්ෂා කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.

යම් අපරාධ කරුවකු යම් පුද්ගලයෙකුගේ දේපළ සොරකම් කලා යැයි සිතමු. එවිට එම පුද්ගලයාගේ ආර්ථික නිදහස උල්ලංඝණය වී තිබේ. එම පුද්ගලයා පොලීසිය මගින් අධිකරණයට එම පැමිණිල්ල ඉදිරිපත් කරයි. මෙම ආකාරයට අධිකාරියකින් තොරව නිදහස ස්ථාපනය කළ නොහැකි බව ලිබරල්වාදී මතය වේ.

**නිදහස හා අධිකාරිය සැසඳේ යන මතවාදයට තහවුරු කළ මතවාදයන්ට නිදර්ශන.**

නිදර්ශන -: නූතන ලිබරල්වාදීන්
**(N.B. රාජ්‍ය tute එකේ ලිබරල්වාදී විග්‍රහ බලන්න)**

මෙම ආකාරයට පුද්ගල නිදහස ආරක්ෂා කිරීම සඳහා රාජ්‍යය අධිකාරිය අත්‍යවශ්‍ය බව මෙම මතයෙන් ප්‍රකාශ වේ. <u>ලැස්කි</u> ප්‍රකාශ කළේ **එක් අයකුගේ අත ඇති සැරයටිය අනෙකාගේ නාසය ලගින් කෙලවර වේ යනුවෙනි.**

● <u>නිදහස ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති විධි විධාන.</u>
**(N.B** - මෙම තත්ත්වයන් අයිතිවාසිකම් වලට අදාළව විස්තර කොට තිබේ.)

(i) **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවලට මූලික අයිතිවාසිකම් ප්‍රකාශන ඇතුලත් කිරීම.**

(ii) **නීතියේ ආධිපත්‍යය පවත්වාගෙන යාම.**

(iii) **ආර්ථික සාධාරණත්වය.**

(iv) **නිදහස් ජනමාධ්‍යය**

(v) **අධිකරණය ස්වාධීන කිරීම.**

(vi) **නිදහස සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම.**

(vii) **මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශන.**

(viii) **මානව හිමිකම් පිළිබඳ කොමිෂන් සභා.**

(ix) **ඔම්බඩ්ස්මන් වැනි ධූර ස්ථාපනය කිරීම.**

(x) **රාජ්‍ය ප්‍රතිපත්ති හා මූලධර්ම ව්‍යවස්ථා ගත කිරීම.**

# සමානාත්මතාවය.

- <u>සමානාත්මතාවය යනු කුමක්දැයි හැඳින්වීම.</u>

සමානාත්මතාවය යනු සරලව දක්වන්නේ නම් <u>සැමට සමාන අයිතිවාසිකම් (හිමිකම්) , ඉඩප්‍රස්ථාවන් (නිදහස) ලබා දීමයි.</u> සමානාත්මතාවය යන සංකල්පය තුලින් සෑම පුද්ගලයන්ම සමාන කිරීමක් පිළිබඳ සඳහන් නොවේ. එය කළ නොහැක්කක් මෙන්ම, එසේ කිරීම යුතු ද නැත.

<u>සමානාත්මතාවය යනු "සමාන අවස්ථාලාභය" ලෙස සාමාන්‍යයෙන් නිර්වචනය කෙරේ.</u> සමාන අවස්ථාලාභය හුදෙක් නීතිමය අසමානාත්මතාව පමණක් නොවේ. අශක්නුතාවය නොපැවතීමත් හැකියාවන්ට ඉඩ ප්‍රස්ථාවන් තිබීමත් මත සමාන අවස්ථා ලාභයේ පැවැත්ම රඳා පවතී. එනම් සමාජයේ සෑම සාමාජිකයෙකුටම ස්වභාව ධර්මයෙන් ලැබුණු හැකියාවන් යොදමින් ඉහළම තැනට පත්වීමට අවස්ථාව තිබිය යුතු ය. රාජ්‍යය ඊට අයත් සාමාජිකයන්ගේ අයිතිවාසිකම් තහවුරු නොකළහොත් දුප්පතුන්ට සමාන අවස්ථාලාභය අහිමි වී යා හැකිය. <u>සමාජයේ ශ්‍රේෂ්ඨයැයි සැලකෙන කණ්ඩායමකට හෝ ධනවතුන්ට වරප්‍රසාද ලබාදීමත් ස්ත්‍රී පුරුෂ භාවය හෝ ආගම් අනුව ස්විශේෂී කණ්ඩායමකට අශක්නුතා පැනවීමත් සමාන අවස්ථා ලාභයට පටහැනිය. එසේ වුවත් සමාජ, ආගමික හෝ වාර්ගික කොටසකට විශේෂ වරප්‍රසාද ලබා දීම සමාන අවස්ථා ලාභයකට පටහැනියැයි තර්ක කළ නොහැකිය.</u> එයට හේතුව එම කොටස් සමාජීය වශයෙන් හෝ ආර්ථික වශයෙන් අවාසි සහගත කණ්ඩායම් ලෙස සමාජය තුළ පෙනී සිටීමයි. <u>හැම දෙනෙකුගේම ධනය සමාන තත්වයකට ගෙන ඒම ද සමාන අවස්ථාලාභය ලෙස සැලකිය නොහැකිය.</u> ස්වභාවයෙන්ම මිනිසා අසමානය යන කරුණ මීට හේතුවයි.

ඇරිස්ටෝටල් - "මිනිසුන්ගේ වෙනස්කම් ස්වභාවයෙන්ම ඇතිව තිබේ. එම නිසා කෙනෙකු පාලකයෙකු වේ. කෙනෙකු පාලිතයෙකු වේ."

ප්ලේටෝ - "ස්වාභාවික අසමානතාවයන් පවතින නිසා පුද්ගලයන් විවිධ රැකියාවලට සුදුසු වේ."

<u>ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයට අනුව සමනාත්මතාවය යන්නෙන් කරුණු තුනක් ඇගවෙන බව දක්වයි.</u> එම කරුණ ද සමානාත්මතාවය යන සංකල්පය අවබෝධ කර ගැනීම සඳහා භාවිතා කළ හැකිය.

i. සමාන ආත්ම ගෞරවය හෝ තත්වය හෝ වරප්‍රසාද තිබීම.
ii. බලය, හැකියාව සහ සාක්ෂාත් කර ගත හැකි දේවල් පිළිබඳව සමානාත්මතාවයක් තිබීම.
iii. සාධාරණාත්වය හා අපක්ෂපාතීත්වය පැවතීම.

හැරල්ඩ්.ජේ.ලැස්කි <u>විසින් ද සමානාත්තාවය තුළ අඩංගු විය යුතු ලක්‍ෂණ තුනක් විග්‍රහ කරයි.</u> සමානාත්මතාවය යනු කුමක්දැයි හඳුනාගැනීම සඳහා එය භාවිතා කළ හැකිය.

i. කිසිදු ආකාරයක විශේෂීකරණයක් හෝ සැලකිල්ලක් හෝ වරප්‍රසාදයක් හෝ පුද්ගලයාගෙන් පුද්ගලයාට නොපවැතීම.

ii. සමාන ඉඩප්‍රස්ථාවන් හිමිකර ගැනීමට සියලු දෙනාටම සමාන අයිතියක් තිබීම.

iii. ආර්ථික හිමිකම් සමානව ලබා ගැනීමට ඇති හැකියාව.

- <u>සමානාත්මතාවය සම්බන්ධයෙන් පළවී ඇති නිර්වචන.</u>

"නිදහස සහතික කිරීමේ කොන්දේසි මාලාව සමානාත්ම තාවයයි"

-ලැස්කි-

"අන්‍යයන්ට සහිතික කර ඇති අයිතීන් සියල්ල ඒ ආකාරයෙන්ම මට හිමි වීම සමානාත්ම තාවයයි."

-අර්නස්ට් බාකර්-

- <u>සමානාත්මතාවය පිළිබඳ ස්වරූප දෙකකින් අදහස් පළවී තිබේ.</u>

1. සමානාත්මතාවය පිළිබඳ ප්‍රතිශේධාත්මක (Positive) මතය.
2. සමානාත්මතාවය පිළිබඳ නිශේධනාත්මක (Negative) මතය.

- <u>සමානාත්මතාවය පිළිබඳ ප්‍රතිශේධාත්මක මතය.</u>

ප්‍රතිශේධාත්මක අර්ථයෙන් සමානාත්මතාවය යනු හැමදෙනාටම ප්‍රමාණවත් අවස්ථා ලාභ සලසා දීමයි. ප්‍රමාණවත් අවස්ථා ලාභ යනු සමාන අවස්ථාලාභ සලසාදීම යනුවෙන් ද අර්ථකථනය කළ හැකිය.

- <u>සමානාත්මතාවය පිළිබඳ නිශේධනාත්මක මතය.</u>

නිශේධනාත්මක සමානාත්මතාවය යනු විශේෂ වරප්‍රසාද නොතිබීමයි. එනම් ආගම - කුලය - වර්ගය - වර්ණය - ස්ත්‍රී පුරුෂ භාවය - ධනය වැනි කෘත්‍රිම සාධක මත විශේෂ වරප්‍රසාද ලබා නොදීමයි. එම කෘත්‍රිම සාධක මත වෙනස්කම් නොසැලකීම නිශේධනාත්මක සමානාත්මතාවය වේ.

- <u>සමානාත්මතාවය සම්බන්ධයෙන් වැදගත් සංදිස්ථාන.</u>

සමානාත්මතාවය පිළිබඳ සංකල්පය වඩාත් සංයුක්ත තලයතින් සාකච්ඡාවට බඳුන්වන්නේ නූතන අවධිය තුළය.

- 1776 ඇමරිකානු නිදහස් ප්‍රකාශනය.
  "**සියලුම මිනිසුන් සමාන ආකාරයෙන් මවා ඇත**" යනුවෙන් මෙම ප්‍රකාශනය තුළ සටහන් කළේ ය.

- 1789 ප්‍රංශයේ මිනිසා සහ පුරවැසියාගේ අයිතිවාසිකම් ප්‍රකාශනය.
  **"සියලුම මිනිසුන් නිදහසේ උත්පත්තිය ලැබූ අතර ආත්ම ගෞරවය හා අයිතිවාසිකම් සම්බන්ධයෙන් සමානාත්මතාවයක් භුක්ති විඳී."**

- <u>සමානාත්මතාවය සම්බන්ධයෙන් දේශපාලන න්‍යායන් ගේ අදහස්.</u>

ලිබරල්වාදී න්‍යාය.

සමානාත්මතාවය පිළිබඳ සංකල්පය පිළිගනී. විශේෂයෙන් නූතන අවධිය තුළ සමානාත්මතාවය පිළිබඳ මූලධර්මය ඉදිරියට පැමිණෙන්නේ ලිබරල්වාදී අදහස් සමගිනි. නීති මගින් සමානාත්මතාවය ඇති කළ හැකි බව ලිබරල්වාදීන්ගේ මතයයි.

**සමාජවාදී න්‍යාය.**

ධනේශ්වර ක්‍රමයක් තුළ සමානාත්මතාවය මිත්‍යාවක් බව ඔවුන් දක්වයි. ලිබරල් ධනේශ්වර ක්‍රමයක නිදහස යනු දේපළ හිමි ධනපතියන්ගේ උපකරණයක්ම පමණි. විද්‍යාත්මක කොමියුනිස්ට් සමාජය තුළ පෞද්ගලික දේපළ නිශේධනය කිරීමෙන් ලබන නිදහස පූර්ණ නිදහසක් බව මාක්ස්වාදීන් ප්‍රකාශ කරයි.

**ෆැසිස්ට්වාදීන්.**

සමානාත්මතාවය බැහැර කරයි. ෆැසිස්ට්වාදීන්ට අනුව සමානාත්මතාවය අර්ථ ශූන්‍යවේ. ෆැසිසිට් ක්‍රමයක් තුළ වැදගත් වන්නේ බලය පමණි. අයිතිවාසිකම් නොමැත. පුරවැසියන්ට ඇත්තේ යුතුකම් පමණි. රාජ්‍යයට අවනත වීම වැදගත්ම යුතුකමයි. අයිතිවාසිකම් නිදහස නොමැති තත්ත්වයක් තුළ සමානාත්මතාවය අර්ථ විරහිතය.

**අනධිකාරවාදීන්.**

සමානාත්මතාවය යනු **සමාන රැකියා - සමාන පරිභෝජනය - සමාන අවස්ථා ලාභය** පැවතීම වේ.

- <u>සමානාත්මතාවය තුළ හඳුනාගත හැකි ලක්ෂණ (ගුණාංග)</u>

(i) පුද්ගලයන් විශේෂිකරණයකට භාජනය නොකිරීම.

(ii) සමාන ඉඩප්‍රස්ථාවන් සියලු දෙනාටම හිමිකරදීම.

(iii) සියලු දෙනාටම සමාන අයිතිවාසිකම් හිමිකරදීම.

(iv) සමානාත්මතාවය ඇති කිරීම සඳහා අසීමිත නිදහස කිසියම් ප්‍රමාණයකට සීමා කිරීමට සිදු වීම.

- <u>නිදහස හා සමානාත්මතාවය අතර සම්බන්ධය.</u>

නිදහස හා සමානාත්මතාවය සම්බන්ධයෙන් දේශපාලන විද්‍යාව තුළ විවිධ මතවාද පවතී. ඒ අතර වඩාත් සුප්‍රසිද්ධ මතවාද යුග්මයකි.

1. **නිදහස හා සමානාත්මතාවය එකිනෙකට නොගැලපේ.** **(අනුපූරක නොවේ)**
2. **නිදහස හා සමානාත්මතාවය එකිනෙකට සම්බන්ධ වේ.** **(අනුපූරක වේ.)**

□ <u>නිදහස හා සමානාත්මතාවය එකිනෙකට නොගැලපේ.</u>

නිදහස හා සමානාත්මතාවය එකිනෙකට විරුද්ධ, නොගැලපෙන සංකල්ප යුග්මයකි. මෙම මතය **ටොක්විල් , ඇක්ටන් සාමි** ආදීහු දැඩිව දරයි. මොවුන්ගේ තර්කය වන්නේ <u>සමානාත්මතාවය සම්බන්ධ ආශාව නිදහස පිළිබඳ බලාපොරොත්තුව සුන් කරන බවයි.</u> වර්තමානය තුළ ඇතැම් ලිබරල් චින්තකයින් විසින් <u>පොදු සුබසාධනයේ නාමයෙන් රාජ්‍යයේ කටයුතු ව්‍යාප්ත කිරීම අනුමත නොකරයි. එය සමාජමය සමානාත්මතාවය ඇති කිරීම සඳහා පෞද්ලික නිදහස අතුගාදැමීමක් ලෙස ඔවුන් විශ්වාස කරයි</u>.

*නිදහස හා සමානාත්මතාවය පිළිබඳ හැඟීම එකිනෙකට නොගැලපෙන බවට ඉදිරිපත් ව ඇති තර්ක.*

- සමානාත්මතාවය පිළිබඳ හැඟීම තුලින්ම නිදහස පිළිබඳ බලාපොරොත්තුව හීන කිරීම.

- නිදහස යම් ප්‍රමාණයකින් කප්පාදු නොකොට සමානාත්මතාවය ස්ථාපනය කළ නොහැකි වීම.

- නිදහස ස්ථාපනය කරන විට සමානාත්මතාවය කප්පාදු වීම. සාමානාත්මතාවය ස්ථාපනය කරන විට නිදහස සීමා වීම.

- නිදහස හා සමානාත්මතාවය එකිනෙකට ගැළපේ.

නිදහස හා සමානාත්මතාවය එකිනෙකට ගැලපෙන සාම්‍යතා සහිත සංකල්ප යුග්මයකි. ලිබරල්වාදී චින්තකයන් වන හොබ් හවුස් - ටෝනි ආදීහු නිදහස හා සමානාත්මතාවය සාම්‍යතා සහිත සංකල්ප බව පැහැදිලි කරයි. **සමානාත්මතාවයෙන් තොර නිදහස එතරම් වැදගත් නොවන බව හොබ් හවුස්ගේ** මතය වේ. **ටෝනි** ප්‍රකාශ කරනු ලබන්නේ **විශාල ප්‍රමාණයක සමානතාවයක් පැවතීම නිදහසට හානි කර දෙයක් බව මෙතෙක් පෙන්නුම් කළත්** එය ඊට අවශ්‍ය බව විශ්වාස කරයි.

*නිදහස හා සමානාත්මතාවය එකිනෙකට ගැළපෙන බවට ඉදිරිපත් වී ඇති තර්ක.*

- සමානාත්මතාවයකින් තොරව නිදහස ස්ථාපනය කිරීමට නොහැකි බව.

- අසීමිත නිදහස හා අසහාය නිදහස පුද්ගලයන් අතර තුළනය කළ නොහැකි ආකාරයේ ආර්ථික , දේශපාලන , සාමාජීය වෙනස්කම් ඇති වීම කෙරෙහි බලපායි. එම නිසා අසිමිත නිදහස සීමා කොට සමානාත්මතාවය ස්ථාපනය කළ යුතු ය.

- සමානාත්මතාවය හා නිදහස එකිනෙකට ගැලපේ. එසේ නොගැපෙන්නේ යැයි තර්ක කළ හැක්කේ අසීමිත නිදහසක් අපේක්ෂා කරන්නේ නම් පමණි. නමුත් නූතන ජාතික රාජ්‍යයන් තුළ ඇත්තේ සීමාවන්ට යටත් නිදහසකි. ඒ තුළ සමානාත්මතාවය නිදහසට අවරෝධකයක් නොවේ.

- සමානාත්මතාවය යන්නෙන් අසහාය සමානාත්මතාවයක් අදහස් නොකෙරේ. පුද්ගලයන්ගේ ස්වයං වර්ධනය සඳහා අවශ්‍ය වන ආර්ථික හා සමාජ තත්වයන් ප්‍රමාණවත් ලෙස ලබා ගැනීමට හැකි වන පරිදි පුද්ගල නිදහස පාලනය සමානාත්මතාවය යන්නෙන් අර්ථවත් වේ.

## සමානාත්මතාවය වර්ග කිරීම.

| I. | ස්වාභාවික සමානාත්මතාවය |
|---|---|

ස්වාභාවික සමානාත්මතාවය යනු ස්වභාව ධර්මය අනුව සියලුම මිනිසුන් සමානය යන පිළිගැනීම වේ. උපේක්ෂතා දාර්ශනිකයින් වන සිසරෝ, පොලිබීසියස් ආදීහු මෙම ස්වාභාවික සමානාත්මතාවය පිළිබඳ මතය පිළිගනී. එමෙන්ම ක්‍රිස්තියානි පල්ලියේ අදහස් ද ස්වාභාවික සමානාත්මතා සංකල්පයට සාම්‍ය වේ. **කිතුනු දර්ශන වාදීන් දෙවියන්ගේ වීරත්වය හා - මිනිසාගේ සහෝදරත්වය** යන අදහස් දෘඪව ප්‍රකාශ කළේ ය. කාල් මාක්ස් විසින් ද ස්වාභාවික සමානාත්මතාව සංකල්පයට පක්ෂව කරුණු ඉදිරිපත් කළේ ය. නමුත් එවැනි සමානාත්මතාවක් ඇති කළ හැක්කේ විද්‍යාත්මක කොමියුනිස්ට් සමාජය තුළ බව ඔහු ප්‍රකාශ කළේ ය.

ස්වාභාවික සමානාත්මතාවයට පටහැනිව කරුණු ඉදිරිපත් කළ දාර්ශනික න්‍යායදරයන් පිරිසක් ද දේශපාලන විද්‍යාව තුළ සිටී. "ප්ලේටෝට" අනුව ස්වභාවයෙන්ම මිනිසුන් අසමාන වේ. එම් නිසා ඔවුන් විවිධ වෘත්තීන්ට සුදුසු වේ. ඇරිස්ටෝටල් ප්‍රකාශ කළේ උත්පත්තියේ දී මිනිසුන් වෙනස්කම් ඇතිකරගෙන තිබේ. එම නිසා කෙනෙකු පාලකයකු වේ. කෙනෙකු පාලිතයෙකු වේ.

| II. | සාමාජයීය (සිවිල්) සමානාත්මතාවය. |
|---|---|

සාමාජයීය වශයෙන් පවතින සමානාත්මතාවය සාමාජීය සමානාත්මතාවය යන්නෙන් අර්ථවත් වේ. **නීතිය ඉදිරියේ සමානාත්මතාවය පිළිගෙන ඇති රාජ්‍යයන්හි සාමාජයීය සමානාත්මතාවය ස්ථාපනය වී තිබේ.** සාමාජීය සමානාත්මතාවය ඇතිවීම සඳහා සමාන අයිතිවාසිකම් හිමි විය යුතු ය.

| III. | දේශපාලන සමානාත්මතාවය. |
|---|---|

රාජ්‍යයක පුරවැසියන්ට පාලන කටයුතු වලට සහභාගී වීමට සමාන අයිතියක් තිබීම දේශපාලන සමානාත්මතාවය ලෙස හැඳින්විය හැකිය. දේශපාලන සමානාත්මතාවය ක්‍රියාත්මක නොවන විට **කැරලි** - **අරගල** - **උද්ඝෝෂණ** - **විප්ලව** - **ත්‍රස්තවාදය** උත්පාද විය හැකිය. දේශපාලන සමානාත්මතාවය පැවතීම සඳහා දේශපාලන අයිතීන් හිමි විය යුතු ය.

| IV. | ආර්ථික සමානාත්මතාවය. |
|---|---|

ආර්ථික ක්ෂේත්‍රයේ පවතින සමානාත්මතාවය ආර්ථික සමානාත්මතාවය ලෙස සරලව නිර්වචනය කළ හැකිය. ආර්ථික සමානාත්මතාවය හිමිවීම සඳහා ආර්ථික අයිතිවාසිකම් පුද්ගලයාට හිමිවිය යුතු ය.

# නීතිය හා නීතියේ ආධිපත්‍යය

**නී** **තිය හා නීතයේ ආධිපතිත්වය.**

# නීතිය

- <u>නීතිය යනු කුමක්දැයි හැඳින්වීම.</u>

දේශපාලනය හා නීතිය අතර පවතින්නේ නොබෙදිය හැකි ඉතා සමීප සම්බන්ධතාවයකි. දේශපාලන බලය කේන්ද්‍ර වී තිබෙන්නේ රාජ්‍යය නැමති සංවිධානය මතය. රාජ්‍යය යනු නෛතික සංවිධානයකි. එම නිසා නීතිය හා දේශපාලනය අතර සෘජු සම්බන්ධතාවයක් පවතී.

<u>"සංවිධානය වූ සමාජයක් තුළ මිනිසුන්ගේ සමාජ පැවැත්ම පාලනය කිරීම සඳහා අධිකාරී බලය පදනම් කොටගෙන රාජ්‍යය මගින් පනවන රෙගුලාසි පද්ධතිය නීති යන්නෙන් අදහස් වේ."</u> සමාජයේ පුද්ගල හැසිරීම් නීතිය උපයෝගී කරගෙන පාලනය කිරීමට හැකිව තිබෙන්නේ රාජ්‍යය සතු අධිකාරී බලය හෙවත් ස්වාධිපත්‍යය බලය නිසාය. රාජ්‍යය ස්වකීය අරමුණු ඉෂ්ඨකර ගැනීම සඳහා භාවිත කරන මාධ්‍ය නීති වශයෙන් හැඳින්විය හැකිය. එම නිසා රාජ්‍යයේ අත්‍යවශ්‍ය මූලධර්මයක් බවට නීතිය පත්ව තිබේ.

**"සියලුම සත්ත්වයන් අතරින් උසස්ම සත්ත්වයා මිනිසාය. නමුත් නීතියෙන් හා යුත්යෙන් ඔහු වෙන් කළ විට සියලු සත්ත්වයන් අතරින් නරකම සත්ත්වයා බවට පත්වේ."**

-ඇරිස්ටෝටල්-

<u>මිනිසුන්ගේ සමාජ හැසිරීම් පාලනය වන්නේ රාජ්‍යය මගින් පනවන නීති මගින් පමණක් නොවේ.</u> සමාජය විසින් යහපත් යැයි පිළිගත් **සිරිත් විරිත් - හොඳ නරක - සම්ප්‍රදායන් - සංස්කෘතිය - චාරිත්‍ර වාරිත්‍ර** - ආගම වැනි ආචාර ධර්මය පදනමක් සහිත මූලාශ්‍රයන් ද මානව චර්යාවන් පාලනය වීම සඳහා හේතු වේ. නමුත් දේශපාලන විද්‍යාවේ දී නීති ලෙස සලකනු ලබන්නේ මිනිසාගේ භෞතික හැසිරීම් පාලනය කිරීම සඳහා රාජ්‍යය විසින් පනවනු ලබන නීති පමණි.

- <u>නීතිය සම්බන්ධයෙන් පලවී ඇති නිර්වචන.</u>

"ආශාවන්ගෙන් බලපෑම් නොලත් තාර්කික බුද්ධිය නීතියයි. නැතිනම්, තාර්කික බුද්ධියේ උත්තරීතර ප්‍රතිඵලය නීතියයි."

-ඇරිස්ටෝටල්-

"නීතිය යනු රාජ්‍යය අධිකාරියේ සහයෝගය ලැබූ සුවිශේෂී වූද විධිමත් වූද නොවෙනස් වන රීතීන් සහිත ඉතා හොඳින් ගොඩ නැගුන සිතුවිලි හා පුරුදු සමුදායකි"

-විල්සන්-

"යුක්තිය පරිපාලනය කිරීම සඳහා රාජ්‍යය මගින් පනවනු ලැබූ සහ ක්‍රියාවට නංවන රෙගුලාසි පද්ධතිය නීති වේ."

-සලමන්ඩ්-

"නීතිය යනු ස්වාධිතිගේ අඥාවයි." -තෝමස් හොබ්ස්-

"අධිකාරී බලය පදනම් කොට ගෙන පුරවැසි චර්යාවන් පාලනය කිරීම සඳහා රාජ්‍යය මගින් ක්‍රියාවට නගන රෙගුලාසි වේ."

-සෝල්ටු-

- **නීතිය සතු ලක්ෂණ (ගුණාංග)**

(i) **නීති වූ කලී රාජ්‍යයේ අධිකාරී බලය පදනම් කොට ගෙන පවතින්නක් වීම**. මේ අනුව නීතිවල සක්‍රීය විධිමත් ක්‍රියාකාරීත්වයක් ක්‍රියාත්මක වන්නේ සිවිල් සමාජයක් තුළ පමණි.

(ii) **නීති මිනිසාගේ සමාජ හැසිරීම් හා ක්‍රියාකාරීත්වය පාලනය කිරීමේ අරමුණින් පනවා තිබීම.** විවිධාකාර ගතිගුණ වලින් සහ ක්‍රියාකාරකම්වලින් හෙබි ලක්ෂ සංඛ්‍යාත මිනිසුන් සහිත සමාජය පාලනය කරනු ලබන්නේ නීති මගිනි. නමුත් නිතිය මගින් පාලනය කළ හැක්කේ මිනිසුන්ගේ භාහිර ක්‍රියාකාරීත්වය පමණි. මිනිසුන්ගේ අභ්‍යන්තර සිතුම් පැතුම් හෙවත් මනෝභාවයන් පාලනය කිරීමට නීතියට නොහැකිය.

(iii) **නීති කඩ කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් වීම**. නීති පනවනු ලබන්නේ රාජ්‍යයේ අධිකාර බලය පදනම් කොට ගනිමිනි. එම නිසා නීති උල්ලංඝණය කිරීම දඩ ගැසීම - සිරගතකිරීම - බන්ධනාගාර ගත කිරීම - මරණ දණ්ඩනය ආදී දඬුවම් විදීමට හේතු විය හැකිය.

(iv) **නීති පොදු සමාජ යහපත අරමුණු කොට ගෙන පැනවිය යුතු වීම**. රාජ්‍ය විසින් නීති පැනවිය යුත්තේ ඍජුවම පොදු යහපත අරමුණු කොට ගෙන මිස පුරවැසියන්ගේ නිදහස සීමා කිරීම අරමුණු කොට ගෙන නොවේ.

(v) **නීති ඉතා නිරවුල්ව හා නිශ්චිතව පැහැදිලිව දැක්විය යුතු වීම.** නීතිය ඉතා නිරවුල්වත් නිශ්චිතවත් පැහැදිලිවත් දැක්විය යුතුමය. ඊට හේතුව වන්නේ රාජ්‍ය පාලන කටයුතු සිදු කරනු ලබන්නේ නීති පදනම් කොටගෙන වීමයි. නීති අපැහැදිලි වීම, අවුල් වීම නිශ්චිතව දක්වා නොතිබීම වැනි තත්ත්වයන් මත රාජ්‍ය පාලනය අවිධිමත් සහ අකාර්යක්ෂම විය හැකිය.

(vi) **වෙනස්වන සමාජ ආශාවන් සහ අවශ්‍යතාවයන් අනුව නීති වෙන්විය යුතු වීම.** නීතිය තුළ පැවතිය යුතු වැදගත්ම ගුණාංගය ලෙස මෙය හඳුනාගත හැකිය. නීතිය නියත ලෙසම අවශ්‍යතා හා ආශාවන් මත වර්ධනය විය යුතුම ය. එසේ නොවන්නට සමාජ සංවර්ධනයට නීතිය අවරෝධකයක් වේ.

- **නීතිය සම්බන්ධයෙන් දේශපාලන න්‍යායන් විසින් පලකර ඇති අර්ථ විවරණ.**

**ලිබරල්වාදී න්‍යාය.**
පාලන කටයුතු සඳහා අයිතිවාසිකම් හා යුතුකම් සමානාත්මතාවය ස්ථාපනය කිරීම සඳහා නීතිය අත්‍යවශ්‍ය බව පිළිගනී. (මෙම තත්වයන් විස්තර කරන්න.)

**මාක්ස්වාදී න්‍යාය.**
නීතිය යනු, දේපළහිමියන්ගේ ආරක්ෂාව සඳහාත් දේපළ අහිමීන් සූරාකෑම සඳහාත් භාවිතා කරනු ලබන උපකරණයකි. (මෙම තත්වයන් විස්තර කරන්න.)

- **නීතිය සම්බන්ධ විවිධ ප්‍රවේශ.**

1. ස්වභාව ධර්මයානුකූල ප්‍රවේශය.
2. විශ්ලේෂණාත්මක ප්‍රවේශය.
3. ඓතිහාසික ප්‍රවේශය.
4. සමාජ විද්‍යාත්මක ප්‍රවේශය.
5. මාක්ස්වාදී ප්‍රවේශය.

- **ස්වභාව ධර්මයානුකූල ප්‍රවේශය.**

ස්වභාවධර්මයානුකූල ප්‍රවේශයේ සරල සංක්ෂිප්ත අර්ථය වන්නේ නිතිය ස්වභාව ධර්මයාගේ නිර්මාණයක් වේය යන්නයි. සමාජයේ ක්‍රියාත්මක වන සෑම නීතියකටම ප්‍රභවය ස්වාභාවික නීතිය වන බවත්, එම ස්වාභාවික නිතිය ලෝකයේ සෑම රටකටම පොදු වන්නක් බවත් මෙම ගුරුකුලයේ අදහස වේ. මෙම ගුරුකුලයට **ප්ලේටෝ** , **ඇරිස්ටෝටල්** , **සිසරෝ** , **ඔගස්තීස්** , **ජෝන් ලොක්** ආදීන් අදාළ වේ.

**ප්ලේටෝ,**

ප්ලේටෝ විසින් ස්වකිය සමූහාණ්ඩුව (Republication) කෘතිය තුළ පරමාදර්ශී රාජ්‍යය තුළ නීතිය අනවශ්‍ය බව සටහන් තබයි. ඊට හේතු වන්නේ දාර්ශනික පාලකයන් රාජ්‍ය පාලනය කිරීමයි. නමුත් ඔහු විසින් රිචිත දේශපාලනය (Politics) කෘතිය තුළ දී පරමාදර්ශී රාජ්‍යයක නීතිය අවශ්‍ය නොවුන ද මිහිතලය මත පවතින සාමාන්‍යය රාජ්‍යය කට නීතිය අත්‍යවශ්‍ය වන බව ලේඛන ගත කරයි. **නීතිය නැමති ස්වර්ණමය නූලෙන් (The Golden Thread law) සමාජය බැඳ තැබිය යුතු යැයි ප්ලේටෝ ප්‍රකාශ කරයි.**

ඇරිස්ටෝටල්,

ඇරිස්ටෝටල් දේශපාලනය (Politics) කෘතිය තුල දී සටහන් තැබුවේ, **ඉතාම හොඳ** මිනිසුන්ට වඩා යහපත් දෙය **ඉතාම හොඳ නීතිය** වන බවයි. සත්වයින් අතරින් හොඳම සත්ත්වයා මිනිසාය. එහෙත් නීතියෙන් හා යුක්තියෙන් වෙන්කල විට සත්වයන් අතරින් නරකම සත්වයා මිනිසා ය.

**ජොන්ලොක්,**

නීතිය පිළිබඳ ස්වභාවධර්මයානුකූල ප්‍රවේශය ඉදිරිපත් කළ නූතන දාර්ශනිකයා ජෝන් ලොක්ය. සමාජ සම්මුතිවාදී විග්‍රහය තුළ දී **රාජ්‍යය බිහිවීමට පූර්ව අවධිය තුළ ප්‍රකෘති සමාජය තුළ ක්‍රියාත්මක වූයේ ස්වාභාවික නීතිය** බව ලෙවියාතන් කෘතිය තුළ ලේඛනගත කරයි. ප්‍රකෘති සමාජයෙන් සිවිල් සමාජයට එළඹෙන විට ස්වාභාවික අයිතීන් (ජීවිතය - දේපල - නිදහස) සුරැකීම සඳහා පනවන නිති ස්වභාවික නීතියට අනුකූල වීම පිළිබඳ අදහස මෙහි දී වඩාත් සුවිශේෂී ය.

- **විශ්ලේෂණාත්මක ප්‍රවේශය.**

ස්වභාවධර්මයානුකූල ප්‍රවේශය ප්‍රතික්ෂේප කරමින් විශ්ලේෂනාත්මක ප්‍රවේශය උත්පාද වේ. එහි අර්ථය වන්නේ නීතිය යනු ස්වාධිපතිගේ ආඥාව වේය යන්නයි. එනම් ස්වාධිපති බලය පදනම් කොටගෙන රාජ්‍යය මගින් පනවන රෙගුලාසි නීති වන බව ඉන් ප්‍රකාශිතය. **ජීන් බොඩෑන්** - **තෝමස් හොබ්ස්** - **බෙන්තම්** - **ජෙලිනික්** - **ජෝන් ඔස්ටින්** ආදීහු විශ්ලේෂනාත්මක ගුරු කුලයට අදාළ මතවාදිමය පෝෂණය සැපයීය.

- **ඓතිහාසික ප්‍රවේශය.**

ඓතිහාසික ප්‍රවේෂයෙන් නීතිය යනු ස්වාධිපතියේ ආඥාව බව දැක්වූ විශ්ලේෂණාත්මක ප්‍රවේෂය ප්‍රතික්ෂේප කරයි. නීතිය යනු දිගුකාලීන සිදු වූ සමාජ වර්ධනය හේතු කොට ගෙන සම්ප්‍රදායන් හා සිරිත් විරිත් මුල්කොටගෙන නිර්මාණය වූවකි. එම නිසා නීති සම්බන්ධයෙන් මහජන කැමැත්තක් පවතී. මිනිසුන් නිතියට අවනත වන්නේ අධිකාරී බලය පදනම් කොටගෙන ක්‍රියාක්මක වන නිසා නොව එමගින් මහජන මතය පිළිඹිබුවන නිසාය. මෙම ආකාරයට ඓතිහාසික ප්‍රවේෂය තුළ නීතිය යනු ඉතිහාසය තුළ ඇති වූ පුරුදු හා භාවිතාවන්ගේ ප්‍රතිඵලයක් ලෙස දක්වයි. සර් හෙන්රි මෙන් ප්‍රමුඛ ඓතිහාසික න්‍යාය වාදීන් ඓතිහාසික ප්‍රවේශයේ ගුරුකුලයට අයත්වේ.

- **<u>සමාජ විද්‍යාත්මක ප්‍රවේශය.</u>**

මෙම ප්‍රවේශයට අනුව නීතියට පවතින්නේ සමාජ විද්‍යාත්මක ප්‍රභවයකි. <u>නීතිය මනුෂ්‍යා විසින් නිර්මාණය කරනු ලැබූ ඔවුන්ගේ චරිත ස්වභාවයන්හි සදාචාරාත්මක විශ්ෂ්ඨතාවයන්ගේ ගුණාංග වලින් නිර්මාණය වූවකි.</u> **ක්‍රේබ්** ගේ නායකත්වයෙන් යුත් සමාජ විද්‍යාත්මක ගුරු කුලය නීතිය සම්බන්ධ මෙම ප්‍රවේශය ඉදිරිපත් කරයි.

- **<u>මාක්සාවාදී ප්‍රවේශය</u>**

මාක්ස්වාදීන්ට අනුව නීතිය පෞද්ගලික දේපල සමග බැදී පවතින්නකි. <u>පෞද්ගලික දේපල ආරක්ෂා කිරීම සඳහා නිර්මාණය වී තිබෙන දේපල හිමි පංතියේ උපකරණය වන රාජ්‍යය පංති අරමුණු ඉටුකරගනු ලබන්නේ නීතිය මගිනි</u>. මේ අනුව නීතිය යනු දේපල හිමි පංතියේ (වහල් හිමි - රදළයා - ධනපතියා) අයිතිවාසිකම් - නිදහස - ආරක්ෂාව ස්ථාපනය කිරීම සඳහා පවතින උපකරණයක් පමණි. විද්‍යාත්මක කොමියුනිස්ට් සමාජය තුළ රාජ්‍යය වියැකී යන අතර ඒ සමගම නීතිය ද මරණයට පත් වේ.

- ## <u>නීති මූලාශ්‍ර.</u>

1. **ව්‍යවස්ථාදායකය.**

නූතන ජාතික රාජ්‍යය තුළ පවතින ප්‍රබලම නීති මූලාශ්‍රය වන්න් ව්‍යවස්ථාධායකයයි. රාජ්‍යය තුළ ක්‍රියාත්මක වන නීති විශාල ප්‍රමාණයක් උත්පාද වන්නේ ව්‍යවස්ථාදායකය තුළිනි.

2. **අධිකරණය.**

අධිකරණය හා අධිකරණ තීරන වැදගත් නීති මූලාශ්‍රයකි. අධිකරණය විසින් යුක්තිය පසඳලීමේ දී නීති විවරණය කරයි. එසේ නීති විවරණය කිරීම මගින් නව නීති උත්පාද වේ. නව නීති හෙවත් අධිකරණ තීරණ පසුකාලීනව නීති විවරණය කිරීමේ දීත්, යුක්තිය පසඳලීමේදීත් යොදාගනු ලැබේ.

3. **යුක්තිය.**

ස්වභාවධර්මයා හා සම්බන්ධ වූ යුක්තිය වැදගත් නීති මූලාශ්‍රයක් වේ. යම් විනිශ්ච අධිකාරියක් නීති විනිශ්වය කිරීමේ දී අසාධාකරණ තීරණයක් ලබාදීම සඳහා පවතින නිති ප්‍රමාණවත් නොවන විට, <u>ස්වාභාවික යුක්තිය පිළිබඳ මූලධර්මය යොදාගනු ලැබේ.</u> (Natural Justic)

4. **නීති විශාරද මත.**

නීතිය අධ්‍යයනය කරමින් නීති විශාරදයින් විසින් ඉදිරිපත් කරනු ලබන විද්‍යාත්මක සිද්ධාන්ත ද නීති මූලාශ්‍රයකි. මෙම මූලාශ්‍රය ව්‍යවස්ථාදායකය විසින් නව නීති සම්පාදනය කරන විටත් අධිකරණය තීන්දු ප්‍රකාශයට පත් කරන විටත් යොදාගනී. ඓතිහාසික **<u>රෝම නීතිය</u>** වර්ධනය සඳහා **පැනිවියන් - ගායිස් - පෝල් - උල්පියන්** ආදීන්ගේ මත ප්‍රබලව හේතු වී තිබේ. **<u>ඉංග්‍රීසි නීතිය</u>** වර්ධනය සඳහා **බ්ලැක්ස්ටන් - කුක්** යන නීති වේදීන්ගෙන් සිදු වූ සේවය අසීමිතය.

5. **සිරිත් විරිත්.**

සිරිත් විරිත් පැරණිම නීති මූලාශ්‍රය ලෙස හඳුනාගත හැකිය. සිරිත් - විරිත් කෙසේ උත්පාද වූයේ දැයි කිව නොහැකිය. නමුත් කාලාන්තරයක් තිස්සේ සමාජය විසින් හොඳ යැයි සම්මත පිළිගැනීම මත සිරිත් උත්පාද වූ බවට පොදු පිළිගැනීමක් පවතී. <u>ආදි කාලීන සමාජ ක්‍රම සියල්ල ක්‍රියාත්මක වූයේ **චාරිත්‍රානුකූල නීති** ලෙස හඳුන්වන සිරිත් - විරිත් පදනම් කොට ගනිමිනි.</u> කරුණු දෙකක් මත මිනිසුන් චාරිත්‍රානුකූල නීති කඩ කිරීමට බිය වේ.

- සමාජය විසින් කොන් කරනු ලැබීමට ඇති බිය.

- මරණින් මතු ලෝක තුළ දඬුවම් ලැබීමට ඇති බිය.

වර්තමානය තුළ රාජ්‍යය නීති මගින් සිරිත් - විරිත් මත පදනම් වූ චාරිත්‍රානුකූල නීති යටපත් කර දැමුවද රාජ්‍ය නීති තුළ පවා චාරිත්‍රානුකූල නිතිවල බලපෑම පැහැදිලිව දක්නට ලැබේ.

**නිදර්ශන -:** ශ්‍රී ලංකාව තුළ,

හින්දු සිරිත් විරිත් මත ගොඩ නැගුණු තෙසවලමේ නීතිය.

උඩරට සිරිත් විරිත් මත ගොඩ නැගුණු උඩරට නීතිය.

මුස්ලිම් සිරිත් විරිත් මත ගොඩනැගුණු මුස්ලිම් නීතිය.

6. ආගම

පැරණි නීති මූලාශ්‍රයක් ලෙස ආගම හැඳින්විය හැකිය. ඈත ආදි කාලීන ප්‍රාථමික සමාජය තුළ මෙන්ම නූතනය තුළ ද ආගම වැදගත් නීති මූලාශ්‍රයක් ලෙස සලකනු ලැබේ. <u>චාරිත්‍රානුකූල නීති බොහෝ විට නිර්මාණය වන්නේ ආගම පදනම් කොට ගනිමිනි.</u> **ආදි කාලීන රෝම නීතිය - වර්තමානය තුළ හින්දු නීතිය - මුස්ලිම් නීතිය** නිදසුන් ලෙස දැක්විය හැකිය. <u>**දේවවරම්වාදී දේශපාලන මතවාද රාජ්‍යයේ ප්‍රභවය සම්බන්ධයෙන් පැවතීම නිසා**</u> යුරෝපය තුළ පමණක් නොව, ආසියානු, කලාපයේ ඉන්දියාව, චීනය වැනි රාජ්‍යයන්හි දේශපාලන චින්තනය තුළ ආගම වැදගත් නීති මූලාශ්‍රයක් බවට පත්ව තිබේ. **දිව්‍යමය නීතිය** - දේවවරම් වාදය හා බද්ධව උත්පාද වූවකි.

- <u>නීතිය වර්ග කිරීම.</u>

**නීතිය**

**දේශීය නීතිය**

I. ව්‍යවස්ථානුකූල නීතිය

II. සාමාන්‍ය නීතිය

III. පුද්ගල නීතයි

IV. පොදු නීතිය

V. පරිපාලන නීතිය

**ජාත්‍යන්තර නීතිය**

ජාත්‍යන්තර නීති මූලාශ්‍ර කිහිපයකි.

- *ජාත්‍යන්තර සිරිත්*
- *ජාත්‍යන්තර ගිවිසුම්*
- *ශිෂ්ටාචාර පිළිගත් මූලධර්ම*
- *ජාත්‍යන්තර අධිකරණයේ තීන්දු*
- *ජාත්‍යන්තර නීති වේදීන්ගේ මත*

1. **ව්‍යවස්ථානුකූල නීතිය.**

රාජ්‍යයේ මූලික නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන නිති ව්‍යස්ථානුකූල නීති ලෙස අර්ථකථනය කළ හැකිය. රාජ්‍යය බලය ක්‍රියාවට නැංවීම හා සම්බන්ධ සියලුම ආකාරයේ ඍජු හා වක්‍ර නීති මෙයට අදාළ වේ.

2. **සාමාන්‍ය නීතිය.**

රාජ්‍යයන්හි ව්‍යවස්ථාදායකය විසින් සකස් කරන සාමාන්‍යය නීති මීට අදාළ වේ. ව්‍යවස්ථාදායකය එම නීති සකස් කිරීමේ කාර්යය නීති සම්පාදනය හෙවත් ව්‍යවස්ථාදානය ලෙස හඳුන්වයි. මෙම සාමාන්‍යය නීති සකස් කළ යුත්තේ ව්‍යවස්ථානුකූල නිතිය වන මූලික නීතිය උල්ලංඝණය නොවන අයුරිනි.

3. **පුද්ගල නීතිය.**

රාජ්‍යයක පුරවැසි සම්බන්ධතා පාලනය කරනු ලබන්නේ පුද්ගල නීතිය මගිනි. රටවැසියන් පුද්ගල නීතියේ පාර්ශව කරුවන් වන අතර රාජ්‍යය අපක්ෂපාතී බේරුම් කරුවෙකු ලෙස ක්‍රියාත්මක වේ.

4. **පොදු නීතිය.**

රාජ්‍යය හා පුරවැසියන් අතර සම්බන්ධතාවය පාලනය කරනු ලබන්නේ පොදු නීතිය මගිනි. මෙම පොදු නීතිය සකස් වන්නේ **චාරිත්‍ර විධි - සම්ප්‍රදායන් සහ භාවිතයන්ගේ එකතුවක් ලෙසිනි.** මෙහි දී රාජ්‍යය පාර්ෂව කරුවෙකු වුවද බේරුම් කරුවකු ලෙසදත් කටයුතු කරයි. එය පොදු නීතියේ වැදගත් ලක්‍ෂණයකි.

5. **පරිපාලන නීතිය.**

රාජ්‍යයක පරිපාලනයට අයත් නීති මීට අදාළ වේ. කාර්යාල සංවිධාන කිරීම සම්බන්ධ නීති, කාර්යාල නිලධාරීන්ගේ වගකීම සම්බන්ධ නීති මීට අදාළ වේ. පරිපාලන නීති වඩාත් හොඳින් සංවිධාන ගත කර ඇති රාජ්‍යයකට දැක්විය හැකි ශක්තිමත් නිදර්ශනය ප්‍රංශයයි.

6. **ජාත්‍යන්තර නීතිය.**

ජාත්‍යන්තර ක්ෂේත්‍රය තුළ අන්තර් රාජ්‍යය සම්බන්ධතා හසුරුවන නීතිය ජාත්‍යන්තර නීතිය ලෙස හඳුන්වනු ලබයි. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් අන්තර් ජාතික සමාජය තුළ ස්වාධිපති රාජ්‍යයන්ගේ හැසිරීම් පාලනය කරන්නා වූ නීති මීට අදාළ වේ. ජාත්‍යන්තර නිතිය තුළ ඇති වැදගත්ම ලක්‍ෂණය වන්නේ **අධිකාරී බලය සහිත ආයතනයක් විසින් පනවා නොතිබීමයි.** එම නිසා ජාත්‍යන්තර නීතිය බලාත්මක වීම ස්වාධිපති රාජ්‍යයන්ගේ ස්ව කැමැත්ත මත රඳා පවතී.

"ජාතීන් අතර සම්බන්ධතාවයන් නියමය කෙරෙන නීති පද්ධතිය ජාත්‍යන්තර නිතිය වේ."
-ලෝරන්ස්-

**ජාත්‍යන්තර නීති මූලාශ්‍ර කිහිපයකි.**

- **ජාත්‍යන්තර සිරිත් -:**

  ජාත්‍යන්තර නීතියේ පැරණිතම මූලාශ්‍රය මෙය වේ. රාජ්‍යයන්ගේ දේශසීමා - රාජ්‍යය උපාය නිලධාරීන් හා සම්බන්ධ පිළිගැනීම් හා සිරිත් විරිත් - නාවික ගමනා ගමනය හා සම්බන්ධ පිළිගැනීම් අදාළ නීති මීට අදාළ වේ.

- **ජාත්‍යන්තර ගිවිසුම් -:**

  නූතන ජාතික රාජ්‍යයන් අතර ඇති කර ගෙන තිබෙන ගිවිසුම් (එකඟතා / සම්මුතීන්) මීට අදාළ වේ. නිදසුනක් ලෙස වර්සෙල් සාම සම්මුතිය , 1933 මොන්ට් වීඩියෝ සම්මුතිය.

- **ජාත්‍යන්තර අධිකරණ තීරණ -:**

  නූතන අවධිය තුළ 1921 දී සහ 1946 දී පිහිටුවන ලද ජාත්‍යන්තර අධිකරණය මගින් ප්‍රකාශයට පත් කළ තීරණ මීට අදාළ වේ.

- **ජාත්‍යන්තර නීතිවේදීන්ගේ මත.**

  සුප්‍රසිද්ධ ජාත්‍යන්තර නිති වේදීන් වන හියුගෝ ග්‍රෝෂස් - පපන්ඩොප් - බැලැක්ස්ටන් - කුක් ආදීන්ගේ මත මීට අදාළ වේ.

- <u>නීතිය හා සදාචාරය.</u>

  - <u>නීතිය යනු කුමක්දැයි හැඳින්වීම.</u>
    **(N.B. මෙය මීට පූර්වයේ විග්‍රහ කොට තිබේ)**

  - <u>සදාචාරය යනු කුමක්දැයි හැඳින්වීම.</u>

    සදාචාරය යනු මිනිස් සමාජයක යථා පැවැත්ම සඳහා පවතින මානවවාදී වූත් ආචාර විද්‍යාත්මක වූ මූලධර්ම පද්ධතියකි. සදාචාරය හා ඊට බලපාන මූලධර්ම සමාජයෙන් සමාජයට පොදු නොවේ. නමුත් සදාචාරය සංස්කෘතිය හා බැඳී පවතින්නක් නිසා මානව චර්යාවන් , අභිලාෂයන්ට හා සිතුම් පැතුම් වලට ප්‍රබලව බලපායි. සදාචාරය ආචාර විද්‍යාව හා බැඳී පවතින්නකි. මිනිසුන්ට යහපත් පුරවැසියන් ලෙස ජීවත් විය හැක්කේ සදාචාරාත්මක ජීවිතයක් ගත කරන්නේ නම් පමණි.

- **<u>නීතිය හා සදාචාරය සම්බන්ධයෙන් මතවාද දෙකක් පවතී.</u>**

  1. නීතිය හා සදාචාරය එකිනෙකට ගැලපේ (අනුපූරක වේ)
  2. නීතිය හා සදාචාරය එකිනෙකට නොගැලපේ (අනුපූරක නොවේ)

- **<u>නීතිය හා සදාචාරය එකිනෙකට ගැලපේ (අනුපූරක වේ)</u>**

  - **නීතිය හා සදාචාරය යන මූලධර්ම දෙකේම අරමුණ සමාන වීම.**

  නීතියේ අරමුණ වන්නේ යහපත් සමාජයක් ගොඩ නැගීමයි. සදාචාරයේ අරමුණ වන්නේ යහපත් සමාජයක් ගොඩ නැගීම වේ. රාජ්‍යයේ මූලික අරමුණ වන්නේ පුරවැසියන්ට ඉහළ මට්ටමක සදාචාරාත්මක ජීවිතයක් ලගා කර දීමයි. අනෙක් අතට පුරවැසියන්ට ආදර්ශමත් පුරවැසියන් විය හැක්කේ සදාචාරාත්මක ජීවිතයක් ගත කරන්නේ නම් පමණි. මෙම ආකාරයට නීතිය හා සදාචාරය අධිසාම්‍යතා සහිත සංකල්ප යුග්මයකි.

  - **සදාචාරාත්මක මූලධර්ම මත නීති සම්පාදනය කිරීම.**

  රාජ්‍යය මගින් පනවන බොහෝ නීතින්හට සදාචාරාත්මක පදනමක් පවතී. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් සදාචාරාත්මක හැඩතල සහිත සිරිත් විරිත් - චාරිත්‍ර වාරිත්‍ර - හොඳ නරක - සම්ප්‍රධායන් - ආගම වැනි මූලාශ්‍ර මත පදනම් වී රාජ්‍යය නිති සම්පාදනය කරයි.

නිදර්ශන -: මිනිස් ඝාතනය , සුරාපානය , සූදු ක්‍රීඩාව , සොරකම , වංචාව , ගණිකා වෘත්තිය , දූෂණ , ළමා අපයෝජන ආදී ක්‍රියා සදාරාචාර විරෝධී ක්‍රියා වේ. එම ක්‍රියා රාජ්‍යය නීති මගින් ද පිටු දැක තිබේ.

  - **දාර්ශනික මතවාද මගින් ද නීතිය හා සදාචාරය අතර සම්බන්ධයක් හඳුනාගත හැකිය.**

**ප්ලේටෝ ප්‍රකාශ කළේ,**
"පුරවැසි සත් ගුණවත් භාවය ඉහළින්ම ප්‍රකාශ කරන්නා වූ රාජ්‍යය හොඳම රාජ්‍යය වේ."

**ඇරිස්ටෝටල් ප්‍රකාශ කළේ,**
"රාජ්‍යයේ මූලික කාර්ය විය යුත්තේ පුරවැසියන්ට ඉහළ මට්ටමේ සදාචාර අභිවෘද්ධියක් ලබා දීම වේ"

**මැක් අයිවර් ප්‍රකාශ කළේ,**
"මිනිසුන්ට සදාචාරාත්මක ජීවිතයක් ගත කිරීමට නම් රාජ්‍යය අත්‍යවශ්‍ය වේ"

**රේමන් ජී ගෙට්ල් ට අනුව,**
සදාචාර මූලධර්ම වලට පටහැනිව පනවන නීති සමාජය තුළ ක්‍රියාවට නැංවීමට පහසු දෙයක් නොවේ."

මෙම දාර්ශනික මතවාද මගින් ද නීතිය හා සදාචාරය එකිනෙකට අනුපූර්ක වන බව හඳුනාගත හැකිය.

- **<u>නීතිය හා සදාචාරය එකිනෙකට නොගැලපේ (අනුපූරක නොවේ)</u>**

  නීතිය හා සදාචාරය එකිනෙකට අනුපූරක නොවන බවට තර්කයක් පවතී. එහි අර්ථය වන්නේ රාජ්‍යය බිහිවීමට පෙර ස්වාභාවික සමාජය තුළ නිතිය හා සදාචාරය අතර අනුපූරකභාවයක් පැවතුණ ද රාජ්‍ය බිහි වීම සමඟ නීතිය හා සදාචාරය අතර තිබූ අනුපූරක භාවය (ගැලපීම) දියවී ගිය බවයි.

- **නීතිය හා සදාචාරය උත්පාදවන මූලාශ්‍ර වෙනස් වීම.**

නීතිය උත්පාද වන්නේ රාජ්‍යයේ අධිකාරී බලය සමගිනි. සදාචාරය උත්පාද වන්නේ අධිකාරී බලය මත පදනම්ව නොවේ. නීතිය යනු ස්වාධිපතිගේ ආඥාවකි. නමුත් සදාචාරය සමාජ තුළින් උත්පාද වන ආචාර විද්‍යාත්මක පදනමක් සහිත සංස්කෘතික කාරණයකි.

- **දඬුවම්.**

රාජ්‍යය නීති කඩකල විට පුද්ගලයන්ට ශාරීරික දඬුවම් හිමි වේ. (සිරගත කිරීම - බන්ධනාගාර ගත කිරීම - මරණ දණ්ඩනය) නමුත් සදාචාරාත්මක හර පද්ධතිය කඩකරන්නෙකුට බොහෝ විට හිමි වන්නේ අධිකාරී බලය මත පදනම් නොවුනු දඬුවමකි. (කොන් කිරීම - නොසලකා හැරීම - නම්පට බැඳීම - උපහාසයට ලක් කිරීම)

- **පාලනය කරනු ලබන අංශ.**

රාජ්‍යය නීතිය මගින් පාලනය කරනු ලබන්නේ පුද්ගලයාගේ භාහිරත්වය පමණි. සදාචාරය මගින් මිනිසුන්ගේ අභ්‍යන්තරය පාලනය කරනු ලබයි.

**නිදර්ශන -:** සොරකම , වංචාව , මිනීමැරුක් සිදු කළ විට රාජ්‍ය නීති මගින් දඬුවම් පමුණුවයි. එය මිනිසාගේ භෞතිකය පාලනය කිරීමකි. කරුණාව - දයාව - ප්‍රේමය - මිත්‍රත්වය වැනි මූලධර්ම පාලන කිරීමට නීතියට නොහැකිය. එසේ නම් මිනිසාගේ අභ්‍යන්තරය පාලනය කිරීමට නීතියට නොහැකිය. එය සිදු කරනු ලබන්නේ සදාචාරය විසිනි.

- **සදාචාරාත්මක වශයෙන් වැරදි නොවන ක්‍රියාවන් රාජ්‍යය නීති මගින් නීති විරෝධී ක්‍රියා ලෙස නම් කිරීම.**

**නිදර්ශන -:** වාහනයක් වේගයෙන් පැදවීම සදාචාරාත්මක වශයෙන් වැරදි ක්‍රියාවක් නොවේ. නමුත් රාජ්‍ය නීතියට අනුව එය වැරදි ක්‍රියාවක් විය හැකිය.

- **පොදු භාවය.**

නීතියට රාජ්‍ය තුළ පොදු හැඩයක් පවතී. නමුත් සදාචාරය රාජ්‍ය තුළ වුවද වාර්ගිකව - ප්‍රදේශ බද්ධව - ආගමානුකුලව පොදු නොවේ. අනෙක් පසින් නීතිය විශ්ව ව්‍යාප්ත මට්ටමකින් පොදු පිළිගැනීමකට ලක් වූවකි. නමුත් සදාචාරය එසේ පොදු පිළිගැනීමකට ලක්ව නොමැත.

- <u>මිනිසා නීතියට අවනත වන්නේ</u> ඇයි?

## නීතියේ ආධිපත්‍යය (Rule of low)

- **නීතියේ ආධිපත්‍යය යනු කුමක්දැයි හැඳින්වීම.**

නීතියේ ආධිපත්‍යය යනු **නීතියේ** බලයයි. වෙනත් ආකාරයකින් ප්‍රකාශ කරන්නේ නම් **නීතියට අනුව පාලනය කිරීමයි.** පාලකයා මෙන්ම පාලිතයා ද නීතිය ඉදිරියේ එක සමාන වීම, එකසේ නීතියට යටත් වීම ඉන් අර්ථවත් වේ. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක පැවතිය යුතු මූලිකාංගයක් වශයෙන් නීතියේ ආධිපත්‍යය හැඳින්විය හැකිය. **මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ප්‍රධාන මුර බල්ලකු** ලෙස නීතියේ ආධිපත්‍යය හඳුනාගත හැකිය. ස්ත්‍රී - පුරුෂ බව , ධනවත් බව හෝ දිළිඳු භාවය - තනතුරු භේද , ජාති , භාෂා , ආගම් , කුල භේද , වර්ගික භේද, වර්ණ භේද යන වෙනස් කම් කිසිවක් නොලසකමින් සමාජයේ සෑම පුද්ගලයෙකුටම සමාන ආකාරයෙන් නීතිය බල පැවැත්වීම හෙවත් නීතිය ඉදිරියේ සමානාත්මතාව (Equality of law) නැමති සංකල්පය ද නීතියේ ආධිපත්‍යය හා බැඳී පවතී.

- **නීතියේ ආධිපත්‍යය සංකල්පයේ ඉතිහාසය හා විකාශනය.**

නීතියේ ආධිපත්‍යය පිළිබඳ සංකල්පය දේශපාලන විද්‍යාව තුළ ඇති ඉපැරණි සංකල්පයකි. එය දීර්ඝ ඓතිහාසික විකාශනයක් සහිත මූලධර්මයකි.

**ග්‍රීක යුගය,**

නීතියේ ආධිපත්‍යයට අදාළ මූලික සංවාදය ග්‍රීක මහා දාර්ශනික දේශපාලන විද්‍යාවේ ආදි කර්තෘ ඇරිස්ටෝටල් විසින් ස්වකීය දේශපාලනය (Politics) යන කෘතිය තුළ ලේඛන ගත කළේ ය. **ඇරිස්ටෝටල් විසින් නීතියේ ආධිපත්‍යයට අදාළ අදහස් ඉදිරිපත් කළේ ප්ලේටෝගේ පරමාදර්ශී රාජ්‍යය හා දාර්ශනික පාලකයා යන පරමාදාර්ශී (මනෝරාජික) මතවාදයන් විවේචනය කරමිනි. ප්ලේටෝ ප්‍රකාශ කළේ දාර්ශනික පාලකයින් සිටින විට නීතිය අවශ්‍ය නොවන බවයි. ඇරිස්ටෝටල්ගේ මතය වූයේ "ඉතාම හොඳ මිනිසුන්ට වඩා යහපත් දෙය ඉතාම හොඳ නීතිය" වන බවයි.**

**රෝම මධ්‍යතන අවධීන්,**

රෝම සහ මධ්‍යතන අවධීන්වල ක්‍රියාත්මක වූ අසහාය බලැති පාලන ක්‍රම මගින් නීතියේ ආධිපත්‍යය සංකල්පය දිය කළේ ය. **රෝම යුගය** තුළ අසහාය බලැති රාජාණ්ඩුක්‍රම තුළ නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක වූයේ නැත. **මධ්‍යගත යුගය** තුළ පල්ලිය - බයිබලය - පාප්තුමා සහ දෙවියන් පදනම් කරගනිමින් ක්‍රියාත්මක වූ දේවවරම්වාදී මතවාදය සමග පැවතියේ දිව්‍යමය නීතිය යි. එම නිසා එම යුගය තුළ ද නීතියේ ආධිපත්‍යය පැවතියේ නැත.

**නූතන යුගය,**

නූතන යුගය තුළ ලිබරල්වාදී ඇගයුම් සමග නැවත නීතියේ ආධිපත්‍යය සංකල්පය ස්මතු විය. විශේෂයෙන් එංගලන්තය කේන්ද්‍ර කොට ගනිමින් ලිබරල්වාදී මතවාදය නිර්මාණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස 16 / 17 සියවස් තුළ බ්‍රිතාන්‍යය කිරීටය හා පාර්ලිමේන්තුව අතර ඇති වූ මතවාදී ගැටුම තුළ නීතියේ ආධිපත්‍යයට අදාළ බීජ ප්‍රරෝහණය විය. 1688 **ඉංග්‍රීසි විප්ලවය** තුළ දී රජු නීතියට යටත් විය යුතු බවට ජෝන් ලොක් අදහස් ඉදිරිපත් කළේ ය. පසුව නීතයේ ආධිපත්‍යය සංකල්පය ස්ථාපනය කිරීමට නූතන දේශපාලන චින්තකයින්, ආණ්ඩුක්‍රම වේදීන් , නීති වේදින් ස්වකීය මතවාද මෙහෙ විය. **එම ප්‍රවාහයේ කේන්ද්‍රීය චරිතය වන්නේ ඉංග්‍රීසි ජාතික නීතිවේදියෙකු මෙන්ම දේශපාලන චින්තකයකු වන ඒ.වී. ඩයිසිය.** ඩයිසි 1885 (Law of the Constitution) කෘතිය ඒ සඳහා භාවිතා කළේ ය.

## ❑ ඒ.වී. ඩයිසි ගේ නීතියේ ආධිපත්‍යය පිළිබඳ මතය.

බ්‍රිතාන්‍යය ජාතික ඒ.වී. ඩයිසි විසින් 1885 දී **Law of the constitution** (ව්‍යවස්ථානුකූල නීතිය) කෘතිය රචනා කරමින් නීතියේ ආධිපත්‍යය සංකල්පය පැහැදිලි කළේ ය. ඩයිසි නීතියේ ආධිපත්‍යය සංකල්පය ගොඩ නගා ඇත්තේ **බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රමය පදනම් කොට ගනිමිනි.**

**නීතියේ ආධිපත්‍යය යන සංකල්පයට අදාළ මූලිකාංග ඩයිසි පහත සඳහන් පරිදි විග්‍රහ කරයි.**

(1) **රාජ්‍යය පාලනයේදී සාමාන්‍ය නීති උත්තරීතර ලෙස සැලකීම.**

මෙම මූලධර්මයට අනුව එංගලන්ත රට වැසියන් යටත් වන්නේ රටේ ක්‍රියාත්මක වන සාමාන්‍ය නීතියට පමණි. මිනිසුන්ට දඬුවම් පැමිණවිය හැක්කේ රටේ පවතින සාමාන්‍ය නීති උල්ලංඝණය කළ හොත් පමණි. වරද විනිශ්චය කළ යුත්තේ සාමාන්‍ය උසාවියකින් පමණි. වරදකරු වුවහොත් දඬුවම්කළ යුත්තේ එම වරදට නීතිය මගින් නියම කර ඇති දඬුවම පමණි. යම් පුද්ගලයෙකු කරන ලද වරදක් විනිශ්චය කිරීම සඳහා නව නීති නිර්මාණය කිරීමට හෝ විශේෂ අධිකරණ පිහිටු වීමට බලයක් රාජ්‍යයට නොමැත. මෙම මූලධර්මය අනුව සාමාන්‍ය නීතියෙන් තහනම් නොකරන ලද ඕනෑම ක්‍රියාවක් කිරීමේ නිදහස පුරවැසියන්ට හිමි වේ.

(2) **නීතිය ඉදිරියේ සියලු දෙනාම එක සාමානය.**

ඩයිසිගේ නීතියේ ආධිපත්‍යය සංකල්පය තුළ ඇති තවත් මූලධර්මයක් වන්නේ සියලු දෙනා නීතිය ඉදිරියේ සමාන වීමයි. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් නීතිය සියලු දෙනාටම සර්ව සාධාරණ වේ. නීතිය ඉදිරියේ කිසිවකු විශේෂීකරණයකට හෝ වරප්‍රසාද හිමි නොවේ.

(3) **පුරවැසියන්ට අයිතිවාසිකම් හිමිව තිබෙන්නේ සහජයෙන් හා සමාජ සම්මතයෙන් මිස නීති මගින් නොවේ.**

ඩයිසිගේ නීතයේ ආධිපත්‍යය තුළ ඇති තවත් මූලධර්මයක් වන්නේ පුරවැසියන්ට අයිතිවාසිකම් ස්වභාවයෙන්ම සමාජ සම්මතයෙන් හිමි වූ බවයි. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් අයිතිවාසිකම් යනු නීතිය මගින් ලබා දුන් දෙයක් නොවන බව ඩයිසිගේ අදහස යි.

## විවේචන (දුර්වලතා) චෝදනා.

(i) **එංගලන්තයේ ක්‍රියාත්මක වූ සාමාන්‍ය නීති මත පමණක් පදනම් වෙමින් මෙම න්‍යාය ගොඩ නැගීම.**

ඩයිසිගේ න්‍යාය තුළ ඇති ප්‍රධාන ම දුර්වලතාවය ලෙස පෙන්වා දෙන්නේ බ්‍රිතාන්‍යය තුළ ක්‍රියාත්මක වන සාමාන්‍යය නීති මත පමණක් පදනම් වීමයි. මෙම කාලය තුළ යුරෝපා මහද්වීපයේ ක්‍රියාත්මක වූ **පරිපාලන නීතිය** සම්බන්ධයෙන් ඩයිසි අවධානය යොමු කර තිබුණේ නැත. විශේෂයෙන් **ප්‍රංශය හා ජර්මනිය** වැනි රාජ්‍යය තුළ සාමාන්‍යය නීතිවලට අමතරව පරිපාලන නීතිය ක්‍රියාත්මක විය. ඩයිසි ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කළේ නැත. ඩයිසිගේ අදහස වූයේ **සාමාන්‍ය නීතිය හැර වෙනත් නීති මගින් පුද්ගල නිදහස අයිතිවාසිකම් සීමා වන බවයි.** එය ඩයිසි ගේ න්‍යායට එල්ල වූ ප්‍රධාන විවේචනයකි.

**(ii) සාමාන්‍ය නීති හැර වෙනත් නීති මගින් පුද්ගල නිදහස හා අයිතිවාසිකම් සීමාවන බව විශ්වාස කිරීම.**

ඩයිසිගේ මතය වූයේ සාමාන්‍ය නීති හැර වෙනත් නීති මගින් පුද්ගල නිදහස හා අයිතිවාසිකම් සීමා වන බවයි. එම මතයද විචාරකයින් විසින් විවේචනයට ලක් කරයි. **නිර්බාධාවාදී පොලිස් රාජ්‍ය ක්‍රමය** තුළ ජීවත් වූ ඩයිසි සාමාන්‍යය නීති හැර අනිකුත් නීති පුද්ගල නිදහසට හානිකර බව පිළිගත්ත සුබසාධන රාජ්‍යය ක්‍රමයේ වර්ධනයත් සමඟ විශේෂ නීති වැදගත්ව තිබේ. ඊට අදාළව ඉදිරිපත් වී ඇති කර්ක.

- නූතන සුබසාධන සමාජ ක්‍රමය මුහුණ දෙන සංකීර්ණ සමාජ ආර්ථික දේශපාලන ප්‍රශ්න විසඳීම සඳහා සාමාන්‍ය නීති පමණක් ප්‍රමාණවත් නොවීම.

- ඇතැම් ප්‍රශ්න සාමාන්‍ය නීතිය තුළ විසඳනවාට වඩා කාර්යක්ෂමවත්, සාධාරණවත් පරිපාලන නීතිය යටතේ විසඳීමට හැකි වීම. ඒ සඳහා වැය වන කාලය හා ශ්‍රමය ද ඉතිරි කර ගත හැකි වීම.

- ඇතැම්විට සාමාන්‍යය නීතියට වඩා පරිපාලන නීති පුද්ගලයන්ට හිතකර විය හැකිය.

- විධායකය විසින් නිකුත් කරන නියෝගයන් ද පාලන කටයුතු සඳහා අවශ්‍ය වීම.

**(iii) පරිපාලන නීති යටතේ විශේෂ වරප්‍රසාද ලත් සමාජ පන්තියක් බිහිවන බව ඩයිසි විශ්වාස කිරීම.**

පරිපාලන නීති නිසා විශේෂ වරප්‍රසාද ලත් සමාජ පංතියක් බිහිවන බව ඩයිසි විශ්වාස කළේ ය. එම කරුණු ද විවේචනයට ලක් වූ කරුණකි. විචාරකයින් පෙන්වා දුන්නේ පරිපාලන නීති මගින් වරප්‍රසාද ලත් සමාජ පංතියක් බිහිවනවාය යන විශ්වාසය වැරදි බවයි. ඊට අදාළව එම විචාරකයින් ඉදිරිපත් කළ හේතු.

- පරිපාලන නීති වලංගු වන්නේ සේවයේ යෙදී සිටින විට පමණි. අනෙකුත් අවස්ථාවලදී සාමාන්‍යය නීතියට රාජ්‍යය නිලධාරීන් යටත් වීම.

- ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක් තුළ පරිපාලනය ක්‍රියාත්මක වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී බලවේග වලට යටත් වීම.

**(iv) සාමාන්‍ය උසාවි පමණක් ප්‍රමාණවත් යැයි විශ්වාස කිරීම.**

නීතියේ ආධිපත්‍යය පැවතීම සඳහා සාමාන්‍යය උපාධි පමණක් පැවතීම ප්‍රමාණවත් යැයි ඩයිසි විශ්වාස කිරීම දුර්වලතාවයකි. ඇතැම් විට විශේෂ අධිකරණ ස්ථාපනය කිරීමට සිදුවිය හැකිය. 1971 දී **ශ්‍රී ලංකාවේ පිහිට වූ අපරාධ යුක්ති කොමිෂන් සභාව** නිදර්ශන ලෙස දැක්විය හැකිය.

**(v) නීතිය ඉදිරියේ සියලු දෙනාම එන සමාන වේය යන මතය.**

නීතිය ඉදිරියේ මිනිසුන් එක සමාන බව ඩයිසිගේ මතය තර්කානු කුලව පමණක් නිවැරදි බව විචාරක මතය වේ. එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොවන බවට විවේචන පවතී. ඩයිසි මෙම මතය ගොඩනගන්නේ දේශපාලන සමානාත්ම තාවය පිළිබඳ ලිබරල් මතය පදනම් කොටගෙන ය. නමුත් එය ප්‍රායෝගික නොවූවක් බවට විවේචන පවතී. <u>මාක්සාවාදීන් ප්‍රකාශ කරනු ලබන්නේ ලිබරල් ක්‍රමය මත ස්ථාපනය කිරීම උත්සාහදරණ නීතිය ඉදිරියේ සමානාත්මතාවය **සුපිරි හෝටල් සැමට විවෘත්තව ඇත** යන ප්‍රකාශනයට සමාන ප්‍රකාශනයක් බවයි.</u>

නිදර්ශන -: බ්‍රිතාන්‍යය රැජිණට විරුද්ධව නඩු පැවරිය නොහැක.
ලංකාවේ ජනාධිපතිට විරුද්ධ නඩු පැවරිය නොහැක.

**(VI)** **මිනිසාට ස්වභාවයෙන් ම අයිතිවාසිකම් හිමිවෙන බව.**

මිනිසාට සහජයෙන්ම අයිතිවාකිසම් හිමිවන බව ඩයිසි ප්‍රකාශ කරයි. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් මිසින් අයිතිවාසිකම් නීතියේ ප්‍රතිඵලයක් නොවේ. මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කිරීම රාජ්‍ය විසින් සිදු කළ යුතු ය. මෙම අදහසට ද ප්‍රති විරුද්ධව විවේචන එල්ලවී තිබේ. එංගලන්තය තුළ සමාජ විකාශනය තුළින් සහජයෙන්ම අයිතිවාසිකම් හිමි වූ බව අර්ධ වශයෙන් හෝ පිළිගත හැකි සත්‍යයකි. නමුත් අනෙකුත් සමාජ ක්‍රමයන් තුළ නිදහස, අයිතිවාසිකම් සමාජ විකාශනය තුළින් සහජයෙන්ම උරුමකරගත්තක් නොව නීතියේ බහුතරයක් රාජ්‍යයන්ට අයිතිවාසිකම් හිමි වූයේ නීතිය මගින් ලබාදුන් විට පමණි.

නිදර්ශන -: ඇමරිකාව, ප්‍රංශය, රුසියාව තුළ සිදු කළ විප්ලවයන්ගෙන් පසුව නිර්මාණය කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ අයිතිවාසිකම් හා නිදහස සම්බන්ධ පරිච්ඡේද අන්තර්ගත කිරීම.

මෙම ආකාරයට ඩයිසිගේ නීතියේ ආධිපත්‍යය සංකල්පය නොයෙක් ආකාරයෙන් විවේචනයට ලක් වී තිබේ. ඩයිසිගෙන් පසුව නීයේ ආධිපත්‍යය සම්බන්ධයෙන් **පී. මාෂෙල් - ඊ.සී.එච්. වෙඩ් - අයිවොජෙනිංස් - ස්මිත්** මත ඉදිරිපත් කළේ ය.

## ▫ අයිවර් ජෙනින්ංස්ට අනුව නීතියේ ආධිපත්‍යය තුළ අඩංගුවිය යුතු මූලධර්ම.

- පාර්ලිමේන්තුවේ බලතල හැර ආණ්ඩුවේ වෙනත් බලතල ප්‍රමාණවත් අයුරින් නිශ්චිත නීති මගින් දැක්විය යුතු ය.
- නීතිය ඉදිරියේ සමානාත්මතාවය.
- පුරවැසි අයිතිවාසිකම් තහවුරු කොට තිබීම.

## ▫ ඊ.සී.එච්. වෙඩ් ට අනුව නීතියේ ආධිපත්‍යය තුළ පහත සඳහන් මූලිකාංග අඩංගු විය යුතු ය.

- විශේෂ කොට දඬුවම් පැමිණ වීම යොදාගෙන ව්‍යවස්ථා විධිමත් පාලනයකට යටත් කිරීම සහ ඒවා ප්‍රසිද්ධියට පත් කිරීම.
- අභිමතානුසාරී බලතල විධායකයට පවරා දෙන විට එම බලතල යෙදිය යුතු ආකාරය පැහැදිලි ලෙස නිර්වචනය කිරීම.
- මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ බලය ස්වාධීන හා අපක්ෂපාතී අධිකරණයකට පැවරීම.
- මිනිස් අයිතිවාසිකම් රටේ සාමාන්‍යය නීති මගින් ආරක්ෂා කිරීම.

## • නීතියේ ආධිපත්‍යය වෙනුවෙන් ජාත්‍යන්තර නීතිවේදී කොමිසම පැවැත්වූ සුමුළු.

1959 - නව දිල්ලි නගරයේ පැවැත් වූ සමුළුව.
1961 - ලාගෝන් නගරයේ පැවැත් වූ සමුළුව.
1962 - රියෝද ජැනයිරෝ නගරයේ පැවැත් වූ සමුළුව.
1966 - කොළඹ නගරයේ පැවැත්වූ සමුළුව.

මෙම සමුළුවල දී නීතියේ ආධිපත්‍යය සම්බන්ධයෙන් තවදුරටත් අවධානය යොමු විය. එමගින් නීතියේ ආධිපත්‍යය සංකල්පය තවදුරටත් සංවර්ධනය විය.